# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2018

## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව

# පෙරවදන

ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් පසුව නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තිය පිළිගත් අතර එතැන් සිට ඒ අනුව කටයුතු කරමින් ප්‍රගතිය කරා ගමන් කරයි. 1931 දී ස්ථාපිත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය රෝග වැළැක්වීම, රෝග නිවාරණය, පරිපාලනය හා පුනරුත්ථාපනය යන අංශවල ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබා දෙමින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීමේ වගකීම උසුලනු ලබයි. අමාත්‍යාංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ : සෞඛ්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීම, ප්‍රමිතීන් සකස් කිරීම, සෞඛ්‍ය සේවාවන් ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපාය මාර්ගෝපදේශ ලබාදීම, සම්පත් වෙන්කර දීම, සියළුම සෞඛ්‍ය සේවා සපයන ආයතනවල කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා කළමනාකරණය සහ සියළුම ජනතාව වෙත විශාල වූ සෞඛ්‍ය ආරක්ෂණ ආයතන පද්ධතියතුල සේවාව ලබාදෙන ස්ථානයේදී නොමිලයේ සෞඛ්‍ය සේවාවන් ලබාදීමය.

නිදහස් සෞඛ්‍ය සේවාව සහ අධ්‍යාපනය ලබාදීමේ යහපත් සමාජ ප්‍රතිපත්ති අනුගමනය කරමින් පිළිවෙලින් පත්වූ රජයන්ගේ කැපවීම නිසා ශ්‍රී ලංකාව රටේ ජනතාව වෙත සෞඛ්‍ය සේවාවන් සැපයීමේ අති විශාල දියුණුවක් ලබාගෙන ඇත. ඕනෑම සෞඛ්‍ය පද්ධතියක දිගු කාලීන අරමුණ වනුයේ කල්පවතින සෞඛ්‍යය සහ එම සේවාවන් ලබා ගන්නා ජනතාවගේ ශරීර සෞඛ්‍ය පවත්වා ගැනීම වන අතර සමාජයේ ආර්ථික සහ සමාජ සංවර්ධනයට දායක වීමය. සෞඛ්‍ය අමාත්‍යාංශය තව දුරටත් ඉදිරියට යමින් සියළුම ජනතාව වෙත උසස් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන් ලබා දී සර්ව සෞඛ්‍ය ආවරණය (UHC) ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. සර්ව සෞඛ්‍ය ආවරණය මඟින් සෞඛ්‍ය මට්ටම උසස් කිරීම, රෝග වැළැක්වීම, රෝග නිවාරණය, පුනරුත්ථාපනය සහ රෝගීන්ට සහන සත්කාර සේවා (palliative care) යන සේවාවන් අවශ්‍ය කරන සියළුම ජනතාව වෙත ලබාදීම සහතික කිරීම, ප්‍රමාණවත් ගුණාත්මකභාවය සඵලකිරීම මෙන්ම මෙම සේවාවන් ලබා ගැනීමේදී එම සේවාවන් ලබාගන්නා මූල්‍ය අර්බුදයකට පත්නොවීම සහතික කිරීමය.

මෙම 2018 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මඟින් සෞඛ්‍ය අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මෙන්ම සෞඛ්‍ය අංශයේ 2018 වර්ෂය සඳහා පොදුවේ සකස් කරන ලද ඉලක්කයන්ට අනුව ප්‍රගතිය ඉදිරිපත් කෙරේ. තවද මෙම වාර්තාව මඟින් පසුගිය වර්ෂයේ ප්‍රධාන කාර්ය සාධන ඉලක්කයන්ට එරෙහිව ළඟාකරගත් ප්‍රගතියේ දළ විශ්ලේෂණයක්ද සහිතව ඉදිරිපත් කෙරේ.

# පටුන

## අංශය 1: සෞඛ්‍ය හා පෝෂණය


| අංකය | විස්තරය | පිටුව |
|---|---|---|
| **1.0** | සාරාංශය | 02 |
| **1.1** | රාජකාරීන් සහ ක්‍රියාකාරකම් | 03 |
| **1.2** | ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය දර්ශක | 04 |
| **1.3** | රෝහීය අමාත්‍යාංශයට අයත් ආයතනයන්හි මානව සම්පත් පැතිකඩ **-2018** | 05 |
| **1.4** | වාර්ෂික මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශය - 2018 | 06 |
| | | |
| **2.0** | 2018 වසරේදී ලඟා කරගනු ලැබූ ප්‍රධාන ජයග්‍රහණයන් | 08 |
| | | |
| **3.0** | **රෝහීය අමාත්‍යාංශය යටතේ ඇති වැඩසටහන්, විශේෂිත ව්‍යාපාර හා අධ්‍යක්ෂක අංශ** | 18 |
| **3.1** | බෝවන රෝග පාලනය | 18 |
| 3.1.1 | වසංගත රෝග ඒකකය | 18 |
| 3.1.2 | ක්ෂය රෝග හා ළය රෝග මර්දන වැඩසටහන | 19 |
| 3.1.3 | ලාදුරු මර්දන වැඩසටහන | 20 |
| 3.1.4 | නීරෝධායන සේවාවන් | 21 |
| | | |
| **3.2** | රෝග වාහකයන් මගින් බෝවන රෝග පාලනය | 22 |
| 3.2.1 | ඩෙංගු මර්දන වැඩසටහන | 22 |
| 3.2.2 | බරවා මර්දන වැඩසටහන | 23 |
| 3.2.3 | මැලේරියා මර්දන වැඩසටහන | 24 |
| | | |
| **3.3** | බෝනොවන රෝග පාලනය | 25 |
| 3.3.1 | ජාතික පිළිකා මර්දන වැඩසටහන | 25 |
| 3.3.2 | මානසික සෞඛ්‍ය සේවාවන් | 29 |
| 3.3.3 | නිදන්ගත වකුගඩු රෝග (CKD) වැලැක්වීමේ හා පාලනය කිරීමේ වැඩසටහන | 30 |
| | | |
| **3.4** | මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා | 31 |
| | | |
| **3.5** | මුඛ සෞඛ්‍ය සේවා | 32 |
| | | |
| **3.6** | පුහුණු හා පර්යේෂණ | 33 |
| 3.6.1 | වෛද්‍ය පර්යේෂණායතනය | 33 |
| | | |
| **3.7** | පෝෂණ | 34 |
| 3.7.1 | පෝෂණ අංශය | 34 |
| | | |
| **3.8** | ආපදා සඳහා පෙරසූදානම් හා ප්‍රතිචාර දැක්වීමේ අංශය | 35 |
| | | |
| **3.9** | පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය | 37 |
| | | |
| **3.10** | සෞඛ්‍ය ප්‍රවර්ධනය | 38 |
| | | |
| **3.11** | තරුණ, වැඩිහිටි හා ආබාධිතවූවන් පිළිබඳ සේවා | 39 |
| | | |

| | | |
|---|---|---|
| **3.12** | **පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමනය** | 40 |
| | | |
| **3. 13** | **අතිරේක සේවා** | 41 |
| 3.13.1 | රසායනාගාර සේවා | 41 |
| 3.13.2 | ජාතික රුධිර පාරවිලයන සේවාව | 44 |
| 3.13.3 | සෞඛ්‍ය සේවාවන්ගේ ගුණාත්මක හා සුරක්ෂිතතාවය | 45 |
| 3.13.4 | මහජන පශු වෛද්‍ය සේවාවන් | 46 |
| 3.13.5 | වෛද්‍ය සංඛ්‍යා ලේඛණ ඒකකය | 46 |
| 3.13.6 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 48 |
| | | |
| **3. 14** | **වෛද්‍ය - නීති සේවාවන්** | 49 |
| | | |
| **3. 15** | **ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග පාලන සේවාවන්** | 50 |
| | | |
| **3. 16** | **වෛද්‍ය සැපයුම් සේවාවන්** | 51 |
| | | |
| **3. 17** | **ජීව වෛද්‍ය ඉංජිනේරු සේවාවන්** | 52 |
| | | |
| **3. 18** | **කළමනාකරණ, සංවර්ධන හා සැලසුම් සේවාවන්** | 53 |
| 3.18.1 | සැලසුම් අංශය | 53 |
| 3.18.2 | ජාත්‍යන්තර සෞඛ්‍ය | 54 |
| | | |
| **3. 19** | **මූල්‍යමය සේවාවන්** | 55 |
| 3.19.1 | ප්‍රධාන මූල්‍ය නිලධාරි - II | 55 |
| 3.19.2 | ප්‍රධාන මූල්‍ය නිලධාරි - III | 56 |
| | | |
| **3. 20** | **සෞඛ්‍ය සේවා ආයතනවල ක්‍රියාත්මක කෙරෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති** | 57 |
| 3.20.1 | දේශීය අරමුදල් මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති | 57 |
| 3.20.2 | විදේශාධාර මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති | 60 |
| 3.20.3 | දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (SHSDP) | 61 |
| 3.20.4 | ඒඩ්ස් (AIDS), ක්ෂය රෝගය (Tuberculosis) සහ මැලේරියා (Malaria) රෝග සඳහා සටන් කිරීමේ ගෝලීය අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතිය (GFATM) | 61 |
| 3.20.5 | සර්ව සෞඛ්‍ය ආවරණය සඳහා වූ සෞඛ්‍ය සේවා සැපයීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 61 |
| | | |
| **4.0** | **රේඛීය අමාත්‍යාංශයට අයත් රෝහල්වල වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ සාරාංශය - 2018** | 62 |

# අංශය I:
# සෞඛ්‍ය හා පෝෂණ

## 1.0 සාරාංශය

**දැක්ම**
**දේශයේ ආර්ථික, සාමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහිකිරීම**

**මෙහෙවර**
**ජනතා අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින්, සාමූහිකව ක්‍රියා කරමින්, පරිපූර්ණ, ඉහලම මට්ටමේ, ගුණාත්මක, සමාන, ඵලදායී සහ තිරසාර සෞඛ්‍ය සේවාවක් ශ්‍රී ලංකාවාසී ජනතාවට ලබාදීම මගින් අත්කරගත හැකි ඉහළමසෞඛ්‍ය මට්ටමට ළඟාවීම**

### ප්‍රතිපත්ති අරමුණු

- නිවැරදි සෞඛ්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සේවා සැපයීම ශක්තිමත් කිරීම
- සියළුම ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා උචිත වන අයුරින් සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි උසස් ගුණාත්මක බවින් යුත් සත්කාරක සේවාවන් ඇති කිරීම
- ගුණාත්මක බවින් යුත් පුනරුත්ථාපන සත්කාර සේවාවක් ලබාගැනීම සඳහා අදාල රෝගීන්ට සමානාත්මක ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම
- සේවා සැපයුම් දත්ත මත පදනම් වූ ක්‍රමවේද මගින් ශක්තිමත් කර අඛණ්ඩ සේවාවන් සියළුම රෝගීන්ට ලබාදීම
- රෝගීන්ට ප්‍රතිකාර ලබාගැනීම සඳහා ඔවුන්ගේ මුදල් පුද්ගලිකව වියදම් කිරීමට සිදුවීම එනම් රෝගීන්ගේ මූලම්‍ය අවදානම් අවම කිරීම සඳහා නව උපාය මාර්ගයන් වැඩි දියුණු කිරීම
- මානව සම්පත් කළමනාකරණය ඇතුළුව අනෙකුත් අංශ මනා ප්‍රතිව්‍යුහගත කිරීමක් තුලින් පුළුල් සෞඛ්‍ය සේවා පද්ධතියක් සුරක්ෂිත කිරීම
- සෞඛ්‍ය සේවාවන් සපයන සියළු පාර්ශව සමඟ උපාය මාර්ගික සම්බන්ධතා වර්ධනය කරගැනීම

## 1.1 රාජකාරීන් සහ ක්‍රියාකාරකම්

### සෞඛ්‍ය හා පෝෂණ

1. ප්‍රතිපත්ති සකස් කිරීම, සෞඛ්‍ය අංශය සඳහා වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම,
2. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය සහ පහත සඳහන් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සංස්ථා යටතේ පවතින විෂයයන්, අධීක්ෂණ හා ඇගයීම් කටයුතු සිදුකිරීම
3. මහජන සෞඛ්‍ය සේවාවන්ට අදාල ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සම්පාදනය
4. මහජන සෞඛ්‍ය හා පෝෂණය වැඩිදියුණු කිරීමට වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාවට නැංවීම
5. අන්තර්ජාතික නිරෝධායන හා සනීපාරක්ෂණයට අදාල නීතිරීති ක්‍රියාත්මක කිරීම
6. පෞද්ගලික රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය, ප්‍රමිතීන් හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණය
7. ලාභ නොලබන ප්‍රජා වෛද්‍ය සත්කාරක ආයතනවල වැඩකටයුතු නියාමනය හා අධීක්ෂණය
8. වසංගත, බෝවන හා බෝනොවන රෝග තත්ව පාලනය, වැළැක්වීම හා ප්‍රතිකාර සඳහා මෙහෙයුම් දියත් කිරීම
9. පාසල් සෞඛ්‍ය වැඩසටහනට අදාල වෛද්‍ය සහ මුඛ සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම
10. වතු අංශය සඳහා වන සෞඛ්‍ය සේවාවන්
11. සාමාන්‍ය සනීපාරක්ෂණය
12. ත්‍රිපෝෂ බෙදාදීමේ වැඩපිළිවල ක්‍රියාත්මක කිරීම
13. පලාත් සභාවලට අයත් නොවන සියලුම රෝහල්හා රෝහල් සේවකයින් පරිපාලනය
14. පුහුණුවීම් කටයුතු මෙහෙයවන සියලු දෙපාර්තමේන්තු හා එම සේවාවන් පරිපාලනය හා සංවිධානය හා අනෙකුත් උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතන හා සම්බන්ධීකරණය
15. ජාතික රුධිර පාරවිලයන සේවාවන්
16. ඖෂධ ධනිෂ්පාදනය, ආනයනය හා බෙදාහැරීම
17. ශ්‍රී ලංකා වෛද්‍ය සේවාවට අදාල පරිපාලනය හා පිරිස් කළමනාකරණය
18. වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවාවන්හී ගුණාත්මකභාවය සහ නිපුණතා වැඩිකිරීමට අවශ්‍ය පුහුණු අවස්ථා ඇතිකිරීම
19. සෞඛ්‍ය අංශයට අදාල පර්යේෂණ කටයුතු ව්‍යාප්ත කිරීමට නව උපක්‍රම හඳුන්වා දීම
20. ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් හා සම්බන්ධ කරුණු

### ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා

1. ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල
2. විජය කුමාරතුංග අනුස්මරණ රෝහල
3. දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
4. ජාතික ඖෂධ නියාමන අධිකාරිය
5. රාජ්‍ය ඖෂධ සංස්ථාව
6. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව
7. ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

## 1.2 ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය දර්ශක

සෞඛ්‍ය සේවා සැපයීමේ කාර්ය සාධනය විශ්ලේෂණය කිරීම සෞඛ්‍ය සේවාවන් සැපයීමේ ඉහළ කාර්යක්ෂමතාවය හා සඵලතාවය ළඟාකරගැනීමට හේතු වේ. සෞඛ්‍ය ආයතනික අරමුණු හා අභිප්‍රායයන් කාලයත් සමඟ ඇගයීම තුළින් සෞඛ්‍ය සේවාවේ කාර්ය සාධනය තෝරාගත් දර්ශක භාවිතා කරමින් මැනිය හැක. මෙම අවශ්‍යතාවය සපුරාගැනීමට ජාතික සෞඛ්‍ය කාර්යසාධන රාමුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත. මෙම දර්ශක භාවිතා කරමින් සෞඛ්‍ය කාර්ය සාධනය විශ්ලේෂණයට හා නිවැරදි මඟට ගැනීම සඳහා මෙන්ම කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් හා සම්පත් වෙන්කරදීමේ දී තීරණ ගැනීමේ පදනම වශයෙන් මෙම දර්ශක භාවිතා කළ හැක. තෝරාගත් ප්‍රයෝජනවත් දර්ශක කිහිපයක් පහත සඳහන් කෙරේ.

| දර්ශකය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| උපතේදී ආයු අපේක්ෂාව | පුරුෂ - 72<br>ස්ත්‍රී - 78.6<br>(2011 – 2013) | - | - |
| මාතෘ මරණ අනුපාතිකය | 33.7 | 33.8 | 39 |
| අවුරුදු 5ට අඩු ළමා මරණ අනුපාතිකය (සජීවී උපත් 1000 කට) | 10.75 | 9.27 | 10.90 |
| ළදරු මරණ අනුපාතිකය (සජීවී උපත් 1,000 කට) | 9.16 | 8.20 | 9.00 |
| නව ජන්ම මරණ අනුපාතිකය (සජීවී උපත් 1,000 කට) | 6.59 | 5.80 | 6.30 |
| ගර්භනී කාලය සති 8කට පෙර ලියාපදිංචි වූ මව්වරුන්ගේ ප්‍රතිශතය | 77.08 | 78.47 | 79.40 |
| බර අඩු පූර්ව පාසල් වයසේ (අවු. 2 -5) ළමුන්ගේ ප්‍රතිශතය | 16.97 | 21.23 | 20.50 |
| අඩුබර උපත් ප්‍රතිශතය | 11.36 | 11.20 | 11.80 |
| ළමා ප්‍රතිශක්තිකරණය: ගලපටලය, පිටගැස්ම, කක්කල්කැස්ස යන මාත්‍රා තුනම අඩංගු එන්නත ලබා ගත් ළදරුවන්ගේ ප්‍රතිශතය | - | 97 | 96 |
| ආසාදනය නොවූ ජනගහනය 1,000 කට නව HIV ආසාදන සංඛ්‍යාව | 0.03 | 0.03 | 0.0082 |
| හෘද- ධමනි රෝග , දියවැඩියාව හෝ කල්ගතවූ ශ්වසන රෝග නිසා ඇතිවන මරණ අනුපාතය | 17.7 | - | - |
| සියදිවි නසා ගැනීමේ මරණ අනුපාතය | 14.5 | 14.3 | 15.1 |
| හඳුනාගත් හා සාර්ථකව ප්‍රතිකාර කරණ ලද වාර්තා වී ඇති ක්ෂය රෝගීන්ගේ ප්‍රතිශතය | 83.2 | 84.1 | 84.6 |
| දැනට antiretroviral චිකිත්සා ප්‍රතිකාර ලබන HIV ආසාධිතව ජීවත්වන ජනතාවගේ ප්‍රතිශතය | - | 15.13 | 36.98 |
| ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR) - සම-ධාරිතා සූචි පත්‍රය (Core Capacity Index) | - | 79.2 | 76 |
| තිරසාර පදනම යටතේ පැවතිය යුතු අදාල අත්‍යාවශ්‍ය ඖෂධ පැවතීම හා මිලදී ගැනීමේ හැකියාව පිළිබඳව සෞඛ්‍ය පහසුකම් ප්‍රමාණය | | 50% **පොදු 100.0**<br>**පෞද්ගලික 95.29**<br>**75% පොදු 82.16**<br>**පෞද්ගලික 80.26**<br>**90% පොදු 21.44**<br>**පෞද්ගලික 53.04** | |

## 1.3 රේඛීය අමාත්‍යාංශයීය ආයතනවල මානව සම්පත් පැතිකඩ - 2018

| අංකය | තනතුරු කාණ්ඩය | 2018/12/31 දිනට මුළු අනුමත සංඛ්‍යාව | කොන්තාත් පදනම මත සිටින සංඛ්‍යාව | 2018/12/31 දිනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | විශේෂඥ වෛද්‍ය නිළධාරි | 1609 | | 1580 |
| 2 | වෛද්‍ය නිළධාරි | 13398 | | 11054 |
| 3 | වෛද්‍ය පරිපාලන නිළධාරි | 166 | | 97 |
| 4 | විශෙෂඥ දන්ත වෛද්‍ය නිළධාරි | 71 | | 66 |
| 5 | දන්ත වෛද්‍ය නිළධාරි | 747 | | 670 |
| 6 | පරිපාලන සේවයේ නිළධාරි | 41 | | 31 |
| 7 | වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥ | 1406 | 2 | 1231 |
| 8 | විකිරණ ශිල්පි | 773 | 1 | 470 |
| 9 | වෘත්තීය චිකිත්සක | 180 | 1 | 124 |
| 10 | භෞත චිකිත්සක | 565 | | 455 |
| 11 | ඖෂධවේදී | 1273 | | 1076 |
| 12 | අක්ෂි තාක්ෂණවේදී | 156 | | 140 |
| 13 | පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණි | 1687 | | 1136 |
| 14 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 208 | | 188 |
| 15 | පාසල් දන්ත චිකිත්සක | 24 | | 10 |
| 16 | විද්‍යුත් නිකර්පණ රේඛණ සටහන්කරු | 96 | | 86 |
| 17 | ඛන්තු රේඛණ සටහන්කරු | 411 | | 239 |
| 18 | ආහාර හා ඖෂධ පරීක්ෂක | 35 | 1 | 12 |
| 19 | ඍජු නේත්‍රඥ | 23 | | 9 |
| 20 | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි | 119 | | 87 |
| 21 | කීට විද්‍යා නිළධාරි | 36 | | 24 |
| 22 | දන්ත කාර්මික | 57 | | 32 |
| 23 | වෙනත් අධ්‍යක්ෂවරු | 7 | | 6 |
| 24 | ගණකාධිකාරි | 80 | 3 | 51 |
| 25 | ලියා පදිංචි වෛද්‍ය නිළධාරින් / සහකාර වෛද්‍ය නිළධාරින් | 112 | | 107 |
| 26 | වෙනත් නිළධාරි හා සමාන්තර සේවා | 352 | | 175 |
| 27 | හෙද නිළධාරි | 28363 | | 23857 |
| 28 | වෙනත් විධායක නිළධාරි | 196 | 1 | 131 |
| 29 | වෙනත් ප්‍රාථමික මට්ටමේ - පුහුණු | 1301 | 2 | 998 |
| 30 | වෙනත් ප්‍රාථමික මට්ටමේ - අර්ධ පුහුණු | 1753 | | 1226 |
| 31 | වෙනත් ප්‍රාථමික මට්ටමේ - නුපුහුණු | 909 | | 574 |
| 32 | වෙනත් ද්විතීයික සහ තෘතීයික මට්ටමේ නිළධාරින් | 5551 | | 4120 |
| 33 | මහජන සෞඛ්‍ය හෙද සොයුරිය | 63 | | 41 |
| 34 | උපස්ථායක | 6313 | | 4637 |
| 35 | කම්කරු | 20993 | | 18721 |
| 36 | ඖෂධ සංයෝජක | 140 | | 128 |
| 37 | මානව සම්පත් | 1 | | 0 |
| | **සම්පූර්ණ එකතුව** | **89215** | **16** | **73589** |

## 1.4 වාර්ෂික මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශය- 2018

| වැයශීර්ෂ අංකය | විස්තරය | ඇස්තමේන්තුව 2018 (රුපියල්) | සංශෝධිත අයවැය 2018 (රුපියල්) | වියදම 2018 (රුපියල්) |
|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | **133,043,550,000** | **137,592,550,000** | **134,448,816,751** |
| | **පුද්ගල පඩිනඩි** | **69,894,750,000** | **74,007,005,000** | **73,976,446,141** |
| 1001 | වැටුප් හා වේතන | 27,746,950,000 | 29,218,655,000 | 29,207,375,830 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 16,432,800,000 | 21,747,400,000 | 21,735,028,177 |
| 1003 | වෙනත්දීමනා | 25,715,000,000 | 23,040,950,000 | 23,034,042,135 |
| | **ගමන් වියදම්** | **201,300,000** | **255,160,000** | **253,511,119** |
| 1101 | දේශීය | 132,300,000 | 165,860,000 | 164,948,220 |
| 1102 | විදේශීය | 69,000,000 | 89,300,000 | 88,562,899 |
| | **සැපයීම්** | **48,392,300,000** | **49,363,988,100** | **46,648,878,529** |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 245,700,000 | 338,233,100 | 333,531,443 |
| 1202 | ඉන්ධන | 373,300,000 | 434,330,000 | 428,241,289 |
| 1203 | ආහාරපාන හා නිලඇඳුම් | 2,340,300,000 | 1,921,400,000 | 1,917,109,196 |
| 1204 | වෛද්‍ය සැපයීම් | 45,025,000,000 | 46,025,000,000 | 43,330,646,343 |
| 1205 | වෙනත් | 408,000,000 | 645,025,000 | 639,350,258 |
| | **නඩත්තු වියදම්** | **681,400,000** | **800,714,400** | **794,047,301** |
| 1301 | වාහන | 253,500,000 | 264,620,000 | 261,389,695 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 171,200,000 | 200,020,000 | 198,930,869 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 256,700,000 | 336,074,400 | 333,726,737 |
| | **සේවා** | **7,133,400,000** | **7,895,677,500** | **7,764,757,176** |
| 1401 | ප්‍රවාහන | 36,200,000 | 75,880,600 | 64,026,174 |
| 1402 | තැපැල් හා සංනිවේදන | 575,200,200 | 635,790,500 | 634,314,166 |
| 1403 | විදුලිය හා ජලය | 2,596,500,000 | 2,998,319,000 | 2,938,205,295 |
| 1404 | බදුකුලී සහ පළාත් පාලන ආයතන බදු | 200,000,000 | 236,237,400 | 200,307,404 |
| 1408 | මෙහෙයුම් කල්බදු ක්‍රමයට ප්‍රසම්පාදිත වාහන සඳහා වාරික ගෙවීම් | 667,000,000 | 4,350,000 | 4,230,288 |
| 1409 | වෙනත් | 3,058,500,000 | 3,945,100,000 | 3,923,673,848 |
| | **මාරුකිරීම්** | **3,707,900,000** | **2,798,505,000** | **2,551,778,275** |
| | සුබසාධන වැඩසටහන් | 3,080,000,000 | 2,226,000,000 | 1,982,108,578 |
| 1503 | රාජ්‍ය ආයතන | 21,000,000 | 21,000,000 | 20,485,980 |
| 1505 | සම්මාදම් සහ දායක මුදල් | 28,000,000 | - | - |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 556,000,000 | 524,880,000 | 523,353,108 |
| 1508 | වෙනත් | 22,900,000 | 26,625,000 | 25,830,610 |
| | **වෙනත් පුනරාවර්තන වියදම්** | 3,032,500,000 | 2,471,500,000 | 2,459,398,208 |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 3,000,000 | - | - |

| ව්‍යාපෘති අංකය | විස්තරය | ඇස්තමේන්තුව 2018 (රුපියල්) | සංශෝධිත අයවැය 2018 (රුපියල්) | වියදම් 2018 (රුපියල්) |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | | **43,349,000,000** | **46,998,688,000** | **32,534,934,021.98** |
| | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **7,345,700,000** | **7,652,316,423** | **6,829,576,666.95** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 4,717,250,000 | 4,992,306,337 | 4,218,970,484.54 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,530,450,000 | 2,552,482,356 | 2,517,538,146.40 |
| 2003 | වාහන | 98,000,000 | 107,527,730 | 93,068,036.01 |
| | **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | **25,722,500,000** | **27,481,972,686** | **17,734,661,997.39** |
| 2101 | වාහන | 200,000,000 | 1,582,688,000 | 458,512,500.00 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 425,000,000 | 448,374,544 | 420,239,946.61 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 13,198,500,000 | 13,046,771,519 | 8,345,605,736.55 |
| 2104 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 11,540,000,000 | 12,045,138,623 | 8,487,109,250.23 |
| 2106 | මෘදුකාංග සංවර්ධනය | 359,000,000 | 359,000,000 | 23,194,564.00 |
| | **ප්‍රාග්ධන මාරුකිරීම්** | **1,404,500,000** | **1,404,500,000** | **1,079,479,687.63** |
| 2201 | රාජ්‍ය ආයතන | 1,397,500,000 | 1,397,500,000 | 1,073,739,409.02 |
| 2202 | සංවර්ධන සහයයන් | 7,000,000 | 7,000,000 | 5,740,278.61 |
| | **ධාරිතා සංවර්ධනය** | **928,300,000** | **1,010,237,421** | **972,622,441.37** |
| 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 928,300,000 | 1,010,237,421 | 972,622,441.37 |
| | **වෙනත් මූලධන වියදම්** | **7,948,000,000** | **9,449,661,470** | **5,918,593,228.64** |
| 2505 | ප්‍රසම්පාදන පෙර සූදානම | 148,400,000 | 141,251,262 | 93,892,562.93 |
| 2506 | යටිතල පහසුකම් සංවර්ධනය | 1,190,000,000 | 1,126,000,000 | 618,520,334.26 |
| 2507 | පර්යේෂණ හා සංවර්ධනය | 106,000,000 | 181,000,000 | 115,591,717.99 |
| 2509 | වෙනත් | 6,503,600,000 | 8,001,410,208 | 5,090,588,613.46 |

## 2.0 2018 වසරේදී ලබා කරගනු ලැබූ ප්‍රධාන ජයග්‍රහණයන්

- **ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා මෙරට ජනතාව වෙත ඉටුකරන ලද සේවාව වෙනුවෙන් " සුවපති " උපහාරයෙන් පිදුම් ලැබීම**



ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය, වෛද්‍ය රාජිත සේනාරත්න " සුවපති " සම්මානයෙන් පිදුම් ලැබුවේය. මෙම උපහාර ප්‍රදානය සංවිධානය කරනු ලැබුවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති සන්ධානය සහ ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා පොදු ජනතාවගේ සෞඛ්‍ය ගැටළු නිරාකරණය සඳහා සාර්ථකව කටයුතු කරමින් දැක්වූ දායකත්වය හඳුනාගැනීමට හා ඇගයීමටය. මෙම උත්සවය 2018 ජූලි මස 31 දින, අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන, ගරු අගමැති රනිල් වික්‍රමසිංහ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත වෛද්‍ය රාෂියා පෙන්සේ, අමාත්‍යවරුන්, පාර්ලිමේන්තු නියෝජිතයින් සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් පොදු ජනතාව වෙත ඉටු කරන ලද සේවාවන් අතර සියළුම අත්‍යාවශ්‍ය ඖෂධවල මිල ගණන් අඩු කිරීම, ඇසේ සුද සහිත රෝගීන් සඳහා නොමිලයේ අක්ෂි කාච ලබාදීම, හෘද රෝගීන්ට නොමිලයේ ස්ටෙන්ට් (Stents) ලබාදීම, සියළුම රුධිර පරීක්ෂණ අයකිරීමකින් තොරව කර ගැනීමට පහසුකම් සැපයීම සහ පිළිකා ප්‍රතිකාර සඳහා හිමිකම් සහිත සෑම පිළිකා රෝගියෙකුටම ලබා දෙන මුදල රුපියල් මිලියන 1.5 දක්වා වැඩි කිරීම වේ.

- **ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 70 වැනි ලෝක සෞඛ්‍ය දිනය 2018 අප්‍රේල් මස කොළඹදී සමරන ලදී**

ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) 70 වැනි ලෝක සෞඛ්‍ය දිනය ඉතා උත්කර්ෂවත් අයුරින් නෙළුම් පොකුණ කලාගාරයේදී 2018.04.07 දින අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය ටෙඩ්‍රොස් ආදනෝම් ග්‍රෙබ්‍රේසේයස්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. සෑම වසරකම අප්‍රේල් මස 07 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලෝක සෞඛ්‍ය දිනය සමරන අතර 2018 දී ජාත්‍යන්තර උත්සවය ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. 2018 වර්ෂයේදී ලෝක සෞඛ්‍ය දිනයේ තේමාව වූයේ " ලෝක සෞඛ්‍ය ආවරණය : සෑම කෙනෙක් සඳහාම, සෑම ස්ථානයකදීම" යනුවෙනි.




ජාතික ප්‍රමිති රූපවාහිනී ජාලය (NQTV) විද්‍යුත් සෞඛ්‍ය කාඩ්පත (e Health Card), සමරු මුද්දරය සහ ශ්‍රී ලංකාව සඳහා වූ තිරසර සංවර්ධන ඉලක්ක මාර්ගය (SDG Tracker for Sri Lanka) යන ක්‍රියාකාරකම් අතිගරු ජනාධිපතිතුමා විසින් නිල වශයෙන් දියත් කරන ලදී. මෙම අවස්ථාව සඳහා සීශෙල්ස් රාජ්‍යයේ ගරු අගමැති, ගරු අගමැති රනිල් වික්‍රමසිංහ, ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය, ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසාල් කාසිම්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය ටෙඩ්‍රොස් ආදනෝම් ග්‍රෙබ්‍රෙසේයස්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ දකුණු ආසියානු ප්‍රාදේශීය අධ්‍යක්ෂ වෛද්‍ය පූනාම් කෙත්‍රපාල් සිං යන ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිතයින්ද සහභාගි විය.

- **රුබෙල්ලා තුරන් කරන ලද රටක් වශයෙන් ශ්‍රී ලංකාව නම් කිරීම**




ඉන්දියාවේ නවදිල්ලිහිදී 2018 සැප්තැම්බර් 05 දින පැවති ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) ගිනිකොණදිග ආසියානු ප්‍රාදේශීය රැස්වීමේදී, ශ්‍රී ලංකාව රුබෙල්ලාවලින් තොර රටක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නම් කරන ලදී. මෙම සහතික පත්‍රය ලෝක සෞඛ්‍ය සංවිධානයේ ගිනිකොණදිග ආසියානු කලාපයේ (WHO SEAR) ප්‍රාදේශීය අධ්‍යක්ෂ වෛද්‍ය පූනාම් කෙත්‍රපාල් සිං විසින් ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න වෙත පිරිනමන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාව, 2015 දී මැලේරියා තොර රටක් ලෙසද, 2016 දී බරවාවලින් තොර රටක් ලෙසද, නවජ පිටගැස්මෙන් තොර රටක් ලෙස 2017 දී ද නම් කරන ලදී.

“ 2018 දී ශ්‍රී ලංකාව රුබෙල්ලා වලින් තොර රටක් ලෙස නම් කිරීම මෙරට සෞඛ්‍ය සේවාවන් ලබාගත් තවත් එක් ප්‍රධාන සන්ධිස්ථානයකි ” වෛද්‍ය සිං ප්‍රකාශ කරන ලදී. ශ්‍රී ලංකාවේ සෑම වසරකම රෝගයක් තුරන්කිරීම, මෙරට සෞඛ්‍ය සේවාවේ නායකත්වය දක්වන විශාල සහයෝගය නිසා ලබාගත් ජයග්‍රහණයක් බව අගය කරමින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රාදේශීය අධ්‍යක්ෂ තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

- **ශ්‍රී ලංකා ජනාධිපතිගේ අනුග්‍රහය යටතේ බෝ නොවන රෝග පිළිබඳ පළමු සාර්ක් (SAARC) රැස්වීම පැවැත්වීම**

2018 මාර්තු 31 දින ගෝල්ෆේස් හෝටලයේදී අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ අනුග්‍රහය ඇතිව බෝ නොවන රෝග (NCD) පිළිබඳ පළමු සාර්ක් (SAARC) රැස්වීම පවත්වන ලදී. බෝ නොවන රෝග (NCDs) නිසා වාර්ෂිකව ලෝකය පුරා දළ වශයෙන් මිලියන 10 ක් පමණ ජනතාව මියයන අතර එයට ප්‍රධාන හේතු වශයෙන් වැරදි ආහාර රටාවන්, ශාරීරික ව්‍යායාම හිඟකම, ආතතිය සහ මත්පැන් හා දුම්කොළවලට ඇබ්බැහිවීම සැලකේ. මෙම බෝ නොවන රෝග පාලනය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් බොහොමයක් රටවල විවිධ ක්‍රියාකාරකම් හඳුන්වා දී ඇත.



- **ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) උප සභාපති වශයෙන් තේරී පත්වීම**

ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) විධායක මණ්ඩලයේ උප සභාපති වශයෙන් ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මහතා ජිනිවාහිදී පැවැති එහි විධායක කමිටු රැස්වීමේදී නිතරගයෙන් තේරී පත්විය. 2018.05.28 දින පැවැති WHO විධායක මණ්ඩලයේ ගිනිකොණ-දිග ආසියානු කලාපයේ 143 වැනි සැසිවාරයේදී වර්ෂයක කාලයක් සඳහා ඔහු උප සභාපති ධූරයට තේරී පත්විය. මෙම විධායක මණ්ඩලය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් සහිත සාමාජිකයින්ගෙන් සමන්විත වේ. එම සාමාජිකයින් වසර තුනක කාලයක් සඳහා තෝරා ගැනේ. මෙම මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන්නේ ලෝක සෞඛ්‍ය සභාව (World Health Assembly) සඳහා අවශ්‍ය තීරණ හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම බලගැන්වීම සහ උපදෙස් ලබා දීම මෙන්ම එහි සාමාන්‍ය කටයුතු කරගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීමය.





- **" Cuba Salud 2018 " අන්තර්ජාතික සම්මේලනයේදී කියුබාවේ නිෂ්පාදනය කරන ඖෂධ හා වෛද්‍ය උපකරණ ලබාගැනීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී**





කියුබාවේ මහජන සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කළ රැස්වීමට රටවල් 82 කින් පැමිණි 3,000 කට වඩා වැඩි ප්‍රභූන් සමඟ ප්‍රධාන සෞඛ්‍ය අංශ ප්‍රධානීන් වන ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය ටෙඩ්‍රොස් ආදනෝම් ග්‍රෙබ්‍රෙසේයස් සහභාගී විය. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය සංවර්ධනය සඳහා කියුබානු රජය මහත් කැපවීමෙන් සහයෝගය ලබාදුණි. මෑතකදී කියුබාවේ හවානා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ පැවති " Cuba Salud 2018 " ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මහතා සමඟ පැවති රැස්වීමේදී ශ්‍රී ලංකාවට සහාය දීමට කියුබානු මහජන සෞඛ්‍ය අමාත්‍ය රොබෙටෝ මොරාලෙස් ඕජෙඩා මහතා පොරොන්දු වී ඇත.

අමාත්‍යවරුන් දෙදෙනා අතර පැවති සාකච්ඡා අතරතුරදී කියුබාවේ නිෂ්පාදිත ඖෂධ හා වෛද්‍ය උපකරණ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (SPC) හරහා ශ්‍රී ලංකාවට ලබා ගැනීම සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කිරීමට එකඟ විය. මෙම ගිවිසුම අත්සන් කිරීමට පෙර ශ්‍රී ලංකාවේ සහ කියුබාවේ සෞඛ්‍ය බලධාරීන් අතර සාකච්ඡා වට කිහිපයක් පැවැත්වීමට නියමිතය.

- **චීන - ශ්‍රී ලංකා මිත්‍රත්ව රෝහල ඉදිකිරීම (දකුණු ආසියාවේ විශාලතම වකුගඩු රෝහල)**





චීනයෙන් පරිත්‍යාගයක් ලෙස ලැබෙන පොළොන්නරුවේ ජාතික වෘක්ක රෝහල ඉදිකිරීමේ කටයුතු 2018.08.21 දින ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ අනුග්‍රාහකත්වයෙන් ආරම්භ විය. වකුගඩු රෝගීන් සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීමට අතිගරු ජනාධිපතිතුමාගේ දිගු කාලයක පටන් පැවති බලාපොරොත්තුවක් ඉටු කරමින් මෙම නව රෝහල දකුණු ආසියාවේ විශාලතම වකුගඩු රෝහල ලෙස රුපියල් බිලියන 1.2 ක පිරිවැයකට ඉදිකෙරෙමින් පවතී. උතුරු මැද පළාතේ පමණක් නොව අනෙකුත් ප්‍රදේශවල ජීවත්වන ජනතාවට මෙම රෝහල ඉතා අගනා වස්තුවක් වන අතර ශ්‍රී ලංකාවේ ජනතාව වෙත ලැබුණු පරිත්‍යාගයකි. මෙම රෝහල් ව්‍යාපෘතිය අති නවීන පන්නයේ උපකරණ සහ වකුගඩු රෝගීන්ට අවශ්‍ය සියළුම පහසුකම්වලින් සමන්විත වේ. මෙම රෝහල ඇඳන් 200 ක වාට්ටු සංකීර්ණය, කාන්දු පෙරණ යන්ත්‍ර 100 ක් සහිත බාහිර රෝගී අංශය (OPD) සහ නවීන ශල්‍යාගාර හයකින් සමන්විත වේ. ආසන 200 ක ශ්‍රවණාගාරය සහ වාහන 300 ක් ගාල්කර හැකි රථවාහන නැවතුම්පලක් හා රෝහල් කාර්යය මණ්ඩලය සඳහා නේවාසික පහසුකම්ද මෙම රෝහලේ ස්ථාපනය කරනු ඇත. මෙම ව්‍යාපෘතිය මාස 24 කින් නිමකිරීමට බලාපොරොත්තු වන අතර 2020 ජූලි මාසයේදී මෙම රෝහල ජනතාව වෙත සේවාවන් සැපයීමට සූදානම් කරනු ලැබේ.

- **කළුතර දිස්ත්‍රික් මහ රෝහලේ අනතුරු හා හදිසි සේවා ඒකකය විවෘත කිරීම**

කළුතර දිස්ත්‍රික් මහ රෝහලේ අභිනවයෙන් ඉදිකරන ලද අනතුරු හා හදිසි සේවා ඒකකය (A & E Unit) ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා විසින් 2018.05.10 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය රුපියල් මිලියන 1030 ක මුදලක් වැයකර ඇති අතර මෙරට අනතුරු හා හදිසි සේවා ඒකක වැඩිදියුණු කිරීමට ගරු අමාත්‍යතුමාගේ මඟපෙන්වීම යටතේ දිවයින පුරා ඉදිකරන ලද A & E ඒකක වලින් එකකි.



- **යාපනයේ ශික්ෂණ රෝහල සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඉදිකිරීම**




යාපනය ශික්ෂණ රෝහලේ පුනරුත්ථාපන මධ්‍යස්ථානය සඳහා මුල්ගල තැබීම ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා විසින් 2018.08.16 දින සිදු කෙරිණි. මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් මිලියන 530 ක් පමණ වන අතර කුවේට් රතුකුරුස සමාජයේ පරිත්‍යාගයකි.

- **කල්මුණේ අෂ්රොෆ් අනුස්මරණ මූලික රෝහලේ අනතුරු හා හදිසි සේවා ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම**

ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ අනුග්‍රහය යටතේ කල්මුණේ අෂ්රොෆ් අනුස්මරණ මූලික රෝහලේ යෝජිත නවීන අනතුරු හා හදිසි සේවා ඒකකය සඳහා මුල්ගල තැබීමේ උත්සවය 2018.06.17 දින පැවැත්විණි. මෙම ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් මිලියන 1900 ක් පමණ වේ.





➢ **මඩකලපුව ශික්ෂණ රෝහලේ වකුගඩු ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම**






ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ අනුග්‍රහය ඇතිව ගරු නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍ය ෆයිසාල් කාසිම් මහතාගේ සහභාගීත්වයෙන් 2018.06.17 දින මඩකලපුව ශික්ෂණ රෝහලේ වකුගඩු ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම සඳහා මුල්ගල තබන ලදී. මෙම ව්‍යාපෘතියේ පිරිවැය රුපියල් මිලියන 383 ක් වන අතර අවුරුදු එකයි මාස 10කින් එම ව්‍යාපෘතිය නිමකිරීමට බලාපොරොත්තු වේ.

➢ **මඩකලපුව ශික්ෂණ රෝහලේ 04 වැනි මට්ටමේ අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය විවෘත කිරීම**





ගරු සෞඛ්‍ය අමාත්‍ය හා ගරු නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යතුමන් විසින් මඩකලපුව ශික්ෂණ රෝහලේ 04 වැනි මට්ටමේ අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය 2018.06.17 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මුලු පිරිවැය රුපියල් මිලියන 895 ක් වේ.

➢ **බකමූණ ප්‍රාදේශීය රෝහලේ වකුගඩු රෝග වැළැක්වීමේ ඒකකය සහ නව පරිපාලන ගොඩනැගිල්ල**





පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි බකමූණ ප්‍රාදේශීය රෝහල සඳහා අභිනවයෙන් ඉදිකරන ලද " වකුගඩු රෝල වැළැක්වීමේ ඒකකය සහ නව පරිපාලන ගොඩනැගිල්ල " ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018.08.01 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම ඉදිකිරීම " පුබුදමු පොළොන්නරුව " වැඩසටහන යටතේ සම්පූර්ණ කරන ලදී.

➢ **ලෝක දුම්වැටි විරෝධී දිනය සැමරීම - 2018**






ලෝක දුම්වැටි විරෝධී දිනය " දුම්වැටි සහ හෘද රෝග " යන තේමාව යටතේ 2018 ජූනි 07 දින බත්තරමුල්ල වෝටර්ස් එජ් (Waters Edge) හිදී පැවැත්විණි. මෙම වැඩසටහනට ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ අනුග්‍රහය ලැබිණි.

නාටා (NATA) ආයතනයේ සභාපති වෛද්‍ය පාලිත අබේකෝන් මහතාගේ පිළිගැනීමේ කථාවත් සමඟ මෙම උත්සවය ආරම්භ කෙරිණි. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජනක සුගතදාස මහතා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අනිල් ජාසිංහ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකාවේ නියෝජිත වෛද්‍ය රාසියා පෙන්සේ, ශ්‍රී ලංකා හදවත් සංගමයේ සභාපති වෛද්‍ය එම්.ආර්. මුබාරක්, දුම්වැටි භාවිතය පාලනය කිරීම සම්බන්ධ විවිධ සංවිධාන නියෝජනය කරමින් විවිධ මට්ටමේ පුද්ගලයන් 250 ක් පමණ මේ අවස්ථාව සඳහා සහභාගි විය. මේ අවස්ථාවේදී " දුම්වැටියෙන් බිඳෙන හදවත් " යන මැයෙන් පොතක් නිකුත් කරන ලදී.

- **ශ්‍රී ලංකාවේ අවයව බද්ධ කිරීම සඳහා පවතින බාධාවන් ඉවත්කිරීමේ අරමුණින් " අවයව දන්දීමේ දිනය 2018 " සැමරීම**






ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා විසින් අවයව බද්ධ කිරීමට අවශ්‍ය රෝගීන් සඳහා අවයව ප්‍රදානය කිරීම ධෛර්යමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. රජයේ හෝ පෞද්ගලික අංශයේ රෝගීන් සඳහා අවයව ප්‍රදානය කිරීමේදී රෝගීන් මත පැටවෙන පිරිවැය අවදානම ඉවත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය සැලසුම් කෙරෙමින් පවතී.

- **මෙඩිකෙයා ජාතික සෞඛ්‍ය ප්‍රදර්ශනය - 2018**









වෛද්‍ය විද්‍යාවේ හා තාක්ෂණයේ අති නවීන නිපදවීම් හඳුන්වාදීම හා අනුබලදීම අරමුණු කරගත් ජාතික මෙඩිකෙයා සෞඛ්‍ය ප්‍රදර්ශනය 2018, B2C ප්‍රදර්ශනයකි. මෙම ප්‍රදර්ශනය මඟින් ව්‍යාපාර සහ වෛද්‍ය ආයතනවලට ඔවුන්ගේ ව්‍යාපාර සහ වෛද්‍ය විද්‍යාවේ නව සොයාගැනීම් පිළිබඳ ප්‍රචාරයක් ලබාදීමට කදිම අවස්ථාවක් ලබාදෙන ලදී. කෙසේ වෙතත්, එහි මූලික අරමුණ වූයේ රෝග නිශ්චය, වැළැක්වීම හා නිවාරණය සඳහා පවතින නවීන තාක්ෂණය පිළිබඳවත් සෞඛ්‍ය ගැටළු පිළිබඳවත් කාලීන නිවැරදි තොරතුරු මහජනතාව වෙත ලබාදීමයි.

- **ලෝක ලේ පරිත්‍යාගශීලීන්ගේ දිනය සැමරීම - 2018**




ශ්‍රීසිය විසින් හොබවන ලද ලෝක ලේ පරිත්‍යාගශීලීන්ගේ දිනය - 2018 ගරු සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් " Blood Connects us All " (රුධිරය අප සැම එක් කරයි) යන තේමාව යටතේ ජූනි මස 14 දින නෙළුම් පොකුණ රඟහලේදී පවත්වන ලදී. එය වාර්ෂිකව සිදු කරන අතර සැම වසරකම එකම දිනයක් යොදාගෙන ස්වේච්ඡාවෙන් රුධිරය ප්‍රදානය කරන්නන්ට ස්තුති කිරීමට හා ඔවුන් ඇගයීමටත් රුධිරය ප්‍රදානය ධෛර්යමත් කිරීමටත් කටයුතු කෙරේ. විශේෂයෙන් රුධිර ප්‍රදානය නිසා ජීවිත බේරා ගැනීම හා ජීවිත වෙනස්වන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම සිදු කෙරේ. මෙදින තේමාව වූයේ " ජීවිත කොටස්කරුවෙකු වන්න, ලේ දෙන්න " (Share Life, Give Blood).

## 3.0 රෝහීය අමාත්‍යාංශය යටතේ ඇති වැඩසටහන්, විශේෂිත ව්‍යාපාර හා අධ්‍යක්ෂක අංශ

### 3.1 බෝවන රෝග පාලනය

#### 3.1.1 වසංගත රෝග ඒකකය

එන්නත් මඟින් වැලැක්විය හැකි රෝග ඇතුළුව බහුතරයක් බෝවන රෝග, වැලැක්වීම සහ පාලනය සඳහා වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ කේන්ද්‍රීය ස්ථානය වසංගත රෝග ඒකකය වේ. එන්නත් මඟින් වැලැක්වියහැකි රෝග ඇතුළුව බෝවන රෝග ආවේක්ෂණය, නිදන්ගත වකුගඩු රෝග ආවේක්ෂණය, ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ආපදා අවස්ථාවන්හිදී රෝග පාලන කටයුතුවලදී හදිසි ප්‍රතිචාර දැක්වීමේ ඒකකය ලෙස ක්‍රියා කිරීම, උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධිධාරීන්, සායනික සහ ක්ෂේත්‍ර සෞඛ්‍ය කාර්ය මණ්ඩල පුහුණු කිරීම, බෝවන රෝග සහ ඒ ආශ්‍රිත වෙනත් විෂය පථයන්ට අදාල පර්යේෂණ සහ සහයෝගීත්ව ක්‍රියාකාරකම් සිදු කිරීම එහි ප්‍රධාන කාර්යයන්ට අයත් වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- පූර්ව සූදානමක් වශයෙන් එක් තෝරාගත් (sentinel) ප්‍රදේශයක Offline National Renal Registry ය වැඩිදියුණු කිරීම සම්පූර්ණ කිරීම සහ එය පිහිටුවීම.
- පළමු වසරේ CKDu Cohort අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීම.
- තිමෝර් ලෙස්ටේ (Timor-Leste) රාජ්‍යයේ ප්‍රතිශක්තිකරණ වැඩසටහන ශක්තිමත් කිරීම සඳහා එරට සෞඛ්‍ය නිලධාරීන් සඳහා වැඩසටහන් දෙකක් පැවැත්වීම.
- ක්ෂේත්‍ර වසංගතයන් ඇගයීමද ඇතුළුව ආයතනික මට්ටමින් සායනික හා මරණ පිළිබඳ සමාලෝචන්හි යෙදෙන දකුණු පළාතේ ඉන්ෆ්ලුවන්සා වසංගතය විමර්ශනය සාර්ථකව සම්පූර්ණ කිරීම.
- ආයතනික මට්ටමින් ඉන්ෆ්ලුවන්සා පැතිරීම අවම කිරීම මැයෙන් චක්‍රලේඛය නිකුත් කිරීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්**

**1. ප්‍රතිශක්තිකරණ ආවරණය**

ප්‍රධාන එන්නත් මඟින් වැලැක්විය හැකි රෝග සඳහා ප්‍රතිශක්තිකරණ ආවරණය 100% ක් වේ.

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| බී.සී.ජී.(BCG) | > 95% | > 95% | > 95% | > 95% |
| Pentavalent | > 95% | > 95% | > 95% | > 95% |
| ඩී. ටී. (DT) | > 95% | > 95% | > 95% | > 95% |
| සරම්ප (Measles) | > 95% | > 95% | > 95% | > 95% |

## 2. බෝවන රෝග ආවේක්ෂණය

වාර්තා කිරීමේ සම්පූර්ණත්වය (සියළු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (MOH) කාර්යාල විසින් වාර්තා කිරීම) - 100%

### 3.1.2 ක්ෂය රෝග හා ළය රෝග මර්ධන වැඩසටහන

ජාතික ක්ෂය රෝග හා ළය රෝග මර්ධන වැඩසටහන යටතේ ළය රෝග සම්බන්ධව විවිධ කාර්යයන් සිදු කෙරේ. නියමු දිස්ත්‍රික්ක (කළුතර, ගම්පහ සහ කෑගල්ල) තුළ පිහිටි රජයේ සෞඛ්‍ය ආයතනයන්හි රෝග විනිශ්චය සහ ප්‍රතිකාර සේවාවන් විමධ්‍යගත කිරීම, ජාතික ක්ෂය රෝග පිළිබඳ යොමුකිරීමේ රසායනාගාරය (National Tuberculosis Reference Laboratory) මඟින් රෝග විනිශ්චය සේවාවන් සිදු කිරීම, ප්‍රාදේශීය ක්ෂුද්‍රජීවීන් වගාකරීමේ රසායනාගාර, දිස්ත්‍රික් ලය සායන රසායනාගාර හා අණ්වීක්ෂක මධ්‍යස්ථාන , NPTCCD හි මධ්‍යම ඖෂධ ගබඩාව හරහා ඖෂධ ප්‍රසම්පාදනය, ළය රෝග සායන වෙත ක්ෂය රෝගයට එරෙහි ඖෂධ සැපයීම සහ බෙදා හැරීම, සෘජුව පරිපාලන සීමාවට යටත් වන ආයතනයන්ගේ යටිතල පහසුකම් සංවර්ධනය සහ මූල්‍ය කළමණාකරණය, දිස්ත්‍රික්ක මට්ටමින් ක්ෂය රෝගය මර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සහ ප්‍රදායක නියෝජිත ආයතන මඟින් ලබාගත් අරමුදල් හරහා මූල්‍යමය සහාය ලබා දීම, ක්ෂය රෝග සත්කාර කටයුතුවල යෙදෙන වෛද්‍ය සහ අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩල පුහුණු කිරීම, ක්ෂය රෝගය සහ අනෙකුත් ස්වසන රෝග මර්ධනය සඳහා ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම, ක්ෂය රෝග මර්ධන ක්‍රියාකාරකම්, ක්ෂය රෝග ආවේක්ෂණ ක්‍රියාකාරකම්, ක්ෂය රෝගය පිළිබඳ මහජන සහාය ලබා ගැනීමේ සන්නිවේදන කටයුතු සහ සමාජය එක්රැස් කිරීම එම කාර්යයන් වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ගම්පහ DCC හි ජෛව රසායන සහ රක්තවේද රසායනාගාරය නිම කිරීම සහ කුරුණෑගල DCC හි අළුත්වැඩියා කටයුතු.
- NPTCCD හි පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා දේශීය වශයෙන් පුහුණුව ලබාදීම.
- Gene - Xpert යන්ත්‍ර 12 ක්, ජංගම X-ray යන්ත්‍රයක් සහ ඩිජිටල් X-ray යන්ත්‍ර 17 ක් මිලදී ගැනීම
- NHSL සහ NSACP ඇතුළුව සෞඛ්‍ය ආයතනයන්හි සෙම එකතු කිරීමේ මධ්‍යස්ථාන 16 ක් ඉදිකිරීම.
- ඉලෙක්ට්‍රොනික දත්ත කළමණාකරණ පද්ධතියයක් සංවර්ධනය කිරීම සහ එය මෙහෙයවීම. දෘඩාංග ප්‍රසම්පාදනය නිම කිරීම සහ කොළඹ, කුරුණෑගල සහ මාතර දිස්ත්‍රික්කයන්හි මෙහෙයුම් කටයුතු නිම කිරීම.
- කොළඹ බන්ධනාගාර රැඳවියන් සඳහා ක්ෂය රෝග පරීක්ෂාවක් සිදු කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීම.
- ළදරු ක්ෂය රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීම පිළිබඳව 2018 අප්‍රේල් 23 සිට 27 දක්වා SAARC කලාපීය පුහුණු වැඩමුළුව පැවැත්වීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්**

| දර්ශකය | ඉලක්කය | | වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2015 | 2016 | 2017 | 2018 |
| ක්ෂය රෝගය වැළඳීමේ අනුපාතිකය | ජනගහනය 100,000 ට 60.7 | ජනගහනය 100,000 ට 56.3 | ජනගහනය 100,000 ට 44.5 | ජනගහනය 100,000 ට 40.9 | ජනගහනය 100,000 ට 39.0 | ජනගහනය 100,000 ට 40.1 |
| ක්ෂය රෝග ප්‍රතිකාරයන්හි සාර්ථකත්ව අනුපාතිකය | >90% | >90% | 83.2% | 84.1% | 84.6% | - |
| පසු විපරමේදී හානිවීමේ අනුපාතිකය (Loss to follow up rate) | <5% | <5% | 4.5% | 4.2% | 3.9% | - |
| ක්ෂය රෝග මරණ අනුපාතය | <5% | <5% | 6.9% | 6.8% | 7% | - |

### 3.1.3 ලාදුරු මර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාවේ ලාදුරු මර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීමේ ප්‍රමුඛස්ථානය දරනුයේ ලාදුරු මර්ධන ව්‍යාපාරයයි. ලාදුරු මර්ධන ක්‍රියාකාරකම් අධීක්ෂණය, ඇගයීම සහ විවිධ වැඩසටහන් දර්ශක භාවිත කරමින් " ජාතික ලාදුරු ක්‍රමෝපාය මාර්ග 2016 - 2020 " ක්‍රියාත්මක කිරීම එහි වගකීම වේ. එපමණක් නොව විවිධ වැඩසටහන් දර්ශක භාවිතා කරමින් " ජාතික ලාදුරු ක්‍රමෝපාය මාර්ග 2016 - 2020 " ක්‍රියාත්මක කිරීම පිළිබඳ ලාදුරු මර්ධන ක්‍රියාකාරකම් අධීක්ෂණය හා ඇගයීම, හවුල්කරුවන් සමඟ සම්බන්ධ ගොඩනඟා ගැනීම හා සම්බන්ධතා පවත්වාගැනීම සහ ලාදුරු වැඩසටහනෙහි ක්‍රියාකාරී සැලසුම් සම්බන්ධීකරණය සහ ඒ සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීම, ලාදුරු පිළිබඳව සියළුම කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ ලාදුරු මර්ධනය සම්බන්ධයෙන් ධාරිතා වර්ධනය, රෝග පරීක්ෂණ ක්‍රියාකාරකම් සහ රෝග කාරකයන් නිරීක්ෂණය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ලාදුරු වැලඳීමේ අවධානමක් සහිත විශේෂයෙන්ම අධිවසංගත තත්ත්වයක් සහිත දිස්ත්‍රික් ලෙස හඳුනාගෙන ඇති දිස්ත්‍රික්කයන්හි ජනතාව රෝග පරීක්ෂාවට ලක්කර කලින් රෝග හඳුනා ගැනීම හරහා රෝග පාලනය, ලාදුරු රෝගය නිසා ආබාධිත වූවන් පුනරුත්ථාපනය සඳහා විශේෂ අවධානය යොමු කරමින් සියළුම ලාදුරු රෝගීන්ට සේවා සැපයීම සහ චර්ම රෝග සායනවලට ප්‍රතිකාර සඳහා යොමුවන ලාදුරු රෝගීන්ට සැපයෙන සේවාවන්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මෙම ආයතනය මඟින් සිදු කෙරේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- 2018 වර්ෂයේදී අධිවසංගත ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් නිවෙස් සමීක්ෂණ 15 ක්, රෝග පරීක්ෂා කිරීමේ ක්‍රියාකාරකම් 65 ක් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් 51 ක් පවත්වන ලදී.

- රෝගීන් පිළිබඳ සිතියම්ගත කිරීමේ පද්ධතිය 2018 දී දිවයින පුරා ව්‍යාප්ත කරන ලදී.

- සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන් (MOOH), හෙද නිලධාරීන්, මහජන සෞඛ්‍ය රසායනාගාර කාර්මික නිළධාරීන් (PHLTs), මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHII), GPS සහ ආයුර්වේද

වෛද්‍යවරුන් ආදී සියළු රෝග නිවාරණ සහ ප්‍රතිකාරක සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

- කොළඹ මහ නගර සහා ප්‍රදේශය තුල ජංගම මාසික සායන පැවැත්වීම (2018 වර්ෂය තුළ විශේෂ සායන 11 ක් පවත්වන ලදී).

- 2018 දී චර්ම රෝග පිළිබඳ සායනයනවල සහ සැටලයිට් සායනවල ලාදුරු ප්‍රතිකාර සේවාවන්ගේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමේ විශේෂ ක්‍රියාකාරකම් (ත්‍රිකුණාමලය, මඩකලපුව, ගාල්ල, මාතර, අනුරාධපුරය, හම්බන්තොට, මොණරාගල, අම්පාර, කල්මුණේ, යාපනය, මන්නාරම සහ බදුල්ල දිස්ත්‍රික්කයන්)

- දිස්ත්‍රික් සමාලෝචනයක් සිදු කරමින් 2018 වර්ෂය තුළ කුරුණෑගල, නුවර, මාතලේ, හම්බන්තොට, නුවරඑළිය සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්ගේ ලාදුරු මර්දන ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම.

- ජපානයේ NIID හි ලාදුරු පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ සහයෝගීත්වයෙන් DNA/PCR පරීක්ෂණය සිදුකිරීම ආරම්භ කිරීම.

- 2019 - 2020 දී පැවැත්වීමට නියමිත " Social Marketing Campaign " සඳහා 2018 දී KAP අධ්‍යයනය නිම කිරීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්**

| දර්ශකය | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| හඳුනාගත් නව රෝගීන් සංඛ්‍යාව | 1977 | 1832 | 1873 | 1683 |
| NCDR (පුද්ගලයන් 100,000ට) | 9.4 | 8.6 | 8.9 | 8.03 |
| ළමුන්ගේ ප්‍රතිශතය | 11.3 | 8.6 | 10.4 | 9.74 |
| විකලත්වයට පත් ප්‍රතිශතය | 10 | 7.5 | 7.3 | 6.5 |
| MB ප්‍රතිශතය | 53.8 | 53.5 | 57.8 | 61 |

### 3.1.4 නිරෝධායන සේවාවන්

අන්තර්ජාතික සෞඛ්‍ය රෙගුලාසි (IHR) - 2005 සම්බන්ධයෙන් WHO සංවිධානය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමේදී ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාතික සම කේන්ද්‍රීය අංශයක් ලෙස කටයුතු කිරීම, දේශසීමා සෞඛ්‍ය සුරක්ෂිතතාවය සහ IHR - 2005 ට අදාලව ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම, ප්‍රවේශ ස්ථානයන්ගේ (වරාය හා ගුවන් තොටුපළ) පිහිටි මහජන සෞඛ්‍ය කාර්යාලයන්හි ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ මෙහෙයවීම, ප්‍රවේශ ස්ථානයන්හි (POEs) වරාය / ගුවන්තොටුපළ කාර්ය මණ්ඩලය සඳහා තාක්ෂණික මාර්ගෝපදේශ සැපයීම, බඩු මලු, භාණ්ඩ තොග, පහාලුම්, වාහන, භාණ්ඩ, තැපැල් මලු, හා මිනිසුන්ගේ අපද්‍රව්‍ය හෝ සනීපාරක්ෂක ද්‍රව්‍ය ආදිය විවිධ විෂකාරකවලින් දූෂිතවීම වැලැක්වීම සඳහා නැව් හා භාණ්ඩ පරීක්ෂා කිරීම, එම භාණ්ඩ ආසාධනය හෝ දූෂිතවීමේ ප්‍රභවයන්ගෙන් තොරව පවත්වා ගැනීම, වාහකයන් හා බෝවන ස්ථාන ඇතුලුව, මීයන් නොමැතිබව, වසංගත රෝගබීජ සඳහා බෙහෙත් යෙදීම, කෘමි ආසාධන නොමැති බව, කෘමි හානි නොමැතිවීම හෝ දූෂිතවී නොමැති බව අධීක්ෂණය කිරීම, නැව් / ගුවන් යානා පරීක්ෂා කිරීම හා රෝගීන්ගෙන් තොර බවට සහතික කර අවසරපත් ලබාදීම, බලයලත් වරායන්හි පිහිටි වරාය සෞඛ්‍ය නිළධාරි කාර්යාල මඟින් නැව් සනීපාරක්ෂක සහතික පත්‍ර නිකුත් කිරීම, වරායවල්වලට ඇතුලුවන ස්ථානවලදී පාරිසරික සනීපාරක්ෂාව සහ වාහක මර්ධනය සහතික කිරීම, කහ උණ එන්නත, මගීන්

සඳහා මුඛ පෝලියෝ එන්නත, meningococcal එන්නත හා ප්‍රති-මැලේරියා (Anti-Malaria Prophylaxix) යන එන්නත් සහකාර වරාය සෞඛ්‍ය කාර්යාල හරහා වෛද්‍ය පර්යේෂණායතනයේදී ලබාදීම, ප්‍රවේශ ස්ථානයන්හි (POEs) දී අන්තර්ජාතික සෞඛ්‍ය රෙගුලාසි සම-ධාරිතාවයන් පාලනය කිරීම, IHR-2005 ක්‍රියාත්මන කිරීම, නිරෝධායන පනත, ආහාර පනත, නාටා, පීඩාකාරී (Nuisance) පනත හා අනෙකුත් අදාල පනත් අධීක්ෂණය, දේශසීමා සෞඛ්‍ය සුරක්ෂිතතාවය සහ IHR – 2005 පිළිබඳ මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, දිගු කාලයක් රැඳී සිටීමට වීසා අපේක්ෂිත අයදුම්කරුවන් සඳහා සීමිත සෞඛ්‍ය ඇගයීමේ ක්‍රම වේදයක් ස්ථාපිත කරමින් ආගමන සෞඛ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- නිරෝධායන ඒකකය සහ වරාය හා ගුවන්තොටුපළ යන ස්ථානයන්හි පිහිටි මහජන සෞඛ්‍ය කාර්යාල සඳහා උපකරණ මිලදී ගැනීම.
- ත්‍රිකුණාමලය වරායෙහි පිහිටි සෞඛ්‍ය කාර්යාලයෙහි ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම.
- සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන කාර්ය මණ්ඩලය සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම.
- ප්‍රවේශ ස්ථානයන්හි සම්මත මෙහෙයුම් පටිපාටිය සංශෝධනය කිරීම හා මුද්‍රණය කිරීම.
- IHR මෙහෙයුම් කමිටු රැස්වීම් හා සමාලෝචන රැස්වීම පැවැත්වීම සහ නිරෝධායන පනත පිළිබඳ රැස්වීම් පැවැත්වීම.
- මාර්ගගත තොරතුරු කළමණාකරණ පද්ධතියක් සකස් කිරීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්**

| දර්ශකය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| අන්තර්ජාතික සෞඛ්‍ය රෙගුලාසීන්හි මධ්‍ය ධාරිතා දර්ශකය | 79% | 76% | - |
| කහ උණට එරෙහිව එන්නත් කර ඇති සංචාරකයින් සංඛ්‍යාව | 4,830 | 4,126 | 4,724 |
| නැව් සනීපාරක්ෂක සහතිකය සඳහා පරීක්ෂාවට ලක් කරන ලද නැව් සංඛ්‍යාව | 340 | 340 | 352 |

## 3.2 රෝග වාහකයින් මඟින් ආසාදනය වන රෝග මර්ධනය

### 3.2.1 ඩෙංගු මර්ධන වැඩසටහන

ඩෙංගු රෝගයෙන් සිදුවන මරණ සහ ව්‍යාධි අවම කිරීමට ජාතික ඩෙංගු මර්ධන ඒකකය විසින් ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඩෙංගු රෝගය වැලැක්වීම හා පාලනය සම්බන්ධයෙන් රෝගීන් කලින් හඳුනා ගැනීම වඩා ශක්තිමත් කිරීම, පූර්ව ක්‍රියාකාරී රෝග කළමණාකරණය, ඒකාබද්ධ රෝග වාහක මර්ධනය හා 2017 ජූනි මස දියත් කරන ලද ප්‍රජාව සවිබලගැන්වීම යනාදි ක්‍රියාකාරකම් ඇතුලත් වේගවත් ඩෙංගු වැලැක්වීමේ හා මර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම . මෙම වැඩසටහන මඟින් අංශයන් අතර සම්බන්ධීකරණය හා සමාජ සේවයෙහි යෙදවීම, අවධානම් පිළිබඳ සන්නිවේදනය සහ රෝග ව්‍යාප්තිය සඳහා ප්‍රතිචාර දැක්වීම, සාක්ෂි මත පදනම් වූ සායනික සත්කාර සේවා, robust ඩෙංගු ආවේක්ෂණය සහ නව පර්යේෂණ ආදී බොහෝ කාර්යයන් සිදු කරන ලදී.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ඩෙංගු රෝගය ඇතිවීමේ සහ ඩෙංගු රෝගීන්ගේ මරණ අනුපාතිකය අඩුවීම.
- වාහක මර්ධන ක්‍රියාකාරකම් සඳහා සෞඛ්‍ය කාර්ය සහායකයින් බඳවා ගැනීම.
- සියළුම දැඩි අවධානම් දිස්ත්‍රික්කයන් තුළ අධිපරායත්ත ඒකක (HDU) ස්ථාපිත කිරීම (පළාත් අධ්‍යක්ෂකවරුන් සහ උපකරණ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම).

**ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| සිදුවීම් සංඛ්‍යාව (Incidence) | 2023 වන විට <100/ 100,000 | 260/ 100,000 | 868/ 100,000 | 240/100,000 (යාවත්කාලීන කෙරෙමින් පවතී) |
| රෝගීන්ගේ මරණ අනුපාතිකය (Case Fatality Rate) | 2023 වන විට <0.1 | 0.17 | 0.21 | 0.11 (යාවත්කාලීන කෙරෙමින් පවතී) |
| පූර්වාවයව දර්ශකය (Premise Index) | 2023 වන විට <1% | 6.84% | 9.68% | 8.8 (යාවත්කාලීන කෙරෙමින් පවතී) |
| Breteau Index | 2023 වන විට <1% | 8.86% | 11.67% | 10.1 (යාවත්කාලීන කෙරෙමින් පවතී) |
| පවත්වන ලද පූර්වාවයව අධීක්ෂණ වැඩසටහන් සංඛ්‍යාව (අධීක්ෂණය කරන ලද පූර්වාවයව සංඛ්‍යාව මිලියනවලින්) | | 18 (2.3) | 20 (2.7) | 12 (1.5) |

### 3.2.2 බරවා මර්ධන වැඩසටහන

බරවා මර්ධන වැඩසටහන මඟින් බරවා පරපෝෂිතතා ආවේක්ෂණය ශක්තිමත් කිරීම සහ ප්‍රතික්‍රියක රෝගීන් හඳුනා ගැනීම, කීට විද්‍යාත්මක ආවේක්ෂණය සහ ප්‍රතිචාර දැක්වීම ශක්තිමත් කිරීම, රෝග ව්‍යාධි තත්ත්ව කලමණාකරනය හා ආබාධිතතාවය වැළැක්වීම, උපදේශනය, සන්නිවේදනය හා සමාජ බලමුළු ගැන්වීම, මෙහෙයුම් පර්යේෂණවල නියුක්තවීම, ගුණාත්මකභාවය පාලනය සහ ඇගයීම වැඩි දියුණු කිරීම මෙන්ම මෙහෙයුම හා ඇගයීම යන ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාව තුල සිදුකරන ලදී.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ආවේක්ෂණයේදී භාවිතා කෙරෙන ශිල්පීය ක්‍රම ප්‍රමිතිගත කිරීම සඳහා පරපෝෂිතතාව හා කීට විද්‍යාඥාත්මක මාර්ගෝපදේශ ඇති කිරීම සහ සම්මත මෙහෙයුම් ක්‍රමවේද සකස් කිරීම.

- ගාල්ල දිස්ත්‍රික්කයේ වැඩිම අවදානමක් සහිත සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි (MOH) ප්‍රදේශයන්හි (බලපිටිය, හබරාදුව) වැඩි දියුණු කරන ලද පරපෝෂිතතා ආවේක්ෂණය සහිත Xenomonitoring (මදුරු ආවේක්ෂණය) ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම.

- සංක්‍රමණික ඉන්දියානු ශ්‍රමිකයින් අතරින් සක්‍රීය බරවා ආසාදනය සහිත රෝගීන් 30 ක් හඳුනා ගැනීම (මුළු රෝගීන් සංඛ්‍යාවෙන් 21 % ක්) .

- පාසල් ළමුන් සඳහා බරවා රෝගය පිළිබඳව පොත් පිංචක් නිර්මාණය කිරීම හා මුද්‍රණය සහ වසංගත දිස්ත්‍රික්කයන්හි ජීවත්වන පාසල් ළමුන් සඳහා ප්‍රාදේශීය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- ත්‍රිකුණාමලය, මොණරාගල, අනුරාධපුරය සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක හතරෙහි සමීක්ෂණයන් පැවැත්වූ අතර අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් (තිරප්පනේ MOH ප්‍රදේශයෙන්) එක් බරවා රෝගියෙක් හඳුනා ගන්නා ලදී.

- මුහුණු පොත (face book) ඇතුළුව සන්නිවේදන ව්‍යාපාරයක් දියත් කිරීම, වර්තමාන අභියෝග සම්බන්ධයෙන් අත්පත්‍රිකා හා පෝස්ටර් නිර්මාණය කිරීම සහ මුද්‍රණය කිරීම, ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ජනමාධ්‍ය භාවිතා කිරීම (රූපවාහිනී හා ගුවන්විදුලි සජීවී වැඩසටහන්), දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වීඩියෝ පටයක් නිර්මාණය කිරීම සහ සන්නිවේදන අවභාවිතය වැලැක්වීම සඳහා මුහුණු පොත හා ප්‍රාදේශීය මාධ්‍යවල කෙටි වැඩසටහන් ප්‍රචාරය කිරීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| ක්ෂුද්‍ර බරවා අනුපාතිකය (Microfilaria rate) | 2021 වන විට | 0.06 | 0.04 | 0.02 |
| ක්ෂුද්‍ර බරවා ඝනත්වය (Microfilaria density) | 2021 වන විට | 355.48 | 316.87 | 281.42 |
| ආසාදිත අනුපාතිකය (Infected rate) | 2021 වන විට | 0.85 | 0.77 | 0.93 |
| ආසාධනයවීමේ අනුපාතිකය (Infective rate) | 2021 වන විට | 0.01 | 0.03 | 0.03 |

### 3.2.3 මැලේරියා මර්ධන වැඩසටහන

2016 වර්ෂයේදී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාව මැලේරියා රෝගයෙන් තොර රටක් ලෙස සහතික කරන ලද අතර කිසිදු ස්වදේශික මැලේරියා රෝගියෙකු වාර්තා නොවීම මත එම තත්ත්වය අඛණ්ඩව පවත්වා ගෙන ඇත. මැලේරියා මර්ධන ව්‍යාපාරය (AMC) ශ්‍රී ලංකාව තුළ නැවත මැලේරියා රෝගය ඇතිවීම වැළැක්වීම සහ මැලේරියා මරණ අනුපාතිකය ශුන්‍ය අගයක පවත්වාගෙන යාමට තම ඉලක්ක සකස් කර තිබුණි. 2018 දෙසැම්බර් මස මෙරටදී හඳුනාගත් මැලේරියා රෝගියා හැරුණු කොට 2012 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකාව ස්වදේශික මැලේරියා රෝගීන්ගෙන් තොර වූ අතර 2007 වර්ෂයේ සිට මැලේරියා මරණ අනුපාතිකය ශුන්‍ය අගයේ පවත්වාගෙන යනු ලැබේ.

කෙසේ වුවද, අවදානම් සහිත ජන කොටස් සිටීම සහ මේ වන විටද ග්‍රාහකත්වය (receptivity) ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ නැවත මැලේරියා රෝගය හටගැනීමේ දැඩි අවදානමක් පවතී. විදේශ රටවලදී මැලේරියා රෝගය වැළඳී මෙරටට පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සහ විදේශිකයින් යන දෙපාර්ශවය මඟින්ම නිතරම සිදුවන අන්තර්ජාතික සංක්‍රමණ හරහා මැලේරියා රෝගයද නැවත මෙරටට සංක්‍රමණය වීමේ විශාලතම තර්ජනය මතුවී ඇත. මෙම රෝගය පතුරුවාලන වාහක

මදුරුවන්ද මෙරට සුලභ අතර නගරාශ්‍රිතව බෝවිය හැකි නව මැලේරියා මදුරුවකු උතුරු නැගෙනිර පළාත්හි ඇතැම් දිස්ත්‍රික්කයන් තුළ හඳුනා ගෙන ඇත.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- මැලේරියා මර්ධන ව්‍යාපාරය මැලේරියා රෝගීන් කළමනාකරණය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම සෞඛ්‍ය ආයතන වෙත නොමිලේ මැලේරියා රෝග විනිශ්චය කිරීමේ සහ ප්‍රතිකාර කිරීමේ කඩිනම් පහසුකම් ලබාදීම මඟින් තම කඩිනම් සේවාවන් පුළුල් කර ඇත.

- රටතුළ මැලේරියා රෝගය පැතිරීම නැවැත්වීම සඳහා මැලේරියා මර්ධන ව්‍යාපාරය විසින් වැඩි අවදානම් සහිත කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් දුර බැහැර ප්‍රදේශයන්හි ජංගම සායන පැවැත්වීම. රෝහල්හි අක්‍රීය ආවේක්ෂණය සහ ලේ බැංකු රුධිර පරීක්ෂාවන් ඇතුළුව රුධිර පරීක්ෂාවන් මිලියනයකට අධික සංඛ්‍යාවක් සිදු කර ඇත.

- මැලේරියා වසංගත සහිත සහිත රටවල සංචාරයේ යෙදෙන ශ්‍රී ලාංකිකයින් සඳහා ඔවුන්ගේ විදෙස් සංචාර තුලදී මැලේරියා රෝගය බෝ වීමෙන් වැළකීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙන්ම ප්‍රතිකාර ද මැලේරියා මර්ධන ව්‍යාපාරය විසින් නොමිලේ ලබා දෙන ලදී.

- මාසිකව දිවයින පුරා ස්ථාන 30කදී සාමාන්‍ය ආරක්ෂිත ස්ථාන ආවේක්ෂණය පවත්වන ලදී. ආරක්ෂිත අධ්‍යයනය සඳහා උපකාරක වශයෙන් කාර්තුමය සාමාන්‍ය අධ්‍යයනයන් ස්ථාන 50 කදී සිදුකරන ලදී.

## 3.3 බෝ නොවන රෝග පාලනය

### 3.3.1 ජාතික පිළිකා මර්ධන වැඩසටහන

ජාතික පිළිකා මර්ධන වැඩසටහන විසින් පහත කාර්යයන් ඉටු කරනු ලැබේ. මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම හා මහජනතාව බලගැන්වීම මඟින් අවදානම් සාධක සහ පිළිකා සඳහා තුඩුදෙන සාධක කෙරෙහි සැලකිල්ලක් දක්වමින් ප්‍රධාන වශයෙන්ම පිළිකා ඇතිවීම වැළැක්වීම, මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම තුළින් සහ අදාල සේවා සපයන්නන් මඟින් විශේෂයෙන්ම පූර්ව සත්කාර සපයන්නන් හරහා පිළිකා කල් තබා හඳුනා ගැනීමට උපදෙස් ලබා දීම. කල්තබා සායනික රෝග විනිශ්චයන්ට එළඹිය හැකි පරිදි රෝග ලක්ෂණ සහිත පුද්ගලයින් පරීක්ෂාවට ලක් කිරීම සහ පිළිකා රෝගය බවට සායනික වශයෙන් සැක කෙරෙන අවස්ථාවන්හිදී එම ලක්ෂණ සහිත පුද්ගලයින් ඉක්මණින් රෝග විනිශ්චය කරා යොමු කිරීම, පිළිකා රෝගය සම්බන්ධයෙන් රෝග විනිශ්චය සහ ප්‍රතිකාර පහසුකම් සඳහා අඛණ්ඩ සහ සම- ප්‍රවේශයක් සහතික කිරීම, පිළිකා රෝගීන් සඳහා පුනරුත්ථාපන, රෝගයෙන් නැගී සිටීමේ සහ සහන සත්කාර පහසුකම් සහතික කිරීම සහ සියළු මට්ටම්වල පිළිකා රෝගීන් රැක බලාගන්නන් සඳහා ආධාර කිරීම, පිළිකා තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම, පිළිකා මර්ධන ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිඵල සම්බන්ධ ප්‍රගතිය අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආවේක්ෂණය ශක්තිමත් කිරීම, පුහුණු මානව සම්පත් වර්ධනය කිරීම සඳහා වෛද්‍යවරුන්ගේ, හෙද නිලධාරීන්ගේ, තාක්ෂණ ශිල්පීන්ගේ සහ සෞඛ්‍ය සේවකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම, පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ පර්යේෂණ සොයා ගැනීම් පිළිකා වැළැක්වීම සහ මර්ධනය සඳහා උපයෝගී කර ගැනීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- සාමාන්‍ය පිළිකා පිළිබඳ ප්‍රාථමික සත්කාරක සේවා වෛද්‍යවරුන් සඳහා මාර්ගෝපදේශ සහ රෝගීන් විශේෂඥ වෛද්‍යවරුන් කරා යොමු කිරීමේ ක්‍රමවේද සකස් කිරීම.

- ප්‍රාථමික සත්කාරක සේවා වෛද්‍ය නිලධාරීන් සහ හෙද නිලධාරීන් සඳහ සහනදායී සත්කාර (Palliative Care) ලබාදීම පිළිබඳ මාර්ගෝපදේශ පොත් කෙටුම්පත් කිරීම.

- පිළිකා වේදනාවන් කළමනාකරණය මැයෙන් කුඩා පොතක් සකස් කිරීම හා මුද්‍රණය, මුඛ පිළිකා කළමනාකරණය සඳහා ජාතික මාර්ගෝපදේශ, මුඛ හා සම්බන්ධ උග්‍ර ආබාධ (OPMD) / මුඛ පිළිකා සඳහා අධි අවදානම් රෝගීන් හඳුනා ගැනීමට හා එම ජනතාව පිළිබඳ සොයා බලන පවුල් සෞඛ්‍ය සේවිකාවන්/ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් චක්‍රලේඛය සහ අදාල තොරතුරු ලබා ගැනීම.

- මුඛය ආශ්‍රිතව ඇතිවිය හැකි දුස්සාධ්‍ය සංකූලතා (Oral Potentially Malignant Disorders) පිළිබඳ ජාතික මාර්ගෝපදේශ සංශෝධනය කිරීම සහ මුද්‍රණය කිරීම.

- රෝහල් පරිශ්‍ර සහ සියළුම වෙනත් සෞඛ්‍ය සේවා ආයතන තුල බුලත් විට සැපීම, බුලත් විට විකිණීම, දුම්කොළ සහ පුවක් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය තහනම් කිරීම පිළිබඳ චක්‍රලේඛය මුද්‍රණය කර බෙදා හැරීම.

- ප්‍රාථමික සෞඛ්‍ය සේවා (PHC) කාර්ය මණ්ඩලය සඳහා පිළිකා මර්ධනය පිළිබඳ අත්පොතෙහි පළමු කෙටුම්පත සකස් කිරීම, සම්මත මෙහෙයුම් පටිපාටියට අනුව පිළිකා ලියාපදිංචි කිරීම සඳහා අත්පොතක් නිර්මාණය කිරීම සහ පිළිකා ආවේක්ෂණ පෝරමය මුද්‍රණය කිරීම.

- සහනදායී සත්කාරක සේවා (Palliative Care) පිළිබඳ ජාතික ක්‍රමෝපායික කාලරාමුව එළිදැක්වීම.

- පිළිකා ආවේක්ෂණය සඳහා ICD - 0 අත්පොත් සහ අවස්ථාගත කිරීමේ අත්පොත් (Staging manuals) මිලදී ගැනීම.

- මහරගම ජාතික පිළිකා ආයතනයේ පිළිකා සහිත තරුණ පුද්ගලයින්ගේ, රැකබලාගන්නන්ගේ සහ ඔවුන්ගේ දරුවන්ගේ මානසික- සාමාජික අවශ්‍යතාවන් සහ මානසික පීඩාකාරීත්වය සහ ඔවුන්ගේ භාවාත්මක සහ තොරතුරු අවශ්‍යතාවයන් සඳහා මැදිහත්වීමෙහි බලපෑම පිළිබඳ පර්යේෂණයක් සිදු කිරීම, " ශ්‍රී ලංකාවේ කාන්තා පියයුරු පිළිකා රෝගයෙන් මරණයට පත් නොවී ජීවත්වන්නන්ගේ ගුණාත්මකව ජීවත්වීමේ අවුරුදු ගණන පිළිබඳ සත්කාර මාර්ගයන්ගේ, ප්‍රමාදවීම් සහ ප්‍රමාදයන්ගේ බලපෑම " පිළිබඳ පර්යේෂණයෙහි දත්ත රැස්කිරීමේ පියවර අවසන් කිරීම.

- OPMD/ මුඛ පිළිකා වැළැක්වීම සහ පරීක්ෂා කිරීම පිළිබඳව ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් (RDSs) සඳහා පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම, දිස්ත්‍රික්ක 23 ක් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර කාර්ය මණ්ඩලය සඳහ පිළිකා මර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු සහ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා මුඛ පිළිකා වැලැක්වීම හා මර්ධනය පිළිබඳ පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන ඉන්දියාවේදී පැවැත්වීම සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා

සහනදායී ප්‍රතිකාරක සේවා (Palliative Care) පිළිබඳව පුහුණු වන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් හා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- ජාතික පිළිකා මර්ධන වැඩසටහනෙ (NCCP) හි පිළිකා ලියාපදිංචි කිරීමේ කාර්ය මණ්ඩලය මහරගම ජාතික පිළිකා ආයතනයෙහි සංඛ්‍යාලේඛන අංශයේ කාර්යමණ්ඩලය සහ පිළිකා මර්ධන වැඩසටහන්වල යෙදී සිටින පර්යේෂකයින් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

- කොරියාවේ සෝල් නගරයේ පැවති පිළිකා මර්ධනය සඳහා වූ පස්වන නායකත්ව වැඩමුළුව සඳහා සහභාගීවීම.

- තායිලන්තයේ බුරපා විශ්වවිද්‍යාලයෙහි පවත්වන ලද මධ්‍යම මට්ටමේ කළමණාකරුවන් සඳහා වූ සැලසුම් සහ කළමනාකරණ වැඩසටහන, පිළිකා වැළැක්වීම සහ මර්ධනය පිළිබඳ චීනයේ පැවති ආසියානු-පැසිපික් පුහුණු පාඨමාලාව, මන්දපෝෂණයෙහි ද්විත්ව පීඩාකාරීභාවය පිළිබඳ ඔස්ට්‍රියාවේ වියානා නගරයේ පැවති ජාත්‍යන්තර සංසදය යනාදිය සඳහා සහභාගීවීම.

- කුඩා පොත්, අත්පත්‍රිකා සහ වෙනත් අධ්‍යාපනික ද්‍රව්‍ය නිර්මාණය කිරීම සහ මුද්‍රණය කිරීම (සාමාන්‍ය පිළිකා මුල් අවධියේදීම වළක්වාගැනීම සහ පූර්ව හඳුනා ගැනීම පිළිබඳව සියළුම භාෂාවන්ගෙන් සමන්විත පත්‍රිකා, පෝස්ටර්, ෆ්ලෙක්ස් බැනර් සහ බිත්ති පුවරු සකස් කිරීම සහ " වාහන නැවතීම තහනම්" යනුවෙන් සඳහන් වන පුවරුවල අධ්‍යාපනික පණිවුඩ ප්‍රදර්ශනය කිරීම)

- ජනමාධ්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම්, මාධ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම (හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා ලෝක දිනය සහ පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ ලෝක මාසය) ලෝක පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය තුළ පියයුරු පිළිකා වැළැක්වීම සහ පූර්ව හඳුනා ගැනීම පිළිබඳ ජනමාධ්‍ය, රූපවාහිනී, ගුවන්විදුලි දැන්වීම් ප්‍රචාරය කිරීම.

- ජාතික පිළිකා මර්ධන වැඩසටහන (NCCP) හි ප්‍රතිකාර සහ සැලසුම් ඒකකය සඳහා නව ජංගම ප්‍රදර්ශන ඒකකයක්, හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල සඳහා Chemotherapy isolator යන්ත්‍රයක්, අනුරාධපුර ශික්ෂණ රෝහල සඳහා Endoscopy ඒකකයක්, බදුල්ල පළාත් මහ රෝහල සඳහා Contaminating monitors සහ Movable lead shield barrier, අපේක්ෂා රෝහල සඳහා Colposcopy යන්ත්‍රයක්, NCCP කාර්යාලය සහ පිළිකා කල් තබා හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය වෙනත් උපකරණ සහ උපාංග (පරිගණක, වෙනත් තොරතුරු තාක්ෂණය සහ සන්නිවේදන උපකරණ, මහජන ඇමතුම් පද්ධතියක් සහ ලී බඩු) මිලදී ගැනීම.

- NCCP හි පරිගණක ජාලය සහ අභ්‍යන්තර දුරකථන පද්ධතිය වැඩිදියුණු කිරීම.

- වතු අංශයේ සෞඛ්‍ය පරිපාලකයන් සමඟ මුඛ පිළිකා පිළිබඳ කැගල්ල දිස්ත්‍රික්කයේ සමාලෝචන රැස්වීම් පැවැත්වීම, දිස්ත්‍රික් 19 ක පිළිකා මර්ධන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීමට දිස්ත්‍රික්ක් මට්ටමේ සමාලෝචන රැස්වීම් පැවැත්වීම, පිළිකා වැළැක්වීම සහ මර්ධනය පිළිබඳ ජාතික උපදේශක කමිටු රැස්වීම්, සහනදායී සත්කාර පිළිබඳ ජාතික මෙහෙයුම් රැස්වීම්, HOI සහ පිළිකා පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

- පෞද්ගලික සෞඛ්‍ය ආයතනයන්හි පිළිකා ආවේක්ෂණ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා පෞද්ගලික සෞඛ්‍ය අංශය නියාමනය කිරීමේ ආයතනය සහ අදාල අධ්‍යයන විද්‍යාල සමඟ රැස්වීම් දෙකක් පැවැත්වීම, පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහා අධීක්ෂණ චාරිකා- කුරුණෑගල

රෝහල, ජනගහණ පාදක පිළිකා ආවේක්ෂණය පිළිබඳ මරණ රෙජිස්ට්‍රාර්වරුන් සහ වෛද්‍ය ලේඛණ නිළධාරින් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් දෙකක් පැවැත්වීම, ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ වෙනත් සෞඛ්‍ය කාර්යමණ්ඩලය, වෙනත් පාර්ශ්වනරුවන් සමඟ වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, " ශ්‍රී ලංකාව තුළ පියයුරු පිළිකා රෝගය අඩුකර ගැනීම - ඉදිරි මඟ" පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් පැවැත්වීම.

- සෞඛ්‍ය කාර්ය මණ්ඩලය විසින් පිළිකා මර්ධනය සහ සහනදායී සත්කාරක සේවා සැපයීම වෙනුවන් කරන ලද ක්‍රියාකාරකම් ඇගයීමට හා පැසසුමට ලක් කිරීම සඳහා "පිළිකා මර්ධනය සහ සහනදායී සත්කාර සේවා සැපයීම සම්බන්ධයෙන් වඩාත් ඵලදායි ක්‍රියාකාරකම් පිළිබඳ ජාතික සංසදය" මැයෙන් සමුළුවක් (symposium) පැවැත්වීම.

- 2011 සහ 2014 වර්ෂවල පිළිකා ඇතිවීම පිළිබඳ දත්ත විශ්ලේෂණය සහ ප්‍රකාශයට පත් කිරීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| පිළිකා සිද්ධි පිළිබඳ දත්ත ප්‍රකාශයට පත් කිරීම | " පිළිකා සිද්ධි පිළිබඳ දත්ත" ප්‍රකශයට පත් කර තිබීම වර්තමාන වර්ෂයේ සිට වර්ෂ 3 ක් නොඉක්මවා තිබිය යුතුය | 2010 වර්ෂයේ පිළිකා සිද්ධි පිළිබඳ දත්ත ප්‍රකාශයට පත් කරන ලදී | - | 2011 වර්ෂයේ පිළිකා සිද්ධි පිළිබඳ දත්ත සම්පූර්ණ කරන ලද අතර 2014 අන්තර් වාර්තාව සම්පූර්ණ කර ඇත |
| ජාතික උපදේශක කමිටු රැස්වීම පැවැත්වීම | වසරකට රැස්වීම් හතරක් පැවැත්වීම (කාර්තුවකට 1 බැගින්) | රැස්වීම් 3 ක් පවත්වන ලදී. | රැස්වීම් 3 ක් පවත්වන ලදී. | රැස්වීම් 3 ක් පවත්වන ලදී. |
| දිස්ත්‍රික් සමාලෝචන රැස්වීම් පැවැත්වීම | වසරකට රැස්වීම් 26 පැවැත්වීම(දිස්ත්‍රික්ක යකට 1 බැගින්) | සමාලෝචන 2 ක් පවත්වන ලදී. | සමාලෝචන 18 ක් පවත්වන ලදී. | සමාලෝචන 19 ක් පවත්වන ලදී. |
| සාමාන්‍ය පිළිකා සඳහා නිවැරදි මාර්ගෝපදේශ හා යොමු කිරීමේ ක්‍රමවේද සකස් කිරීම. | සාමාන්‍ය පිළිකා සඳහා මාර්ගෝපදේශ හා යොමු කිරීමේ ක්‍රමවේද ලබා ගැනීමට හැකි වීම. | OPMD කළමනාකරණ මාර්ගෝපදේශ ලබා ගත නොහැකිවීම. | Colorectal, තයිරොයිඩ් පිළිකා හා පියයුරු පිළිකා සම්බන්ධ මාර්ගෝපදේශ සකස් කිරීම හා සංශෝධනය කිරීම. | ගලනාල හා වෘෂණ කෝෂ සම්බන්ධ මාර්ගෝපදේශ හා යොමු කිරීමේ ක්‍රමවේද සකස් කිරීම, සාමාන්‍ය කාන්තා ප්‍රජනක පද්ධතිය ආශ්‍රිත පිළිකා සම්බන්ධ මාර්ගෝපදේශ සංශෝධනය, මුඛ පිළිකා පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම, OPMD සහ මුඛ පිළිකා සම්බන්ධ යොමු කිරීමේ ක්‍රමවේද ප්‍රකාශයට පත් කර තිබීම. |

### 3.3.2 මානසික සෞඛ්‍ය සේවා

මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂක අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ : ප්‍රමුඛතාව ලබාදියයුතු මානසික සෞඛ්‍ය සේවා සම්බන්ධයෙන් වැදගත් වන විවිධ පරාසයන් පිළිබඳව ප්‍රතිපත්ති සාදන්නන් දැනුවත් කිරීම, මානසික සෞඛ්‍ය හා සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හෝ සංශෝධනය කිරීම, මානසික සෞඛ්‍යය, මධ්‍යසාර සහ මත් ද්‍රව්‍ය භාවිතය, සියදිවි නසා ගැනීම් සහ මෙම අංශය යටතට ගැනෙන වෙනත් අදාල විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ක්‍රමෝපායික සැලසුම් සකස් කිරීම, මානසික සෞඛ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය සහාය සහ උපදෙස් ලබා දීම, මානසික සෞඛ්‍යය පිළිබඳ මධ්‍ය කාලීන සහ වාර්ෂික සැලසුම් සකස් කිරීම සහ මානසික සෞඛ්‍යයට අදාල පළාත් / දිස්ත්‍රික් සංවර්ධන සැලසුම් සකස් කිරීම. රජයේ අමාත්‍යාංශ, වෘත්තීය ආයතන, පෞද්ගලික සංවිධාන, සංවර්ධන හවුල්කරුවන්, සිවිල් සමාජ සහ පාරිභෝගික කණ්ඩායම් තුළ සහ අතර සහයෝගීත්ව ජාලයක් ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම, වැඩසටහන් සඳහා විශේෂිත IEC/ පුහුණු ද්‍රව්‍ය දියුණු කිරීම, සේවාස්ථ සහ පශ්චාත් උපාධි මට්ටමින් අදාල කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය කිරීම, හදිසි අවස්ථාවන්හිදී ව්‍යසන සහ විශේෂ අවස්ථාවන්හිදී මනෝ විද්‍යාත්මක ප්‍රථමාධාර සහ මානසික සෞඛ්‍ය සේවාවන් සැපයීම සහතික කිරීම, මධ්‍යම මට්ටමෙහි මානසික සෞඛ්‍ය වැඩසටහන් අධීක්ෂණය කිරීම සහ ඇගයීම, වැඩසටහන් හා සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම සඳහා මානසික සෞඛ්‍ය පිළිබඳ යාවත්කාලීන දත්ත පද්ධතියක් පැවතීම සහතික කිරීම, විමර්ශනයක් සහ මෙහෙයුම් පර්යේෂණ අවශ්‍ය විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳව දිස්ත්‍රික් 05 ක ප්‍රාථමික සෞඛ්‍ය කාර්යමණ්ඩලය පුහුණු කිරීම.
- සේවා ස්ථානයන්හි මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රාථමික වෛද්‍ය සත්කාර ආයතනවල මානසික සෞඛ්‍ය සත්කාර සැපයීම සඳහා සම්මත පැකේජයක් සකස් කිරීම.
- පාසල් ළමුන් අතර මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සහ ළමා මානසික සෞඛ්‍ය පිළිබඳව මානසික සෞඛ්‍ය වෘත්තිකයින් සඳහා වැඩමුළු පැවැත්වීම.
- ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවකයින් සඳහා උපදේශන කුසලතා පිළිබඳව පුහුණුව ලබාදීම.
- ප්‍රජා මානසික සෞඛ්‍ය පිළිබඳව බහු-ශික්ෂිත මානසික සෞඛ්‍ය කණ්ඩායම් සාමාජිකයින් සඳහා විදෙස් පුහුණුවීම් ලබා දීම.
- සියළු පාසල් ළමුන් අතර සහ සෞඛ්‍ය ආයතන අතර " සුවය " සඟරාව බෙදා හැරීම.
- ජාතික සම්පත් කණ්ඩායම්වල සහභාගීත්වය ඇතිව දිස්ත්‍රික් සමාලෝචන රැස්වීම් 18 ක් පැවැත්වීම.
- බහු-ශික්ෂිත මානසික සෞඛ්‍ය කණ්ඩායමට අදාලව මානව සම්පත් සංවර්ධනය.
- ජාතික මානසික සෞඛ්‍ය සමාලෝචනය පැවැත්වීම.
- වාර්තා වූ සියදිවි හානිකර ගැනීම් පිළිබඳව මාධ්‍ය මාර්ගෝපදේශ සකස් කිරීම සහ බෙදා හැරීම.
- මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව ජාතික සම්පත් කණ්ඩායම පුහුණු කිරීම - විදෙස්ගත
- දෙමටපිටිය සහ දියතලාව මූලික රෝහල්වල මානසික සෞඛ්‍ය ඒකක අලුත්වැඩියා කිරීම, මුලතිව් සහ කෑගල්ල දිස්ත්‍රික් මහ රෝහල්වල මානසික සෞඛ්‍ය ප්‍රතිකාර ඒකකය (acute psychiatry unit) ඉදිකිරීම, නාවලපිටිය දිස්ත්‍රික් මහ රෝහලෙහි පිරිමි මානසික සෞඛ්‍ය වාට්ටුවක් ස්ථාපනය කිරීම.
- ආනමඩුව ප්‍රාදේශීය රෝහලෙහි මානසික සෞඛ්‍ය පුනරුත්ථාපන ඒකකයක් ඉදිකිරීම.
- 2018 ලෝක මානසික සෞඛ්‍ය දිනය සැමරීම.

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| අවම වශයෙන් සමාජ සහයෝගීතා මධ්‍යස්ථාන එකක්වත් ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක සංඛ්‍යාව | 25 | DNA | DNA | 11 |
| නේවාසික මානසික සෞඛ්‍ය ප්‍රතිකාර සේවා පවත්වාගෙන යන දිස්ත්‍රික්ක සංඛ්‍යාව | 25 | 21 | 21 | 24 |
| අතරමැදි සෞඛ්‍ය සේවා ඒකක පවත්වාගෙන යන දිස්ත්‍රික්ක සංඛ්‍යාව | 25 | - | 15 | 16 |
| මත්පැන් භාවිත කරන්නන් පුනරුත්ථාපනය කිරීමේ ඒකක සහිත දිස්ත්‍රික්ක සංඛ්‍යාව | 25 | 07 | 07 | 08 |
| සියදිවි නසා ගැනීමේ අනුපාතය(පුද්ගලයන් 100,000) | - | 14.3 | 15.2 | - |
| ජනගහනයෙන් වයස අවුරුදු 18 ට වැඩි අය අතරින් මත්පැන් භාවිතය කරන්නන් සංඛ්‍යාව | - | 36% පිරිමි අතරින් | - | - |

### 3.3.3 නිදන්ගත වකුගඩු රෝග (CKD) වැළැක්වීමේ සහ පාලනය කිරීමේ වැඩසටහන

අධි අවදානම් ප්‍රදේශවල ඇස්තමේන්තුගත CKD/CKDU රෝගීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 60,000 ක් වන අතර ඔවුන්ගෙන් බහුතරය උතුරුමැද පළාතේ රෝගීන් වේ. මීට අමතරව අම්පාර, ත්‍රිකුණාමලය, බදුල්ල, මොණරාගල, හම්බන්තොට, මාතලේ, කුරුණෑගල, වවුනියාව සහ මුලතිව් යන දිස්ත්‍රික්කද මෙම රෝගය හේතුවෙන් පීඩාවට පත්ව ඇත. CKD/CKDU රෝගය සම්බන්ධයෙන් පුද්ගලයින් පරීක්ෂාවට ලක් කිරීම 2008 වර්ෂයේ ආරම්භ කරන ලද අතර මෙරට CKD/CKDU රෝගීන් සංඛ්‍යාව 27,530 කි. මෙම අගයන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙම වසරේ පවත්වන ලද සමීක්ෂණයකින් ලබා ගන්නා ලදී. CKD/CKDU රෝග හේතුවෙන් රජයේ රෝහල්වල 2000 ට ආසන්න මරණ සංඛ්‍යාවක් සිදුවේ. අධි අවදානම් ප්‍රදේශවල අවුරුදු 20ට වැඩි පුද්ගලයින් පරීක්ෂාවට ලක් කිරීම, රෝගීන් සඳහා වෛද්‍ය සේවාවන් වැඩිදියුණු කිරීම, රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශවල පුහුණු වෛද්‍ය කාර්යමණ්ඩලයේ සංඛ්‍යාව වැඩි කිරීම, CKD/CKDU රෝගීන්ගේ දත්ත ලබා ගැනීම සඳහා ආවේක්ෂණ පද්ධතියක් ස්ථාපනය කිරීම, රෝගය වැලැක්වීම සඳහා චර්යා රටාව සංවර්ධනය කිරීම සඳහා ප්‍රජාව බල ගැන්වීම, රෝගය වැළැක්වීම සහ පර්යේෂණ සිදු කිරීම සඳහා අංශයන් අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමය.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- CKD/CKDU රෝගය හඳුනා ගැනීම සඳහා 2018 වර්ෂයේ අධි අවදානම් සහිත ප්‍රදේශවල ප්‍රජාව අතුරින් ආසන්න වශයෙන් පුද්ගලයින් 204,539 පමණ සංඛ්‍යාවක් පරීක්ෂාවට ලක් කිරීම.

- නිදන්ගත වකුගඩු රෝග වැලැක්වීමේ සහ මර්ධනය කිරීමේ වැඩසටහනෙහි කාර්යයන් වන්නේ, CKD/CKDU අධි අවදානම් සහිත ප්‍රදේශවල CKD සායනික මධ්‍යස්ථාන ඉදිකිරීම, ප්‍රාදේශීය රෝහල් සහ මූලික රෝහල් සඳහා සායනික මධ්‍යස්ථාන 13 ක් සැලසුම්කරණ ලදී.

- අධි අවදානම් ප්‍රදේශවල කාන්දු පෙරණ ඒකක 15 ක් ඉදිකිරීම. මෙයින් ඒකක 10 ක් නිමකර ඇති අතර යාපනය, මඩකලපුව ශික්ෂණ රෝහල්වල, බදුල්ල, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට රෝහල්වලද බද්ධ කිරීමේ පහසුකම් සහිත සහ රහිත වෘක්ක ඒකකයක 05ක් ස්ථාපිත කරන ලදී. ඒකක 04 ක ඉදිකිරීමේ වැඩ අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත ප්‍රදානය කර තිබේ.
- පීඩාවට පත් දිස්ත්‍රික්කයන්හි රසායනාගාර පහසුකම් වැඩිදියුණු කිරීම, ජාතික රෝහල, නුවර ශික්ෂණ රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහල සහ පේරාදෙණිය ශික්ෂණ රෝහල යන රෝහල්හි අවයව බද්ධ කිරීමේ සහ කාන්දු පෙරණ සේවාවන් ශක්තිමත් කිරීම.

- කරාපිටිය ශික්ෂණ රෝහලෙහි බද්ධ කිරීමේ ඒකක ස්ථාපනය කිරීම CKD/CKDU අධි අවදානම් සහිත ප්‍රදේශවල රෝහල්හි පහසුකම් වැඩි දියුණු කිරීමට සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් කිහිපයක් ඉහත දැක්වේ.

## 3.4 මාතෘ සහ ළමා සෞඛ්‍ය සේවාවන්

පවුල් සෞඛ්‍ය කාර්යංශය (FHB) ශ්‍රී ලංකාවේ ප්‍රජනන, මාතෘ, නව ජන්ම, ළමා හා නව යොවුන් සහ යෞවන යන කාණ්ඩවල සෞඛ්‍ය (EMNCAYH) සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ළමා අවධියේ රෝග කළමනාකරණය පිළිබඳව ජාතික මාර්ගෝපදේශයන් යාවත්කාලීන කිරීම.

- අධිපරායත්ත ඒකක (HDU) ඇඳන් 30 ක් සවිකිරීම සිදු කෙරෙමින් පවතී. (මි. 5.7) ලැබුණු භාණ්ඩ - Infusion pumps 30 (2,107,826) සහ sryinge pumps 30 (මි. 1.9), adult sucker 30 (මි. 4.47), hand held Doppler 50 (මි. 1.5), CTG යන්ත්‍ර 6 ක් (මි. 3.7), spot lamps 50 (මි. 4.5), multipara monitor 20 ක් සඳහා මිල කැඳවීම් සිදු කර ඇත. (මි. 4.5)

- CHDR මුද්‍රණය කෙරෙමින් පවතින අතර තොග ලැබෙමින් පවතී. CF පුවරු යළි මුද්‍රණය කිරීම සහ ස්ථුලභාවය පිළිබඳ උපදෙස් පොත් මුද්‍රණය කිරීම.

- නව යෞවනයන් අතර මානසික සාමාජීය යහපැවැත්ම ප්‍රවර්ධනය පිළිබඳ පුහුණු කරන්නන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහන් පැවැත්වීම.

- දිස්ත්‍රික් තුනක පාසැල් ආපනශාලාවල සෞඛ්‍ය සම්පන්න ආහාර ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව කරන ලද නියමු පරීක්ෂණය සම්පූර්ණ කරන ලදී.

- AYFHS පිළිබඳව ජාතික සමාලෝචනය

- ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ සෞඛ්‍ය සේවකයන්ගේ ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් (TOT) රෝහල් පාදක කර ගත් වැඩසටහන් 08 ක් සහ දිස්ත්‍රික් මට්ටමේ පුහුණු වැඩසටහන් 06 ක් පැවැත්වීම.

- ධාරිතා වර්ධනය: ප්‍රසව ඒකකයන්හි කාර්ය මණ්ඩලය සඳහා EMOC පුහුණුව ලබා දීම, අත්‍යාවශ්‍ය අළුත උපන් බිළිඳු සත්කාර (Essential Newborn Care) සේවා පිළිබඳ පුහුණුව, නවජ ළදරු උසස් ජීව ආධාර (Neonatal Advanced Life Support), මව්කිරි දීම පිළිබඳ උපදේශනය, අළුත උපන් රෝගී බිළිඳුන් සඳහා පහසුකම් පාදක කර ගත් සත්කාර සැපයීම, පවුල් සැලසුම්, බිළිඳුන් සහ තරුණ ළමුන් සඳහා ආහාර ලබා දීම, ළමා සංවර්ධනය සහ විශේෂ අවශ්‍යතා, SMI, ජීවන නිපුනතා, මානසික යහපැවැත්ම, නව යොවුන් සෞඛ්‍යය, ස්ත්‍රී/ පුරුෂ භාවය සහ කාන්තාවන්ගේ සෞඛ්‍යය පර්යේෂණ, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා සන්නිවේදනය.

- දිස්ත්‍රික්ක 28 ක ළමා මාතෘ ක්‍රියාකාරකම් පිළිබඳ MCH සමාලෝචනය, MOMCH සම්මන්ත්‍රණ 02, RSPHNO සම්මන්ත්‍රණ 01, SSO වැඩමුළු 01, ජාතික පෝෂණ සමාලෝචන 01, e-HMIS සංවර්ධන රැස්වීම් 01, දිස්ත්‍රික්ක 23 ක වැඩමුළු ක්‍රියාත්මක කිරීම.

- දිස්ත්‍රික්ක 25 හේ මාතෘ මරණ අනුපාතිකය සමාලෝචනය, රෝහල් 81 ක් වෙබ් අඩවි පාදක කර ගත් උපත් දෝෂ ආවේක්ෂණය (Birth Defect Surveillance) ක්‍රියාත්මක කිරීම.

- පවුල් සෞඛ්‍ය කාර්යංශයේ (FHB) කාර්ය මණ්ඩලය සඳහා ආපදා පෙර සූදානම පිළිබඳ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| මාතෘ මරණ අනුපාතය (ජීව උපත් 100,000 කට) | | 33.8 | 39 | |
| දරු උපත් මරණ අනුපාතිකය (ජීව උපත් 1000 කට) | | 8.2 | 8.7 | |
| වාර්තා වූ ප්‍රසූත සංඛ්‍යාවෙන් පසු ප්‍රසව පිවිසුම් ප්‍රතිශතය | | 92.8 | 80.8 | |
| නවීන උපත් පාලන ක්‍රම භාවිත කිරීමේ අනුපාතිකය | | 57.6 | 57.9 | |
| සුවනාරී සායන ආවරණය | | 52.8 | 53.3 | |

## 3.5 මුඛ සෞඛ්‍ය සේවා

දන්ත වෛද්‍ය සේවාවන්ට අදාල අධ්‍යක්ෂක විසින් ප්‍රජා මට්ටමින් මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන බවටත් දිවයින පුරා සෞඛ්‍ය ආයතනයන්ට අත්‍යාවශ්‍ය දන්ත උපකරණ සැපයෙන බවටත් සහතික කරනු ලැබේ. මුඛ සෞඛ්‍ය සත්කාරයන්ගේ ගුණාත්මකභාවය සහ සුරක්ෂිතභාවය සඳහා දන්ත වෘත්තිකයන්ගේ ධාරිතා වර්ධනය, ජාතික මුඛ සෞඛ්‍ය ප්‍රතිපත්ති ලේඛනය පිළිබඳ අවසන් තීරණයකට එළඹීම, ජාතික මුඛ සෞඛ්‍ය සමීක්ෂණය පිළිබඳ අවසන් තීරණයකට එළඹීම, රේඛීය අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය ආයතන සඳහා දන්ත ශල්‍ය වෛද්‍යවරුන් බඳවා ගැනීම ආදී ක්‍රියාකාරකම්ද මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ආවේක්ෂණ පද්ධතිය සඳහා දත්ත ලබාදීම පිළිබඳව දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සහ ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් පුහුණු කිරීම.

- මුඛ සෞඛ්‍ය සත්කාර සේවාවන්ගේ ගුණාත්මකභාවය සහ සුරක්ෂිතභාවය පිළිබඳව දන්ත වෘත්තිකයින්ගේ ධාරිතා වර්ධනය.

- සෞඛ්‍ය ආයතන සඳහා අත්‍යාවශ්‍ය දන්ත උපකරණ සැපයීම සහ CT Cone Beam ස්කෑනර් යන්ත්‍රයක් සැපයීම.

- ජාතික දන්ත රෝහල ශික්ෂණ (NDHS) , නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල , කලුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය (NIHS) හා දකුණු කොළඹ ශික්ෂණ රෝහල (CSTH) යන ආයතන වල දන්ත ඒකක හා උපකරණ නඩත්තු කිරීම සහ අලුත්වැඩියාව

## 3.6 පුහුණු හා පර්යේෂණ

### 3.6.1 වෛද්‍ය පර්යේෂණ ආයතනය

වෛද්‍ය පර්යේෂණ ආයතනය (MRI) විසින් ජාතික මට්ටමෙහි වෛද්‍ය රසායනාගාර රෝග විනිශ්චය කිරීමේ සේවාවන් සපයනු ලබන අතර පර්යේෂණ ක්‍රියාකාරකම්ද සිදු කරනු ලැබේ. එමෙන්ම එය පශ්චාත් උපාධි හදාරන වෛද්‍ය සිසුනට පුහුණු මධ්‍යස්ථානයක්ද වන අතර ජාතික මට්ටමෙහි රෝග විනිශ්චීය රසායනාගාර සේවාවන් සැපයීම හා එන්නත්වල ගුණාත්මකභාවය පාලනය කිරීමද සිදු කරනු ලැබේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- MRI හි අධි අවදානම් BSL 3 රසායනාගාරයක් ස්ථාපනය කිරීම.

- MRI සඳහා පරිත්‍යාග මත මහල් 10 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීම.

- ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂයෙන් ස්කෑන් කිරීම වඩා දියුණු තත්ත්වයකට ගෙන ඒම සඳහා උපකරණ මිලදී ගැනීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| වසරකට කෙරෙන පර්යේෂණ සංඛ්‍යාව | - | 55 | 44 | 24 |
| වසරකට කෙරෙන පරීක්ෂණ සංඛ්‍යාව | - | 606,220 | 825,973 | 1,280,538 |

## 3.7 පෝෂණය

### 3.7.1 පෝෂණ අංශය

පෝෂණ අංශය විසින් පහත කාර්යයන් සිදු කරනු ලැබේ.
දිස්ත්‍රික්කයන් තුළ පවතින මන්දපෝෂණ තත්ත්වය මැඩලීම සඳහා දිස්ත්‍රික් පෝෂණ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ ලබාදීම, සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අයවැය කළමනාකරණය කිරීම, පෝෂණ මැදිහත්වීම් සිදු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, බහු-ආංශීය පෝෂණ ක්‍රියාකාරී සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ හවුල්කාරීත්වය සැපයීම, ජාතික පෝෂණ තොරතුරු සහ ආවේක්ෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, ත්‍රිපෝෂ වැඩසටහනෙහි භාණ්ඩ හා සේවා සැපයීම ශක්තිමත් කිරීම සහ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- 2018 දිස්ත්‍රික් පෝෂණ ක්‍රියාකාරී සැලසුම (DNAP) යටතේ සියළු දිස්ත්‍රික්කයන්හි පෝෂණ හා සම්බන්ධ ක්‍රියාකාරකම් සිදු කිරීම.
- දිස්ත්‍රික්ක 22 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24 ක පිහිටි මුල් ළමාවිය සංවර්ධන වැඩසටහනෙහි පෝෂණ පැතිකඩ පිළිබඳව ගුණ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- දිස්ත්‍රික් පෝෂණ අධීක්ෂණ පද්ධතිය පිළිබඳව යාපනය දිස්ත්‍රික්කයෙහි වැඩසටහන් 2 ක් පැවැත්වීම.
- ගරු සෞඛ්‍ය අමාත්‍ය වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික පෝෂණ මාසය යටතේ 2018.06.04 දින සමාරම්භක උත්සවය පැවැත්වීම.
- ලෝක ආහාර වැඩසටහන ගබඩා කළමනාකරණය (WEP Warehouse Management) පිළිබඳව දකුණු සහ ඌව පළාත්හි පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- යොවුන් පෝෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ පෝෂණ මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| DNAP ප්‍රතිපාදන මුදල් භාවිතා කිරීමේ ප්‍රතිශතය =<br><br>DNAP මුළු වියදම * 100<br>------------------------------------------------<br>DNAP සඳහා දිස්ත්‍රික්ක වෙත මුදාහරින ලද මුළු ප්‍රතිපාදන | 100% | 75% | 80% | 85% |
| පූර්ව - පාසල් පෝෂණ වැඩසටහන ආවරණය =<br>පවත්වන ලද පූර්ව - පාසැල් පෝෂණ ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව<br>------------------------------------------------<br>සැලසුම් කරන ලද පූර්ව- පාසැල් ප්‍රවර්ධන TOT වැඩසටහන් සංඛ්‍යාව | 100% | 90% | 90% | 98% |

| | | | | |
|---|---|---|---|---|
| ත්‍රිපෝෂ ගබඩාකිරීම් සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය= <br><br> සම්පූර්ණ කරන ලද නව ත්‍රිපෝෂ ගබඩා පහසුකම් ප්‍රමාණය * 100 <br> ------------------------------------------------------- <br> ඉල්ලීම් කරන ලද නව ත්‍රිපෝෂ ගබඩා පහසුකම් ප්‍රමාණය | | 65% | 80% | 82% |
| තරුණ සමාජශාලා හරහා තරුණ ත්‍රිපෝෂ ප්‍රවර්ධන ආවරණය = <br><br> පවත්වන ලද තරුණ පෝෂණය ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව <br> ------------------------------------------------------- <br> සැලසුම් කරන ලද තරුණ පෝෂණය ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | | | 60% |

## 3.8 ආපදා පෙර සූදානම් සහ ප්‍රතිචාර දැක්වීමේ අංශය

මූලිකව සුරක්ෂිත රෝහල් හරහා සෞඛ්‍ය පහසුකම්හි ව්‍යුහාත්මක, ව්‍යුහාත්මක නොවන සහ ක්‍රියාකිරීමේ ධාරිතාව වැඩිදියුණු කිරීම, සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය සඳහා මානව සම්පත් දියුණු කිරීම, සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම, තොරතුරු ලබාදීමේ සහාය වැඩිදියුණු කිරීම, දැනුම කළමනාකරණය සහ සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය සඳහා පර්යේෂණ සිදු කිරීම, සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගීත්වය වැඩිදියුණු කිරීම සහ සෞඛ්‍ය අංශයේ ආපදා කළමනාකරණය සඳහා ප්‍රතිඵල පාදක කරගත් අධීක්ෂණ සහ ඇගයීම් කටයුතු ඒකාබද්ධ කිරීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ක්‍රමෝපායික සැලසුම් පිළිබඳ ග්‍රන්ථය, ආපදා සහන සේවකයින් සඳහා වන අත්පොත (ඉංග්‍රීසි බසින්) සහ 2017 වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම.

- මුල්ලේරියාව ජාතික මානසික සෞඛ්‍ය ආයතනය සඳහා මහජන අනතුරු ඇඟවීම් පද්ධතියක් මිලදී ගැනීම, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය සඳහා ගිනි නිවන උපකරණ ලබා ගැනීම සහ නැවත පිරවීම, දකුණු කොළඹ ශික්ෂණ රෝහල සඳහා මැනිකින් (mannequin) ලබා ගැනීම, බදුල්ල පළාත් මහ රෝහලෙහි ආපදා පෙර සූදානම සඳහා උපකරණ ලබා ගැනීම, ජාතික බෝවන රෝග පිළිබඳ ආයතනය සඳහා උපකරණ සහ අන්තර්ජාල පද්ධතිය ලබා ගැනීම, කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ (RDHS) හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය සඳහා උපකරණ ලබා ගැනීම.

- ජාතික රෝහල සහ තවත් රෝහල් 13 ක් හෙද පුහුණු වැඩසටහන් 13 ක් සහ ආපදා කළමනාකරණ පුහුණු පැවැත්වීම.

ප්‍රධාන කාර්ය සාධක දර්ශක

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| රෝහල්වල පවත්වන ලද ආපදා කළමනාකරණ පුහුණු කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 25 | රෝහල් 28 ක වැඩසටහන් 22 යි. | රෝහල් 21 ක | NHSL සහ තවත් රෝහල් 13 ක වැඩසටහන් සහ ජාතික මට්ටමේ වැඩසටහන් පැවැත්වීම සහ 2017 සමාලෝචන රැස්වීම පවත්වන ලදී. |
| ආපදා කළමනාකරණය පිළිබඳ හෙද නිලධාරීන් නැවත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 10 | 9 | 13 | 13 |
| ආපදා පෙරසූදානම් වීම හා ප්‍රතිචාර දැක්වීම පිළිබඳ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | මහජන ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 30 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 01 ක් පැවැත්වීම | හලාවත දිස්ත්‍රික් මහ රෝහලේ පුහුණු වැඩසටහන් 06 | අදාල නොවේ. |
| උපකරණ මිලදී ගැනීම | රෝහල් 05 ක් සඳහා | රෝහල් 04, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආපදා පෙරසූදානම් හා ප්‍රතිචාර දැක්වීමේ අංශය සඳහා මැනිකින්ස් (Mannequins) මිලදී ගැනීම | රෝහල් 04, කෑගල්ල කොට්ඨාසයේ ආපදා කළමනාකරණ ඒකක 02 | රෝහල් 06 |
| ප්‍රකාශන මුද්‍රණය කිරීම | වර්ග තුනක කුඩා පොත් ( පිටපත් 500 බැගින්) | පොත් 03 ( පිටපත් 500 බැගින්) | පොත් 03 ( පිටපත් 500 බැගින්) | පොත් 03 ( පිටපත් 500 බැගින්) |

## 3.9 පාරිසරික සහ වෘත්තීය සෞඛ්‍යය

මෙම අධ්‍යක්ෂක අංශය, රෝහල් අපද්‍රව්‍ය බැහැර කිරීම සහ කළමනාකරණය, වෘත්තීය සෞඛ්‍ය සහ ආහාර සුරක්ෂිතතාව ඇතුළු සියලු පාරිසරික සෞඛ්‍ය ක්‍රියාකාකරම් සම්බන්ධයෙන් තාක්ෂණිකව වගකියනු ලැබේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතාවය පිළිබඳ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයෙහි ධාරිතා වර්ධනය
- වෘත්තීය සෞඛ්‍ය පිළිබඳව වාර්ෂික දිස්ත්‍රික් සමාලෝචනයක් පැවැත්වීම
- මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පෞද්ගලික ආරක්ෂිත උපකරණ (N 95 මුහුණු ආවරණ) මිලදී ගැනීම.
- වෘත්තීය සහ පාරිසරික සෞඛ්‍ය පිළිබඳ පෝස්ටර් මුද්‍රණය කිරීම
- වෘත්තීය සහ පාරිසරික සෞඛ්‍ය පිළිබඳ අත්පත්‍රිකා මුද්‍රණය
- මලාපවාහන සහ අපජලය කලමනාකරණය වැඩිදියුණු කිරීම. රෝහල් දෙකක් විසින් පාරිසරික ආරක්ෂිත බලපත්‍රය (Scheduled Waste License) සහ උපලේඛනගත අපද්‍රව්‍ය බලපත්‍රය ලබා ගෙන ඇත
- ආනයන සහ අපනයන ආහාර ද්‍රව්‍ය පරීක්ෂාව හා නියැදි පරීක්ෂාව හා සෞඛ්‍ය සහතික 10845 ක් නිකුත් කරන ලදී
- අයඩීන් ලුණු නිෂ්පාදනය කරන කර්මාන්තශාල 26 ක් සහ බෝතල් කළ හෝ ඇසුරුම් කළ පානීය ජලය නිපදවන කර්මාන්තශාල 42 ක් පරීක්ෂාවට ලක් කරන ලදී
- ආහාර ද්‍රව්‍ය ආවේක්ෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම
- ආහාර රසායනාගාර ශක්තිමත් කිරීම
- FCAU කාර්යමණ්ඩලය, පළාත්/ දිස්ත්‍රික්ක ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් සහ SPHID සඳහා ධාරිතා වර්ධනය
- Codex රැස්වීම්, ඉලෙක්ට්‍රොනික් වැඩ කණ්ඩායම් සඳහා සහභාගිවීම සහ මාර්ගගත (online) අදහස් දැක්වීමේ පද්ධතිය

**ප්‍රධාන කාර්ය සාධක දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| වාර්ෂික දිස්ත්‍රික් සමාලෝචන පැවැත්වීමේ ප්‍රතිශතය | 100% (n=27) | 7.5% (n=2) | 14.8% (n=5) | 92.6% (n=25) |
| සෞඛ්‍ය වෘත්තිකයින් සඳහා පැවැත්වුණු වෘත්තීය සෞඛ්‍ය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | වසරකට 10 - 12 | 100% (n=10) | 100% (n=10) | 100% (n=12) |
| ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ රෙගුලාසි ගැසට් කිරීම | වසරකට 3 - 5 | 01 | 01 | නැත |
| ලබා ගත් පරිසර ආරක්ෂණ බලපත්‍ර සංඛ්‍යාව (රේඛීය අමාත්‍යාංශයේ රෝහල්) | සමුච්චිත | DNA | 13 | 18 |

## 3.10 සෞඛ්‍ය ප්‍රවර්ධනය

සෞඛ්‍ය අධ්‍යාපන කාර්යංශය 2018 දී සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශය (HPB) ලෙස උසස් කරන ලදී. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශයේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ අරමුණින් මහජන සෞඛ්‍ය විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ තාක්ෂණික ඒකක ස්ථාපිත කර තිබේ. තවද සෞඛ්‍ය ප්‍රවර්ධනයේ (HP) ප්‍රධාන අංගයන් සහ සෞඛ්‍ය නිවේදනය, ජීවන නිපුණතා, උපදෙස් ලබාදීම, සමාජ හා ප්‍රජා පුහුණුව, ප්‍රජාව බල ගැන්වීම ආදිය ඇතුළත් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ප්‍රවර්ධන ආරම්භයන් ක්‍රියාත්මක කිරීමට හැකි තත්ත්වයට සකස් කිරීම, විශේෂ සෞඛ්‍ය දිනයන් සැමරීමට සහ විශේෂ අවස්ථාවලදී මෙන්ම සෞඛ්‍ය සන්නිවේදනය අවශ්‍ය වන ආපදා අවස්ථාවන්වලදී හෝ වසංගත අවස්ථාවලදී (මාධ්‍ය සම්මන්ත්‍රණ හා මාධ්‍ය සාරාංශ පැවැත්වීම) පොදු ගැටළු මෙන්ම මුඛ සෞඛ්‍ය ගැටළු සඳහාද " සුවසැරිය " නමැති වැඩසටහන 24 පැය සේවාව මඟින් ක්ෂණික හා වේගවත් අවශ්‍ය සේවාවන් ලබාදීම. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යංශයේ තාක්ෂණික ඒකකවල වගකීම වන්නේ ප්‍රධාන අංශයක් ලෙස හඳුනාගත් ක්ෂේත්‍රවල සෞඛ්‍ය හා සෞඛ්‍ය නොවන කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධ්‍යාපනික ලේඛණ සකස් කිරීම හා මුද්‍රණය කිරීම : ප්‍රමුඛ සෞඛ්‍ය ගැටළු පිළිබඳව පත්‍රිකා, පෝස්ටර්, මාර්ගෝපදේශ, වීඩියෝ වැඩසටහන් මෙන්ම සෞඛ්‍ය ප්‍රවර්ධනය හා සෞඛ්‍ය අධ්‍යාපනය නියමකරගත් ක්‍රියාකාරකම් ජාතික, පළාත් හා දිස්ත්‍රික් සමාලෝචන සහ ක්ෂේත්‍ර මෙන්ම ආයතනික අධීක්ෂණය කිරීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- මව්කිරි දීමේ අගය, ඉන්ෆ්ලුවන්සාව, ආපදාවකදී සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීම, ආහාර සුරක්ෂිතතා සතිය වෙනුවෙන් ආහාර දූෂිතවීම පාලනය හා සුවනාරී සායනය සම්බන්ධයෙන් අධ්‍යාපනික ප්‍රකාශන ආදිය මුද්‍රණය කිරීම.

- හෙද නිලධාරීන් හා පුහුණුවන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා සන්නිවේදනය පිළිබඳ ධාරිතා සංවර්ධනය, හෙද නිලධාරීන්ගේ උපදේශන නිපුණතා පිළිබඳ ධාරිතා සංවර්ධනය, ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා වැඩිහිටියන්ගේ මුඛ සෞඛ්‍ය පිළිබඳ ධාරිතා සංවර්ධනය, ප්‍රාථමික සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය සඳහා ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ සන්නිවේදන නිපුණතා ධාරිතා සංවර්ධනය, රෝහල්වල මධ්‍යම මට්ටමේ කළමණාකරුවන් සඳහා රෝහල්වල සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමේ උපදේශකත්වය සහ මධ්‍යම

මට්ටමේ කළමණාකරුවන් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධනය / සන්නිවේදනය බලගැන්වීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම (TOT), විදුහල්පතිවරුන් හා සෞඛ්‍ය විද්‍යා ගුරුවරුන් සඳහා පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ මධ්‍යම හා දිස්ත්‍රික් මට්ටමේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සාර්ථකව පවත්වන ලදී.

- අදාල සෞඛ්‍ය නිලධාරීන් සඳහා අවදානම් සන්නිවේදනය පිළිබඳ වැඩමුළුව සහ කොළඹ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන නිලධාරීන් හා ගුරුවරුන් සඳහා ප්‍රථමාධාර හා මුඛ කම්පනය වැලැක්වීමේ වැඩමුළුව පවත්වන ලදී.

ප්‍රධාන කාර්ය සාධක දර්ශක මෙතෙක් හඳුනාගෙන නොමැත.

## 3.11 තරුණ, වැඩිහිටි හා ආබාධිත ප්‍රජාව සඳහා වූ සේවාවන්

තරුණ, වැඩිහිටි හා ආබාධිත ප්‍රජාවගේ ප්‍රාථමික, ද්විතියික හා තෘතියික මට්ටමේ සෞඛ්‍ය සේවා කටයුතු සම්බන්ධයෙන් වගකියනු ලබන ජාතික මට්ටමින් ක්‍රියාත්මක ආයතනය වනුයේ අමාත්‍යාංශයේ තරුණ, වැඩිහිටි හා ආබාධිත ප්‍රජාව සඳහා වූ අංශයයි. තවද වැඩිහිටියන්ගේ කායික, මානසික හා සමාජ සුබසාධනය වැඩිදියුණු කිරීම, අනාගතයේදී සෞඛ්‍ය සම්පන්න වඩාත් ක්‍රියාකාරී සහ වඩාත් ඵලදායී වැඩිහිටි ප්‍රජාවක් බිහිකිරීම, ආබාධිත ජනතාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, ආබාධිත ජනතාවගේ සෞඛ්‍ය සේවාවන් වැඩිදියුණු කිරීම හා දැනුම වැඩි දියුණු කිරීම, තරුණ ප්‍රජාවගේ ගැටළු අඩුකිරීම හා ඔවුන්ගේ සෞඛ්‍ය සම්පන්නභාවය වැඩිදියුණු කිරීමට ඔවුන්ගේ ආකල්ප හා ජීවන කුසලතා වැඩිදියුණු කිරීම මෙම අංශයේ වගකීම වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- සෞඛ්‍ය මෙන්ම සෞඛ්‍ය නොවන තරුණ හා ආබාධිත සේවාවන් සපයන්නන් සඳහා ධාරිතා සංවර්ධනය

- හෙද නිලධාරීන් සඳහා දිස්ත්‍රික් මට්ටමේ වැඩිහිටි සහ ආබාධිත සේවා පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන්

- ආයතනික මට්ටමේ සෞඛ්‍ය සේවා සපයන්නන්ට වැඩිහිටි හා ආබාධිත සේවා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්

- වැඩිහිටි හා ආබාධිත සේවා පිළිබඳ අධ්‍යාපනික මෙවලම් (materials) සකස් කිරීම සඳහා විශේෂඥවරුන් සමඟ උපදේශක රැස්වීම් පැවැත්වීම

- ශ්‍රී ලංකාව සඳහා වූ ප්‍රමුඛතා සහායක නිපැයුම් සකස් කිරීම සඳහා උපදේශන රැස්වීම් පැවැත්වීම

- ප්‍රජා නිවාසවල වයෝවෘද්ධ පුද්ගලයන් හා රැකවරණය සපයන්නන් සඳහා පෝෂණ මාර්ගෝපදේශ සකස් කිරීම හා සම්පූර්ණ කිරීමට උපදේශක රැස්වීම් පැවැත්වීම යනාදිය මෙම වර්ෂයේදී ලබාකරගත් ප්‍රධාන ජයග්‍රහණයන් වේ

ප්‍රධාන කාර්ය සාධක දර්ශක

| දර්ශකය | ඉලක්කය | 2018 |
|---|---|---|
| • වැඩිහිටි හා ආබාධිත සේවා පිළිබඳ වසරකට පවත්වන ධාරිතා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | 08 |
| • පුහුණු කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව | | 206 |

## 3.12 පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමනය

පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධන අධ්‍යක්ෂ අංශය හා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කොමිෂන් සභාව (PHSRC) එක්ව, පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචිය, පෞද්ගලික වෛද්‍ය ආයතන පනත සංශෝධනය හා අදාල ක්‍රියාදාමයන් සම්බන්ධීකරණය, විවිධ කාරණා සම්බන්ධයෙන් අනුමැතිය අවශ්‍ය අවස්ථාවලදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පෞද්ගලික සෞඛ්‍ය අංශය අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා වගකීම දරනු ඇත. ශ්‍රී ලංකාවේ මේ වන විට ඇඳන් 5120 ක් සහිත පෞද්ගලික රෝහල් 200 ක් පමණ තිබේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- පෞද්ගලික වෛද්‍ය ආයතන බලපත්‍ර ලියාපදිංචිය සහ අළුත් කිරීම නොකඩවා සිදු කිරීම.
- පෞද්ගලික වෛද්‍ය ආයතන වලට එරෙහි පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම.
- පෞද්ගලික වෛද්‍ය ආයතන පරීක්ෂා කිරීම හා නිරීක්ෂණය සඳහා යාම.
- අවශ්‍ය අවස්ථාවලදී සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අනෙකුත් අංශ, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, සෞඛ්‍ය අංශයේ වෘත්තීය සමිති සහ වෘත්තීය ආයතන සමඟ සම්බන්ධීකරණය.
- පෞද්ගලික වෛද්‍ය ආයතනවල ක්‍රමවත් තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම.
- නව පෞද්ගලික රෝහල් පිහිටුවීම සඳහා ඉදිරිපත් කරන ව්‍යාපෘති වාර්තා නිශ්චය කිරීමෙන් පසු මූලික අනුමැතිය ලබා දීම.
- පෞද්ගලික රෝහල් මඟින් කෙරෙන වකුගඩු බද්ධ කිරීම් සඳහා අවශ්‍ය ලිපි ලේඛණ සැකසීම.
- විශේෂඥ වෛද්‍යවරුන් තාවකාලිකව ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛණ සකස් කිරීම.
- රෝග වැළැක්වීමේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා වූ ජාතික මාර්ගෝපදේශ හා ප්‍රමිතීන්ට අනුගත වෙමින් පෞද්ගලික වෛද්‍ය ආයතනවලින් ගුණාත්මක සේවාවන් ලබාදීම වැඩිදියුණු කිරීම.

- පෞද්ගලික වෛද්‍ය ආයතන වලට විරුද්ධව කෙරෙන පැමිණිලි සම්බන්ධයෙන් කාලෝචිතව විමර්ශනය කිරීම හා පිළියම් යෙදීම මඟින් එම ක්‍රියාකිරීමේ වැඩ පිළිවෙල වැඩිදියුණු කිරීම.

- මානව සම්පත්, බෝවන හා බෝ නොවන රෝග පිළිබඳ දත්ත ඇතුළත් ක්‍රමවත් තොරතුරු පද්ධතියක් පෞද්ගලික වෛද්‍ය ආයතනවල ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.

- පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධන අංශය (PHSD), පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කොමිෂන් සභාව (PHSRC), නයිටා (NAITA) සහ APHINH යන ආයතන සමඟ සහයෝගීත්වයෙන්, පෞද්ගලික රෝහල්/ වෛද්‍ය මධ්‍යස්ථානවල සේවයේ යෙදී සිටින " පෞද්ගලික අංශයේ හෙදියන් " සඳහා දැනුම අළුත් කිරීමේ/ හිදැස සම්පූර්ණ කිරීමට වැඩසටහන් පැවැත්වීම ආරම්භ කිරීම.

- ශ්‍රී ලංකා දන්ත වෛද්‍යවරුන්ගේ සංගමය (SLDA) දන්ත ශල්‍ය මධ්‍යස්ථාන/ සායනවල දැනට සේවයේ යෙදී සිටින " දන්ත ශල්‍ය සහකාරවරුන් " සඳහා දැනුම අළුත් කිරීමේ / දැනුමෙහි ඇති අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමට වැඩසටහන් පැවැත්වීම ආරම්භ කිරීම.

- පෞද්ගලික සෞඛ්‍ය අංශ මඟින් විවිධ ක්‍රමවේදයන් හා වෛද්‍ය රසායනාගාර පරීක්ෂණ සඳහා කෙරෙන අයකිරීම් සම්බන්ධයෙන් සුදුසු ගාස්තු/ මිල ගණන් සකස් කිරීම.

- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශවල සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහාය ඇතිව පෞද්ගලික සෞඛ්‍ය අංශ පිළිබඳව අධ්‍යයනයක් ආරම්භ කිරීම සහ දැනට පවතින සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන පිළිබඳ දත්ත ගබඩාවක් සකස් කිරීම.

- පෞද්ගලික රෝහල්වලට ඇතුළත්වන සියළුම ඩෙංගු උණ රෝගීන් පිළිබඳ සංගණනයක් පැවැත්වීම.

- පසුගිය වසර 3 තුළදී පෞද්ගලික රෝහල්වලට ඇතුළත් වූවන් සහ සියළුම මානව සම්පත් විස්තර පිළිබඳ සංගණනයක් සිදු කිරීම.

## 3.13 අතිරේක සේවා

### 3.13.1 රසායනාගාර සේවා

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් රසායනාගාර සේවා යටතේ සම්බන්ධීකරණය කෙරෙන රසායනාගාර සේවය මෙරට සෞඛ්‍ය සේවා පද්ධතියේ ප්‍රධාන භූමිකාවක් ඉදිරිපත් කෙරේ. අත්‍යාවශ්‍ය සහ අදාල ව්‍යවස්ථාව ස්ථාපිත කිරීම හා බලාත්මක කිරීම මෙන්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව රසායනාගාර නඩත්තු කිරීමේ තාක්ෂණික හා කළමනාකරණ මාර්ගෝපදේශ ලබාදීම සඳහා රසායනාගාර සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ විසින් වගකියනු ලැබේ. මෙම අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ : රජයේ රේඛීය අමාත්‍යාංශයේ රෝහල්වල හා විශේෂිත වැඩ සටහන්වල රසායනාගාර සේවා ශක්තිමත් කිරීම හා නියාමනය පුළුල් කිරීම සහ පළාත් සෞඛ්‍ය ආයතනවල රසායනාගාර සේවා ශක්තිමත් කිරීම, රසායනාගාර සඳහා උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීම, රසායනාගාර උපකරණ ක්‍රමානුකූලව නඩත්තු කිරීම සඳහා මූල්‍යාධාර ලබාදීම, රෝග වැළැක්වීමට සහායවීම, මර්ධනය සහ රෝග නිශ්චය කිරීමේ සේවාවන් සැපයීම තුළින් ආවේක්ෂණය, රසායනාගාර සේවා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීම, රසායනාගාර කාර්ය මණ්ඩලයට පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම, සම්බන්ධතාවයන්, රසායනාගාර සේවාවන්ට අදාල පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය හා සම්බන්ධීකරණය වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- රේඛීය අමාත්‍යාංශයේ රෝහල්වල රසායනාගාරවල පටක-ව්‍යාධිවේදය, රක්තවේදය (hematology), රසායනික ව්‍යාධිවේදය සහ ක්ෂුද්‍රජීව විද්‍යාව යන අංශ සඳහා රසායනාගාර උපකරණ ලබාදීමට රුපියල් මිලියන 1275 ක ප්‍රතිපාදන වෙන්කිරීම.

- ශික්ෂණ රෝහල - මහනුවර, ශික්ෂණ රෝහල - කරාපිටිය, ශික්ෂණ රෝහල - යාපනය, ශික්ෂණ රෝහල - අනුරාධපුර, අපේක්ෂා රෝහල - මහරගම යන රෝහල්වල වෛරස විද්‍යා රසායනාගාර ස්ථාපිත කිරීම.

- වැලිසර ජාතික ශ්වසන රෝග රෝහල සහ අනෙකුත් ශික්ෂණ රෝහල් සඳහා උපකරණ මිලදී ගැනීම.

- සංචාරක රසායනාගාර සේවාවන් තුළින් ඉතා දුරබැහැර හා දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන ජනතාවට අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ සඳහා ප්‍රවේශය ලබාදීමට සහාය වීම.

- දිවයින පුරාම ඉලක්කගත කණ්ඩායම් සඳහා ක්‍රමානුකූලව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. 1550 ක් වූ වෛද්‍ය කාර්ය මණ්ඩලය, සෞඛ්‍ය පරිපාලකයින් හා වෛද්‍යවරුන් සහ 4565 ක් වූ අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා සියයකට (100) වැඩි වැඩසටහන් පවත්වන ලදී.

- වීඩියෝ දර්ශන, මුද්‍රිත මාධ්‍ය හරහා ප්‍රති ක්ෂුද්‍ර නාශක භාවිතය පිළිබඳ ප්‍රජාව ඉලක්ක කරමින් මහජන සන්නිවේදනය සහ පොදු ජනතාව වෙත අධ්‍යාපනික ලිපි ලේඛණ බෙදා දීම.

- Sentinel sites 25 සමඟ සම්බන්ධවෙමින් දත්ත රැස් කිරීමේ මෘදුකාංගය පිළිබඳ ධාරිතා වර්ධනය සහිතව ජාතික ප්‍රති-ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධක ආවේක්ෂණ පද්ධතිය (National antimenobial resistance surveillance system) ස්ථාපිත කිරීම සහ ලැප්ටොප් පරිගණක ලබාදීම, රසායනාගාර පරීක්ෂණ සඳහා අවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය සැපයීම ක්‍රමවත් කිරීම.

- 2018 මැයි මාසයේ සිය ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රතික්ෂුද්‍රජීවී ප්‍රතිරෝධක ආවේක්ෂණ පද්ධතියේ (GLASS) සාමාජිකයෙකු වීම.

- ප්ලෙමින් ආධාර (Fleming fund) මඟින් AMR ආවේක්ෂණය සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට සාකච්ඡා ආරම්භ කිරීම සහ 2019 දී ආධාර ලබා දීමට එකඟතා ගිවිසුම් සකස් කිරීම.

- ශ්‍රී ලංකාව සඳහා වූ පෘථුල ජාතික ජෛව සුරක්ෂිත හා ජෛව ආරක්ෂිත රාමු සටහන සහ ව්‍යවස්ථාව ස්ථාපිත කිරීම පිළිබඳව පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

- කොළඹ, මහනුවර, කරාපිටිය, අනුරාධපුර සහ අම්පාර යන ස්ථානවලදී රසායනාගාර අංශයේ සේවයේ නියුතු කණ්ඩායම් සඳහා ජෛව සුරක්ෂිතතාව හා ජෛව ආරක්ෂිතතාව පිළිබඳ ජාතික මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

- අදාල වෘත්තීය ආයතනවල නියෝජිතයිගෙන් ලබාගත් අදහස් හා යෝජනා සලකා බලා ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියට ඇතුළත් කිරීමට නියමිත මාර්ගෝපදේශ සකස් කිරීම.

ප්‍රධාන කාර්ය සාධන දර්ශක

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| රසායනාගාර උපකරණ සඳහා වූ මූලධන ප්‍රතිපාදන වියදම් කිරීමේ ප්‍රතිශතය | භෞතික ප්‍රගතිය 100% | 100% | 100% | 100% |
| | මූල්‍ය ප්‍රගතිය 100% | 56.6% | 63.22% | 64.16% |
| ස්ථාපිත කරන ලද ප්‍රාදේශීය වෛරස විද්‍යාව පිළිබඳ රසායනාගාර සංඛ්‍යාව | මහනුවර, කරාපිටිය, යාපනය, අනුරාධපුර යන ශික්ෂණ රෝහල්වල මෙන්ම මහරගම අපේක්ෂා රෝහලෙහිද වෛරස විද්‍යාව පිළිබඳ රසායනාගාර ස්ථාපිත කිරීම | - | මහනුවර රෝහලේ ස්ථාපිත කරන ලදී | කරාපිටිය හා අනුරාධපුර රෝහල්වල ස්ථාපිත කරන ලදී. |
| සම්පූර්ණ ස්ථාන සංඛ්‍යාව | ලබා දුන් ජංගම රසායනාගාර සංඛ්‍යාව | 111 | 155 | 135 |
| කරන ලද සම්පූර්ණ පරීක්ෂණ සංඛ්‍යාව | | 120 | 47,773 | 35,565 |
| ප්‍රති ක්ෂුද්‍ර ප්‍රතිරෝධය පිළිබඳ පුහුණු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | දිවයින පුරා විවිධ ප්‍රේක්ෂකයින් ඉලක්ක කරගත් AMR පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් මාලාව ක්‍රියාත්මක කිරීම | පුද්ගලයින් 86 දෙනෙකු පුහුණු කරන්නන් වශයෙන් පුහුණු කිරීම | පුද්ගලයන් 123 දෙනෙකු පුහුණු කරන්නන් වශයෙන් පුහුණු කිරීම | විවිධ කණ්ඩායම්වලට අයත් 6965 දෙනෙකු පුහුණු කිරීම |
| AMR පිළිබඳව පොදු ජනතාව දැනුවත් කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සකස් කිරීම | දිවයින පුරා විවිධ ප්‍රේක්ෂකයින් ඉලක්ක කරගත් AMR පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් මාලාව ක්‍රියාත්මක කිරීම | අදාල නැත | අදාල නැත | පොදු ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් හා වීඩියෝපට නිපදවීම |
| AMR පිළිබඳ ජාතික ආවේක්ෂණ වැඩසටහන සඳහා සහභාගි වූ ක්‍රියාත්මක ස්ථාන සංඛ්‍යාව | AMR පිළිබඳ ජාතික ආවේක්ෂණ වැඩසටහන ස්ථාපිත කිරීම | අදාල නොවේ | ආවේක්ෂණ වැඩසටහන සඳහා ප්‍රොටෝකෝලයක් සකස් කිරීම | දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථකථනය කිරීම |
| 2017-2018 වාර්තාවට ගෝලීය AMR ආවේක්ෂණය සඳහා ශ්‍රී ලංකාවේ දත්ත ලබාදීම | GLASS හි සාමාජිකත්වය ලබා ගැනීම | අදාල නැත | අදාල නැත | ශ්‍රී ලංකාව GLASS හි සාමාජිකයෙකි |
| ජෛව-සුරක්ෂිතතාව ජෛව - ආරක්ෂිතතාව පිළිබඳ පුහුණු වූ සංඛ්‍යාව | ජාතික මට්ටමේ විස්තීර්ණ පුහුණු වැඩසටහන සඳහා පුහුණු කරන්නන් පුහුණු කිරීම | අදාල නැත | අදාල නැත | 525 දෙනෙකු පුහුණු කරන ලදී |

### 3.13.2 ජාතික රුධිර පාරවිලයන සේවාව

දිවයින පුරා රුධිර පාරවිලයන සේවාවන් ලබාදීම සම්බන්ධයෙන් වගකීම දරනු ලබන්නේ මෙම අංශය මඟිනි. ප්‍රජා පාදක රුධිර ප්‍රදාන වැඩසටහන් හා රෝහල් රුධිර බැංකු වලින් රුධිරය එකතු කිරීම, එකතු කරන ලද රුධිරය රුධිර සංඝටක ලෙස සකස් කිරීම, එකතු කරන ලද රුධිරය පාරවිලයනය මඟින් වාහක විය හැකි ආසාදන සඳහා පරීක්ෂා කිරීම හා රුධිරය කාණ්ඩගත කිරීම, සුදුසු තත්ත්ව යටතේ රුධිර සංඝටක ගබඩා කිරීම හා ප්‍රවාහනය කිරීම රජයේ හා පෞද්ගලික අංශයේ රෝහල්වල සියළුම චිකිත්සීය අවශ්‍යතා සඳහා රුධිරය හා රුධිර සංඝටක ලබාදීම, පාරවිලයන වෛද්‍ය සේවාව හා සම්බන්ධ රෝගීන් කළමනාකරණය සඳහා තාක්ෂණික සහාය ලබාදීම, පාරවිලයනය සහ බද්ධකිරීම සම්බන්ධව චිකිත්සක ක්‍රමවේද (stem සෛල සකස් කිරීම හා සාරය ඇද ගැනීම, චිකිත්සීය ප්ලාස්මාව හුවමාරු කිරීම, autologous PRP ප්‍රතිකාර) HLA Typing හා Gross Matching සඳහා රසායනාගාර සේවාව යන සේවාවන් ලබාදීම ජාතික රුධිර පාරවිලයන සේවාවේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලට ඇතුළත් වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- මැදවච්චියේ ලේ බැංකුව විවෘත කිරීම
- කොළඹ පැවති ජාතික වැඩසටහනේදී 1500 ක් වූ ලේ දෙන්නන් සහ ජංගම ලේ දීමේ වැඩසටහන් සංවිධායකයින්ට අවශ්‍ය පහසුකම් ලබාදීම. පොකුරු මධ්‍යස්ථාන 14 කදී ලේ දන්දීමේ වැඩසටහන් සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලදී.
- ලේ පරිත්‍යාගශීලි ජනතාවගෙන් දළ වශයෙන් 0.5% ක ප්‍රමාණයක් බෝ නොවන රෝග (NCDs) සඳහා පරීක්ෂා කරන ලදී.
- රතු රුධිර සෛල ශීත කිරීම හා දියවීම පිළිබඳ ක්‍රියාවලියේ නිවැරදිතාවය හා සාර්ථකභාවය තහවුරු කිරීම.
- නව අංශයේ ගුණාත්මක කළමනාකරණ ඒකකය පිහිටුවීම, ලේ බැංකු සමූහය (Cord blood bank) සඳහා උපකරණ ලබාදීම, සාම්පල ලේඛනගත කිරීමේ ඒකකය (Sample archiving unit) සහ HLA රසායනාගාරය සඳහා උපකරණ සවිකිරීම හා ක්‍රියාත්මක කරවීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| 24 පැය සේවාව සපයන රෝහල් ලේ බැංකු සංඛ්‍යාව | සියළුම (105) | 70 | 74 | 77 |
| වසරකට එකතු කරන මුළු රුධිර ප්‍රමාණය | > 400,000 | 414,175 | 423,668 | 417,000 |
| අළුතින් ස්ථාපිත කරන ලද ලේ බැංකු සංඛ්‍යාව | නව අවශ්‍යතා මත තීරණය කෙරේ | 2 | 2 | 1 |
| චිකිත්සීය මූලාක්ෂරලෝප (therapeutic apheresis) සේවාව සපයන ලේ බැංකු සංඛ්‍යාව | සේවාව පුළුල් කිරීම මත රඳා පවතී | 26 | 29 | 31 |

### 3.13.3 සෞඛ්‍ය සේවාවන්ගේ ගුණාත්මක හා සුරක්ෂිතතාවය

අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම මගින් ආයතනික ගුණාත්මක කළමනාකරණ ඒකක ශක්තිමත් කිරීම සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ ගුණාත්මක හා සුරක්ෂිතතාවය සඳහා වූ අධ්‍යක්ෂ ඒකකයේ වගකීම වේ. එමෙන්ම ගුණාත්මක හා සුරක්ෂිතතාවය පිළිබඳ ආයතනික කාර්ය මණ්ඩලයට පුහුණුව ලබාදීම මගින් ධාරිතා සංවර්ධනය, මාර්ගෝපදේශ පිළියෙල කිරීම හා ජාතික සායනික මාර්ගෝපදේශ සංශෝධනය කිරීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව ජාත්‍යන්තරව පිළිගත් මට්ටමට වැඩිදියුණු කිරීමේ ප්‍රමිතීන් (accreditation standards ) පිළියෙල කිරීම ආදියද ක්‍රියාත්මක කෙරේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- රේඛීය අමාත්‍යාංශයේ ආයතනවල ප්‍රමිති කළමනාකරණ ඒකකවල කාර්තුමය කාර්ය සාධන සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- පළාත් අමාත්‍යාංශ ආයතනවල ප්‍රමිති කළමනාකරණ ඒකකවල මධ්‍යකාලීන සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- රේඛීය අමාත්‍යාංශයේ ආයතනවල මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සහ වැඩ දියුණු කිරීමේ කණ්ඩායම්වල සාමාජිකයන් පුහුණු කිරීම
- රෝගීන්ගේ සුරක්ෂිතතාවය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- 5S , CQI සහ TQM පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආයතන සඳහා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රමිති අවශ්‍යතා පිළියෙල කිරීම

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| රේඛීය අමාත්‍යාංශයේ ආයතන 47 ප්‍රමිති කළමනාකරණ ඒකකවල කාර්තුමය කාර්ය සාධන සමාලෝචන රැස්වීම් පැවැත්වීම | වසරකට 4 | 4 PRM | 4 PRM | 3 PRM |
| පළාත් අමාත්‍යාංශ ආයතනවල ප්‍රමිති කළමනාකරණ ඒකකවල මධ්‍යකාලීන සමාලෝචන රැස්වීම් පැවැත්වීම | වසරකට 2 | 1 DPRM | 2 DPRM | 2 DPRM |
| 5S , CQI සහ TQM පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | වසරකට 3 | වැඩසටහන් 5 | වැඩසටහන් 3 | වැඩසටහන් 3 |
| රෝගීන්ගේ සුරක්ෂිතතාවය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම | වසරකට 4 | සැලසුම් කර නොමැත | වැඩසටහන් 3 | වැඩසටහන් 3 |

### 3.13.4 මහජන පශු වෛද්‍ය සේවාවන්

මෙරට පශු වෛද්‍ය සේවාවන් සඳහා වගකියනු ලබන අමාත්‍යාංශයේ ජාතික මට්ටමේ ආයතනය වනුයේ මහජන පශු වෛද්‍ය සේවාවය.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ජලභීතිකාව වැළැක්වීම පිළිබඳව ප්‍රජා මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් තුනක් පැවැත්වීම
- PET පිරිවැය ඵලදායි සේවාස්ථ පුහුණු වැඩසටහන් සහ දිස්ත්‍රික් මට්ටමේ ජලභීතිකා මර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචන රැස්වීම් පැවැත්වීම

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | 4 | 4 | 4 | 1 |
| පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | - | 67 | 33 | 5 |
| ප්‍රදර්ශන ශාලාවට පැමිණි ආගන්තුක පුද්ගල සංඛ්‍යාව | - | 4,820 | 7,020 | 7,420 |
| බෙදාහරින ලද අත්පත්‍රිකා සංඛ්‍යාව | - | 17,370 | 25,070 | 26,470 |
| දැනුවත් කිරීමේ වැඩසටහන හරහා ආවරණය වූ පාසැල් සිසුන් සංඛ්‍යාව | - | 12,550 | 18,050 | 19,050 |

### 3.13.5 වෛද්‍ය සංඛ්‍යා ලේඛණ ඒකකය

වෛද්‍ය සංඛ්‍යා ලේඛන ඒකකය, අමාත්‍යාංශයේ සෞඛ්‍ය ආයතන ලැයිස්තුව යාවත්කාලීන කිරීමේ වගකීම දරනු ලැබේ. ඒ අනුව, 2018 වර්ෂය සඳහා ආයතනයේ නම, වර්ගය, පවතින පහසුකම්, අයිතිය, ආයතන ප්‍රධානියා හා ඇමතුම් විස්තර සහිතව ආයතන ලැයිස්තුව සම්පූර්ණ කර ඇත.

වාර්ෂික සෞඛ්‍ය වාර්තාව (Annual Health Bulleting) සඳහා දත්ත රැස්කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම සහ ග්‍රන්ථය මුද්‍රණය කර නිකුත් කිරීම මෙම ඒකකයේ තවත් ප්‍රධාන කාර්යභාරයකි. මේ වන විට ග්‍රන්ථයේ පරිච්ඡේද පිළියෙල කෙරෙමින් පවතී. වාර්ෂික සෞඛ්‍ය වාර්තාව සඳහා අවශ්‍ය දත්ත Indoor Mobility and Mortality Return, බාහිර රෝගී අංශවල තොරතුරු (OPD return), සායනික තොරතුරු කාර්තුමය වශයෙන් ලබාගනී. එමෙන්ම මාතෘ හා මුඛ සෞඛ්‍ය දත්ත මාසිකව රැස්කරන අතර ඇඳන් සංඛ්‍යාව, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය හා විශේෂඥවරුන් පිළිබඳ දත්ත රාජ්‍ය අංශයේ සියළුම සෞඛ්‍ය ආයතනවලින් සෑම වසරකම දෙසැම්බර් 31 දිනට ලබා ගනු ලැබේ. දිවයින පුරා රෝහල්වල ආරම්භ කර ඇති eIMMR ක්‍රමවේදය සාර්ථකව ක්‍රියාත්මක කෙරේ. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (MOH) කලාප අනුව 2018 වසර සඳහා වසර මැද ජනගහන ඇස්තමේන්තු සකස් කිරීමද සාර්ථකව සිදු කරන ලදී.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- 2018 වර්ෂය සඳහා සෞඛ්‍ය ආයතනවල නම, වර්ගය, පවතින පහසුකම්, අයිතිය, ආයතන ප්‍රධානියා හා සම්බන්ධකර ගැනීමේ තොරතුරු ඇතුළත් සෞඛ්‍ය ආයතන ලැයිස්තුව සම්පූර්ණ කරන ලදී

- 2016 වාර්ෂික සෞඛ්‍ය සංඛ්‍යා ලේඛණ සහ 2016 වාර්ෂික සෞඛ්‍ය වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. 2017 වාර්ෂික සෞඛ්‍ය වාර්තාවේ පරිච්ඡේද පිළියෙල කෙරෙමින් පවතී

- eIMMR පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ධාරිතාවය පවතින ශ්‍රී ලංකාවේ සියළුම රෝහල්වල එය ක්‍රියාත්මක කිරීම

- දත්ත ලබා ගැනීමට ඉල්ලුම් කරන ලද සියළුම ආයතන සඳහා නියමිත වේලාවට දත්ත ලබාදීම

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| යාවත්කාලීන කරන ලද සෞඛ්‍ය ආයතන ලැයිස්තුව | සම්පූර්ණ ලැයිස්තුව පිළියෙල කිරීම | 2016 සඳහා සෞඛ්‍ය ආයතන සම්පූර්ණ ලැයිස්තුව පිළියෙල කරන ලදී | 2017 සඳහා සෞඛ්‍ය ආයතන සම්පූර්ණ ලැයිස්තුව පිළියෙල කරන ලදී | 2018 සඳහා සෞඛ්‍ය ආයතන සම්පූර්ණ ලැයිස්තුව පිළියෙල කරන ලදී |
| වාර්ෂික සෞඛ්‍ය වාර්තාව | වාර්ෂික සෞඛ්‍ය වාර්තාව ප්‍රකාශයට පත් කිරීම | 2014 වාර්ෂික සෞඛ්‍ය වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී | 2015 වාර්ෂික සෞඛ්‍ය වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී | 2016 වාර්ෂික සෞඛ්‍ය වාර්තාව සහ වාර්ෂික සෞඛ්‍ය සංඛ්‍යාලේඛණ ප්‍රකාශයට පත් කරන ලදී |
| eIMMR පද්ධතිය | මෙම පද්ධතිය ආරම්භ කිරීමට හැකියාව සහිත ශ්‍රී ලංකාවේ සියළුම රෝහල්වල එය ක්‍රියාත්මක කිරීම | අළුතින් රෝහල් 124 ක ක්‍රියාත්මක කෙරිණි | අළුතින් රෝහල් 65 ක ක්‍රියාත්මක කෙරිණි | අළුතින් රෝහල් 24 ක ක්‍රියාත්මක කෙරිණි (2018 අවසානය වන විට දිවයිනේ රෝහල් 513 ක මෙම පද්ධතිය ක්‍රියාත්මක වේ.) |
| ශ්‍රී ලංකාවේ සෑම MOH කලාපයකට ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ (GN) ලැයිස්තුව හා වසරමැද ජනගහන ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම | සෑම වසරකම ශ්‍රී ලංකාවේ සෑම MOH කලාපයකම පිහිටි ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ (GN) ලැයිස්තුව යාවත්කාලීන කිරීම සෑම වසරකම MOH කලාපවල වසරමැද ජනගහන ඇස්තමේන්තුව පිළියෙල කිරීම | 2016 වසර සඳහා ශ්‍රී ලංකාවේ සෑම MOH කලාපයකම පිහිටි ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ (GN) ලැයිස්තුව යාවත්කාලීන කිරීම 2016 වසර සඳහා MOH කලාපවල වසරමැද ජනගහන ඇස්තමේන්තුව පිළියෙල කිරීම | 2017 වසර සඳහා ශ්‍රී ලංකාවේ සෑම MOH කලාපයකම පිහිටි ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ (GN) ලැයිස්තුව යාවත්කාලීන කිරීම 2017 වසර සඳහා MOH කලාපවල වසරමැද ජනගහන ඇස්තමේන්තුව පිළියෙල කිරීම | 2018 වසර සඳහා ශ්‍රී ලංකාවේ සෑම MOH කලාපයකම පිහිටි ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශ (GN) ලැයිස්තුව යාවත්කාලීන කිරීම 2018 වසර සඳහා MOH කලාපවල වසරමැද ජනගහන ඇස්තමේන්තුව පිළියෙල කිරීම |

### 3.13.6 ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මහජනතාව වෙත මිලදී ගැනීමට වෙළඳපලේ පවතින ඖෂධ සහ වෛද්‍ය උපකරණවල ගුණාත්මකභාවය අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලබව මෙන්ම මෙම අයිතමයන් නිෂ්පාදනය, වෙළඳාම හා බෙදාහැරීම පවතින ව්‍යවස්ථානුකූල රාමුවතුළ සිදුවන බව තහවුරු කිරීම සඳහා ක්‍රියාකරන ආයතනය වන්නේ ජාතික ඖෂධ නියාමන අධිකාරියයි. අධිකාරිය මඟින් ඉටුකරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ: නව ඖෂධ/ රූපලාවන්‍ය ද්‍රව්‍ය / වෛද්‍ය උපකරණ ලියාපදිංචි කිරීම, දැනටමත් අනුමත වී ඇති හා වෙළඳාම සඳහා අනුමැතිය ලැබී ඇති මෙම නිෂ්පාදනවල වෙනස්කම් / වෙනස්වීම් අනුමත කිරීම හා මෙහෙයවීම, ඖෂධ නිෂ්පාදන හා රූපලාවන්‍ය ද්‍රව්‍ය සඳහා යහපත් නිෂ්පාදන පුරුදු (Good Manufacturing Practices) ක්‍රියාත්මක කිරීම හා මෙහෙයුම, ආනයනය, නිෂ්පාදනය, විකිණීම, ප්‍රචාරණය සඳහා බලපත්‍ර ලබාදීම, වෙළඳපලේ ඇති ඖෂධ බෙදාහැරීමේ ආවේක්ෂණයේ ගුණාත්මකභාවය, රූපලාවන්‍ය ද්‍රව්‍ය/ ඖෂධ/ උපකරණ (CDD) පිළිබඳ වෙළඳ ප්‍රචාරක දැන්වීම් සමාලෝචනය හා අනුමත කිරීම, සායනික පරීක්ෂණ අනුමත කිරීම හා මෙහෙයුම, අපනයනය අරමුණු කරගත් ඖෂධ නිෂ්පාදන පිළිබඳ WHO ආකෘතිය අනුව සහතික පත්‍ර නිකුත් කිරීම, සුරක්ෂිතතාවය පිළිබඳව සොයාබැලීම සඳහා වෙළඳපලේ ඇති රූපලාවන්‍ය ද්‍රව්‍ය, ඖෂධ හා උපකරණ ලබාගැනීම, මානව සම්පත් සංවර්ධන වැඩසටහන් හා හදිසි වැටලීම් කටයුතු මෙන්ම චෝදනා ඉදිරිපත් කිරීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ලියාපදිංචි කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම, යහපත් නිෂ්පාදන පුරුදු සම්බන්ධයෙන් දේශීය කර්මාන්ත 47 ක් සහ විදේශීය කර්මාන්ත 7 ක් නිරීක්ෂණය කිරීම සහ WHO සහතික පත්‍ර 23 ක් නිකුත් කිරීම

- 2017.10.10 දිනැතිව ලැබුණු අමාත්‍ය මණ්ඩල ඇනුමැතිය අනුව රූපලාවන්‍ය නිෂ්පාදන ලියාපදිංචිය හා බලපත්‍ර ලබාදීම

- ඖෂධ අනිසි ලෙස භාවිතා කිරීමට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම ( උදා - Tramadol, Pregablin)

- අනිසි ලෙස භාවිතා කරන ඖෂධ හඳුනා ගැනීමේ හා හසුරුවීමේ ධාරිතාවය ඉහළ නැංවීමට විශේෂ කාර්ය බලකාය (STF) හා පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ නිලධාරීන් සමඟ එක්ව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම

- ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාවේ ඇති නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ පශ්චාත් වෙළඳපල ආවේක්ෂණය

- විවිධ දේශීය මෙන්ම විදේශීය පුහුණු/ වැඩමුළු ඔස්සේ මානව සම්පත සංවර්ධනය

- විශේෂ කණ්ඩායම් හා පොදු ජනතාව වෙත අධිකාරියේ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු සැපයීම

- ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාවේ ඇති නිෂ්පාදන සඳහා අදාලවන මාර්ගෝපදේශ, නිර්දේශයන්, මඟ පෙන්වීම් හා නියමයන් නිකුත් කිරීම, සමාලෝචනය හා යාවත්කාලීන කිරීම

## 3.14 වෛද්‍ය- නීති සේවාවන්

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරි යටතේ පාලනය වන වෛද්‍ය නීති වගකීම් කළමනාකරණය කරනු ලබන ප්‍රධාන ආයතනය අධිකරණ වෛද්‍ය සහ විෂවේදය ආයතනයයි. දිවයින පුරා පිහිටි විවිධ රෝහල්වල නම් කරන ලද වෛද්‍ය නිලධාරීන් හා ව්‍යවහාරික විශේෂඥවරුන් විසින් වෛද්‍ය - නීති සේවාවන් හසුරුවනු ලැබේ. රෝගීන්ගේ, හදිසි අනතුරුවලට ලක්වූවන් හා වූදිතයන්ගේ, මළසිරුරු කපා පරීක්ෂා කර මරණයට හේතුව සෙවීම සහ ඒ හා සම්බන්ධ ගැටළු ආදී වෛද්‍ය - නීති පරීක්ෂණ පැවැත්වීම, ව්‍යවහාරික දන්ත විද්‍යා විශේෂඥයින්ගේ උපදෙස් ලබාදීම, අධිකරණ පටක - ව්‍යාධිවේද රසායනාගාර සේවා විෂ ද්‍රව්‍ය විශ්ලේෂණය හා අනෙකුත් රසායනාගාර සේවා, වෛද්‍යවරුන් සඳහා පශ්චාත් උපාධි පුහුණුව හා සේවාස්ථ පුහුණුව, යුක්තිය පසඳලීමේ සේවා පද්ධතියේ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා පුහුණුව සහ පොදු ජනතාව (පාසැල් සිසුන් හා දෙමව්පියන්) දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ ව්‍යවහාරික වෛද්‍ය විද්‍යා ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ව්‍යවහාරික පටක ව්‍යාධි විද්‍යාවේ (histopathology) ගුණාත්මකභාවය හා ප්‍රමාණය ඉහළ නැංවීම
- ජාතික ආපදා කළමනාකරණ මාර්ගෝපදේශ සහ පටක ව්‍යාධි විද්‍යාවේ මානව විද්‍යා සේවාවන්
- අමාත්‍යාංශ වෙබ් අඩවිය යටතේ ආයතනික වෙබ් අඩවිය දියත් කිරීම (www.ifmt.health.gov.lk)
- ආපදා සහ විපත්තිවලින් මියයන්නන්ගේ මෘතදේහයන් පිළිබඳ වෛද්‍ය නීතිමය කළමනාකරණය ප්‍රමිතිකරණය

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| පරීක්ෂා කරන ලද රෝගීන් සංඛ්‍යාව | | 12,351 | 11,573 | 11,595 |
| මෘත දේහ කපා පරීක්ෂා කරන ලද සංඛ්‍යාව | | 1,458 | 1,534 | 1,686 |
| පරීක්ෂා කරන ලද දන්ත රෝගීන් සංඛ්‍යාව | | 272 | 239 | 233 |
| සකස් කරන ලද පටක විද්‍යා කදා (slides) සංඛ්‍යාව | | 4,711 | 6,120 | 7,442 |
| රසායනාගාර පරීක්ෂණ සංඛ්‍යාව | | 1,825 | 1,457 | 1,604 |
| වෛද්‍යවරුන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | | 16 | 10 | 14 |

## 3.15 ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග පාලන සේවාවන්

ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන රෝග/ඒඩ්ස් (STD / AIDS) වැළැක්වීමේ වැඩසටහන් හා සම්බන්ධව ක්‍රියාකරන ප්‍රධාන ආයතනය ජාතික STD / AIDS මර්ධන වැඩසටහනය (NSACP) වේ. එහි ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ: එච්.අයි.වී. (HIV) වසංගතය සඳහා ජාතික ප්‍රතිචාර දැක්වීම සම්බන්ධීකරණය හා සහභාගීත්වය, එච්.අයි.වී. වැළැක්වීමේ මැදිහත්වීම් (intervention) සිදු කිරීම, STI සහ HIV වැළැක්වීමට සුදුසු පරිසරය ඇතිකිරීමට සහායවීම, STI සඳහා සායනික සේවාවන් ලබාදීම, HIV ආසාදිත හා බලපෑම් සහිත පුද්ගලයන් සඳහා අවශ්‍ය ප්‍රතිකාර හා සේවාවන් ලබාදීම, STIL හා HIV සඳහා රසායනාගාර සේවා ලබාදීම, STI සහ HIV වැළැක්වීම සඳහා කොණ්ඩම් භාවිතය ප්‍රවර්ධනය, STI සහ HIV සඳහා උපදේශන සේවාවන් සැපයීම, මවගෙන් දරුවාට HIV හා උපදංශය සම්ප්‍රේෂණයවීම වැළැක්වීම, සෞඛ්‍ය හා සෞඛ්‍ය නොවන කාර්ය මණ්ඩලය පුහුණුව හා ධාරිතා වර්ධනය, HIV හා STI ආවේක්ෂණය සහ පර්යේෂණ සිදුකිරීම, STI සහ HIV සේවාවන් අධීක්ෂණය හා ඇගයීම, STI සහ HIV පිළිබඳ ක්‍රමෝපාය තොරතුරු බෙදා හැරීම, දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය, පරිපාලන කටයුතු හා විශේෂ ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ඉටුකිරීම, අධි අවදානම් ජනතාවට STD සේවාවන් ලබාගැනීම සඳහා ප්‍රවේශවීමේ පහසුකම් වැඩි කිරීම, ලෝක ඒඩ්ස් දිනය නිමිත්තෙන් ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම, සහජ උපදංශය (Congenital syphilis) තුරන් කිරීමේ වැඩසටහන් නොකඩවා පැවැත්වීම, මවගෙන් දරුවාට HIV සම්ප්‍රේෂණයවීම වැළැක්වීම, පාසැල් ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, අන්තර්-අංශ සම්බන්ධීකරණය හා හැසිරීම් රටාව වෙනස්කිරීමේ සන්නිවේදනය සමඟ MARPS සඳහා ඉලක්කගත මැදිහත්වීම් සිදුකිරීම.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ක්ෂේත්‍රයේ හා රෝහල්වල සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා EMTCT පුහුණුව
- ජාතික වලංගුගතකිරීමේ කමිටුවේ (National Validation Committee) උපදේශක රැස්වීම් පැවැත්වීම
- සිංහල හා දමිළ භාෂාවන්ගෙන් මාතෘ හා ළමා (MCH) මාර්ගෝපදේශ මුද්‍රණය කිරීම
- EMTCT පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම සහ දිස්ත්‍රික් මෙහෙයුම් කණ්ඩායම් රැස්වීම් පැවැත්වීම
- ජාතික STD / AIDS මර්ධන වැඩසටහන (NSACP) සහ පවුල් සෞඛ්‍ය කාර්යංශය (FHB) යන ආයතනවල කාර්ය මණ්ඩලය සඳහා දත්ත කළමනාකරණ පිළිබඳ රැස්වීම් පැවැත්වීම
- ලිංගික ශ්‍රමිකයන් අතර HIV වැළැක්වීම සඳහා පොලිස් නිලධාරීන් පුහුණු කිරීමට උපදේශක වැඩමුළු පැවැත්වීම, සුරක්ෂිත ලිංගිකත්වය හා HIV පරීක්ෂණ සිදු කිරීම ප්‍රවර්ධනයට හැසිරීම වෙනස් කිරීමේ සන්නිවේදනය පිළිබඳ යොවුන් සභාවල යොවුන් නිලධාරීන් පුහුණු කරන්නන් වශයෙන් සම්පත්දායක කණ්ඩායමක් පිහිටුවීම, සුරක්ෂිත ලිංගිකත්වය හා HIV පරීක්ෂණ සිදු කිරීම ප්‍රවර්ධනයට හැසිරීම වෙනස් කිරීමේ සන්නිවේදනය පිළිබඳ යොවුන් සභාවල යොවුන් නිලධාරීන් පුහුණු කරන්නන් පුහුණු කිරීම සහ සුරක්ෂිත ලිංගිකත්වය හා HIV පරීක්ෂණ සිදු කිරීම ප්‍රවර්ධනයට හැසිරීම වෙනස් කිරීමේ සන්නිවේදනය පිළිබඳ හමුදා සේවයේ පුහුණු කරන්නන් පුහුණු කිරීම
- ළමා ආරක්ෂණ අධිකාරිය සඳහා සංවේදීකරණ වැඩසටහන්

- ශ්‍රී ලංකා යොවුන් ආයතනයේ යෞවනයන්ගේ දැනුම, ආකල්ප හා සුරක්ෂිත ලිංගික ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ කිරීම

- බස්නාහිර පළාතේ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර අපකීර්තිය හා සම්බන්ධ හැසිරීම තක්සේරු කිරීම

- HIV සඳහා පරීක්ෂා කිරීම ප්‍රවර්ධනයට සාක්කු කැලැන්ඩර් නිර්මාණය කිරීම සහ 30000 ක් මුද්‍රණය කිරීම

- වෛද්‍ය නිලධාරීන් හා හෙද නිලධාරීන් සඳහා STD / HIV උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම

- NSACP හි 2017 වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම

- විද්‍යුත් තොරතුරු කළමනාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| සජීවී උපත් 100,000 කට HIV වල වාර්තාගත MTCT අනුපාතිකය | < 50 | 1 | 0 | 0 |
| HIV වැළැක්වීමේ වැඩසටහන් සඳහා සහභාගි වූ කාන්තා ලිංගික ශ්‍රමිකයන්ගේ සංඛ්‍යාව | 11,400 | 2,361 | 7,927 | - |
| යටපත් වී ඇති වෛරස ප්‍රමාණය සමඟ PLHIV ප්‍රතිශතය | 95 | 90 | 93 | 92 |
| ART පිළිබඳ PLHIV ප්‍රතිශතය | > 90 | 90 | 90 | - |
| HIV වැළැක්වීමේ වැඩසටහන කරා ළඟා වූ MSM සංඛ්‍යාව | 8,637 | - | 2,561 | - |

## 3.16 වෛද්‍ය සැපයුම් සේවාවන්

ඖෂධ, ශල්‍ය අයිතමයන්, රසායනාගාර අයිතමයන්, විකිරණශීලී අයිතමයන්, මුද්‍රිත ද්‍රව්‍ය ආදිය සැපයීම සහ එම ද්‍රව්‍ය සෞඛ්‍ය සේවා ආයතන අතර බෙදා හැරීම සිදුවනතෙක් ගබඩා කර තැබීම වෛද්‍ය සැපයීම් අංශයේ (MSD) වගකීම වේ. සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය කරමින් ප්‍රාදේශීය ගබඩා 26 ක් පිහිටුවා ඇත. තවද පෞද්ගලික අංශයෙන් ලබාගැනීමට නොහැකි අන්තරායකර ඖෂධ සහ අත්‍යාවශ්‍ය වෛද්‍ය අයිතමයන් ලබාදීමද මෙම (MSD) අංශයේ වගකීම වේ. මධ්‍යම මට්ටමේ, උප මට්ටමේ සහ ආයතනික මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධනය, උපකරණ හා වාහන, ගුණාත්මක හා සුරක්ෂිතතාව සංවර්ධනය, ධාරිතා වර්ධනය, සැපයුම් දාම කළමනාකරණය මෙහෙයුම, පර්යේෂණ හා සාක්ෂි පාදක කරගත් කළමනාකරණය ආදිය වෛද්‍ය සැපයීම් අංශයේ අනෙකුත් ප්‍රධාන කාර්යයන් වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- වෛද්‍ය සැපයීම් අංශයේ විවිධ ඒකක වල ඉදිකිරීම, අළුත්වැඩියාවන්, පුළුල් කිරීම් සහ වෙනස් කිරීම කටයුතු සිදු කරන ලදී

- දිගන, වැලිසර හා අංගොඩ උප ගබඩාවල යටිතල පහසුකම් සංවර්ධනය

- දිවයින පුරා ප්‍රතිකාරක සේවා ආයතනවල සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශවල (RMSDs) ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම

- MSMIS ව්‍යාපෘතිය පර්යන්ත ආයතන දක්වා පුළුල් කිරීම

- වෛද්‍ය සැපයීම් අංශයේ කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම

- සැපයුම් දාම කළමනාකරණය සහ යථාර්ථ නිරූපිත ඇස්තමේන්තුගත කිරීම වැඩිදියුණු කිරීම පිළිබඳ දැනුවත් කිරීම සඳහා සියළුම ආයතනවල DTC කමිටු ස්ථාපිත කිරීම

- ප්‍රතිකාරක සේවා ආයතනවල ගබඩා පහසුකම් වැඩිදියුණු කිරිම පිළිබඳ පර්යේෂණ හා අධ්‍යයනයන් සිදු කිරීම ධෛර්යමත් කිරීම

## 3.17 ජීව වෛද්‍ය ඉංජිනේරු සේවාවන්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගැනීම, සවිකිරීම, කම්සදනය කිරීම (Commissioning) සහ නඩත්තු කිරීම යන කටයුතු සිදු කෙරේ. තවද, මෙම අංශය මඟින් පළාත් සෞඛ්‍ය ආයතනවල වෛද්‍ය උපකරණ අවශ්‍යතා සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දේ. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවාවේ (BES) ප්‍රධාන කාර්යයන් හා වගකීම් වන්නේ : වෛද්‍ය උපකරණ මිලදී ගැනීම, වෛද්‍ය උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව, උපකරණ භාවිතා කරන්නන් සහ කාර්මික කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ වෛද්‍ය උපකරණ පිළිබඳ දේශීය/ විදේශීය තාක්ෂණික විශේෂඥතාවයක් ලබාදීමයි. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයේ වැඩපොල පහසුකම්, උපකරණ හා අමතර කොටස් සඳහා ගබඩා පහසුකම් සහ පරිපාලන කටයුතු සිදු කෙරේ. වෛද්‍ය උපකරණ වට්ටෝරු කළමනාකරණ පද්ධතිය (Medical Equipment Inventory Management System) සඳහා අන්තර්ජාලය පදනම් කරගත් මෘදුකාංගයක් සකස් කිරීම ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය මඟින් ආරම්භ කර ඇත.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- ප්‍රසම්පාදනය තුළින් රේඛීය අමාත්‍යාංශයේ රෝහල් සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ කලට වේලාවට ලබාදීම සහතික කිරීම.

- ප්‍රසම්පාදනය තුළින් අමතර කොටස් සහ අනෙකුත් අවශ්‍ය කොටස් ලබාදීම සහතික කිරීම.

- රේඛීය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ආයතනවල වෛද්‍ය, දන්ත හා රසායනාගාර උපකරණ දිනපතා නඩත්තු කිරීම සහ ඒවා කැඩුණු අවස්ථා වලදී පැය 24 ක් ඇතුළත ඒවා යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කිරීම.

- අදාල නිලධාරීන් පුහුණුව සහ උපකරණ භාවිත කරන්නන් පුහුණු කිරීම සම්බන්ධීකරණය.

- අමාත්‍යාංශයට සහ පළාත් සභා ආයතනවලට අවශ්‍ය තාක්ෂණික මඟපෙන්වීම ලබාදීම.

- පළාත්සභා සෞඛ්‍ය ආයතන වෙත වෛද්‍ය උපකරණ මිලදී ගැනීමට සහාය වීම.

## 3.18 කළමනාකරණ, සංවර්ධන හා සැලසුම් සේවාවන්

### 3.18.1 සැලසුම් අංශය

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ කළමණාකරණ, සංවර්ධන හා සැලසුම් ඒකකය යටතේ පවතින ප්‍රධානතම අධ්‍යක්ෂක අංශය වන්නේ සැලසුම් ඒකකයයි. සර්ව සෞඛ්‍ය ආවරණය ළඟාකර ගැනීමට සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමේ අරමුණින් මධ්‍යම මෙන්ම පළාත් මට්ටමේ සෞඛ්‍ය සැලසුම් කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය හා සබැඳි ක්‍රියාකාරකම් සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන කේන්ද්‍රීය ආයතනය සැලසුම් අංශය වේ. සෞඛ්‍ය සංවර්ධන සැලසුම් සකස් කිරීම (මහ සැලැස්ම, පස්-අවුරුදු සෞඛ්‍ය සංවර්ධන සැලසුම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම) හා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය, මධ්‍යම මෙන්ම පළාත් සෞඛ්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය වැඩිදියුණු කිරීමට සහායවීම, සෞඛ්‍ය පද්ධතිය සංවර්ධනය හා සම්බන්ධ කටයුතුවලට සහාය වීම, සැලසුම්කරණ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික මඟපෙන්වීම හා සහාය වීම සහ මධ්‍යම හා පළාත් මට්ටමේ සෞඛ්‍ය සැලසුම්කරණය හා කළමණාකරණය සඳහා අවශ්‍ය ධාරිතා වර්ධනයට අවශ්‍ය සහාය ලබාදීම සැලසුම් අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලට ඇතුලත් වේ.

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

- 2018 වර්ෂයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අදාල ආයතන වෙත ලබා දෙන ලදී. එයට අමතරව පළාත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්ද ඒවායේ ප්‍රගතිය සොයා බැලීමේ අරමුණින් එකතු කර ගන්නා ලදී. අමාත්‍යාංශයේ 2017 වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

- මෙරටට පැමිණි හා විදේශීය විශේෂඥවරු අමුත්තන් විශේෂඥවරුන්, පුහුණුවන්නන්, රාජ්‍ය නොවන සංවිධාන සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය ඇතුළුව අනෙකුත් අදාල අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය.

- නව ව්‍යාපෘති යෝජනා 23 ක් සැලසුම් අංශය වෙත ලැබුණු අතර එයින් 08 ක් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරන ලදී.

- පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධතා ගිවිසුම් (MoUs) දෙකක් අමාත්‍යාංශය හා අදාල පරිත්‍යාගශීලීන් අතර අත්සන කරන ලදී.
    - යාපනය ශික්ෂණ රෝහලේ තෙමහල් පුනරුත්ථාපන මධ්‍යස්ථානය ඉදිකිරීම හා උපකරණ සැපයීම සහ තෙවර්ෂ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම. (Sing Health Project)
    - කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකය සඳහා දස මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම. (COC Project)

- ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ අභිනවයෙන් ස්ථාපිත වෛද්‍ය පීඨයේ සිසුන් සඳහා සායනික පුහුණුව ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීමට රත්නපුර පළාත් මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස උසස් කරන ලදී.

- රේඛීය අමාත්‍යාංශයේ සියළුම ආයතනවල කාර්ය මණ්ඩල සංශෝධනය සිදු කෙරෙමින් පවතී. “මානව සම්පත් පැතිකඩ” යන මාතෘකාව යටතේ 2017.12.31 දිනට සහ 2018 ජනවාරි 1

වැනිදා සිට ජූනි 30 දක්වා වාර්තා දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී. විශේෂඥ වෛද්‍යවරුන් සඳහා කාර්ය මණ්ඩල නිර්ණය ආරම්භ කරන ලදී.

- බස්නාහිර හා වයඹ පළාත්වලද රේඛීය අමාත්‍යාංශයේ ආයතනවලද සෞඛ්‍ය සැලසුම් කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්විණි.

- මාතර දිස්ත්‍රික් මාතෘ හා නව ජන්ම සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය හරහා මාතෘ හා නව ජන්ම සෞඛ්‍ය සේවාවන්හි විශේෂිතවූ තෘතියික යොමු කිරීමේ රෝහලක් ලෙස මාතර, ගොඩගම, කොරියා - ශ්‍රී ලංකා මිත්‍රත්ව රෝහල (KSFH) වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.

- SDG ඉලක්ක වැඩිදියුණු කිරීමට උපදේශක රැස්වීම් දෙකක් පැවැත්වූ අතර ජාතික ඒකමතිකභාවය ලබාගැනීමේ වැඩමුළුව පවත්වා SDG ඉලක්ක සම්පූර්ණ කර ගන්නා ලදී.

### 3.18.2 ජාත්‍යන්තර සෞඛ්‍ය

ජාත්‍යන්තර සෞඛ්‍ය ඒකකයේ වගකීම වනුයේ විදේශාධාර ලැබෙන සැලසුම් සකස් කිරීම ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම මඟින් සම්බන්ධීකරණය කිරීම සහ විදේශ පුහුණුව සඳහා යන නිලධාරීන් හා සම්බන්ධ කටයුතු කිරීම, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාල සියළුම විදේශ ගමන් සම්බන්ධීකරණය සහ විදේශ විශේෂඥයන්, අමුත්තන්, උපදේශකයින්, පුහුණුකරුවන්, රාජ්‍ය නොවන සංවිධාන (NGOS) වල චාරිකා සඳහා තාක්ෂණික සහාය ලබාදීම, විදේශ කටයුතු අමාත්‍යාංශය වැනි අනෙකුත් අදාල අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය හා සෞඛ්‍ය හා සම්බන්ධ ජාත්‍යන්තර සෞඛ්‍ය කටයුතු සම්බන්ධීකරණය සහ ශ්‍රී ලංකාවට අයත් වෙනත් අදාල කටයුතු වේ.

- 2018/19 WHO ද්විවාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- 2018/19 UNICEF ද්විවාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- 2018/19 UNFPA ද්විවාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|
| අනුමත සහ ආධාරක ආයතනය වෙත යොමු කරන ලද ක්‍රියාකාරකම් යෝජනා සංඛ්‍යාව | 100 | WHO 281 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 192,006,751) | | WHO - 128 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 155,332,674.00) |
| | 10 | වෙනත් ප්‍රභව - 28 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 41,286,772.00) | | වෙනත් ප්‍රභව - 10(වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 44,978,548.00) |
| | 20-25 | UNFPA - 62 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 10,252,179.14) | UNFPA - 26 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 6,265,640.00) | UNFPA - 12 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 2,684,263.80) |
| | 30 | UNICEF - 40 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 24,212,809.33) | UNICEF - 36 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 12,554,588.38) | UNICEF - 11 (වෙන්කරන ලද මුදල් ප්‍රමාණය රු. 2,511,343.57) |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රගති සමාලෝචන රැස්වීම් සංඛ්‍යාව | WHO - 03<br>UNFPA - 02<br>UNICEF - 02 | WHO - 03<br>UNFPA - 02<br>UNICEF - 02 | WHO - 03<br>UNFPA - 02<br>UNICEF - 02 | WHO - 02<br>UNFPA - 01<br>UNICEF - 01 |
| WHO යෝජනා ලිවීමේ වැඩමුළු සංඛ්‍යාව | 03 | - | - | දෙදින වැඩමුළු 02 |
| සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්ට විදේශ පුහුණු ලබාදීම | - | - | නිලධාරීන් 737 දෙනෙකුට විදේශ පුහුණු 251 ක් ලබාදෙන ලදී. | 995 දෙනෙකුට විදේශ පුහුණු 305 ක් ලබාදෙන ලදී. |
| වීසා සහ අනුමැතිය ලබා දීම සඳහා සහාය වීම | - | - | වීසා - 35<br>අනුමැතිය - 47 | වීසා - 30<br>අනුමැතිය - 46 |

## 3.19 මූල්‍යමය සේවාවන්

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය සැලසුම්කරණය, පොත් තැබීම් හා මූල්‍ය වාර්තාකරණය ඇතුළුව මූල්‍ය කළමණාකරණය සිදුකිරීම මුදල් අංශයේ මූලික වගකීම වේ. මුදල් අංශයේ එක් එක් කටයුතු සඳහා වෙන වෙනම උප අංශ පිහිටුවා ඇත.

### 3.19.1. ප්‍රධාන මූල්‍ය නිලධාරි - II

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

පහත සඳහන් කටයුතු සම්බන්ධයෙන් වියදම් පාලනය :

- යන්ත්‍රෝපකරණ හා උපකරණ අළුත්වැඩියාව
- වාහන අළුත්වැඩියාව
- යන්ත්‍රෝපකරණ, ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම
- නිලධාරී පුහුණුව

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | 2017 | 2018 |
|---|---|---|---|
| අළුත්වැඩියා කරන ලද යන්ත්‍රෝපකරණ හා උපකරණ සංඛ්‍යාව | 100% | 0% | 0% |
| අළුත්වැඩියා කරන ලද වාහන සංඛ්‍යාව | 100% | 100% | 100% |
| මිලදී ගත් උපකරණ සංඛ්‍යාව | 100% | 6% | 80% |
| මිලදී ගත් යන්ත්‍රෝපකරණ හා උපකරණ සංඛ්‍යාව | 100% | 25% | 25% |
| ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදීගත් ප්‍රමාණය | 100% | 100% | 100% |
| පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව | 100% | 90% | 100% |

### 3.19.2 ප්‍රධාන මූල්‍ය නිලධාරි - III

**වසර තුළදී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණයන්:**

පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා වියදම් කළමණාකරණය කිරීම.

- දේශීය අමාත්‍යාංශය, හෙද පුහුණු පාසල් සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය හා රෝග වැළැක්වීමේ සේවා සපයන ආයතනවල වාහන අළුත්වැඩියාව

- යන්ත්‍රෝපකරණ හා උපකරණ

- පරිපාලන හා මූල්‍ය අංශයන්හි කාර්ය මණ්ඩල පුහුණුව

- දේශීය අමාත්‍යාංශය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය හා රෝග වැළැක්වීමේ සේවා සපයන ආයතන සඳහා ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම

- සෞඛ්‍ය ප්‍රවර්ධනය හා රෝග වැළැක්වීමේ සේවා සපයන ආයතනවලට පොත්පත් හා සඟරා මිලදී ගැනීම

**ප්‍රධාන කාර්ය සාධන දර්ශක**

| දර්ශකය | ඉලක්කය | **2016** (රු.මිලියන) | **2017** (රු.මිලියන) | **2018** (රු.මිලියන) |
|---|---|---|---|---|
| වාහන අළුත්වැඩියාව(අමාත්‍යාංශ පරිපාලනය) | - | 36.03 | 35.77 | 38.54 |
| යන්ත්‍රෝපකරණ හා උපකරණ | - | 65.44 | 16.33 | 5.10 |
| පරිපාලන හා මූල්‍ය අංශයන්හි කාර්ය මණ්ඩල පුහුණුව | - | 0.31 | 0.79 | 1.29 |
| දේශීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල්වලට අයත් වාහන අළුත්වැඩියාව | - | 16.8 | 21.90 | 34.62 |
| දේශීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල්වලට ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | - | 164.44 | 232.55 | 304.77 |
| හෙද පුහුණු පාසල්වල වාහන අළුත්වැඩියාව | - | 3.71 | 0.82 | 1.97 |
| දේශීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් සඳහා රෝහල් උපකරණ මිලදී ගැනීම | - | 75.27 | 275.45 | 297.85 |
| සෞඛ්‍ය ප්‍රවර්ධන හා රෝග වැළැක්වීමේ සේවාවන් සපයන ආයතනවල වාහන අළුත්වැඩියාව | - | 1.01 | 3.19 | 2.02 |
| සෞඛ්‍ය ප්‍රවර්ධන හා රෝග වැළැක්වීමේ සේවාවන් සපයන ආයතන සඳහා ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | - | 6.69 | 3.53 | 6.03 |
| සෞඛ්‍ය ප්‍රවර්ධන හා රෝග වැළැක්වීමේ සේවාවන් සපයන ආයතන සඳහා පොත්පත් හා සඟරා මිලදී ගැනීම | - | 0.38 | 0.36 | 0.28 |

## 3.20 සෞඛ්‍ය සේවා ආයතනවල ක්‍රියාත්මක කෙරෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති

### 3.20.1. දේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති

සෞඛ්‍ය අයවැය අනුව රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින සෞඛ්‍ය ආයතනවල දේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක කෙරෙන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දෙනුයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සැපයීම් වෙතය. ඒ අනුව 2018 දී පහත සඳහන් ව්‍යාපෘතීන්වල ප්‍රගතිය ඉදිරිපත් කෙරේ.

| # | ව්‍යාපෘතියේ නම | පිහිටි ස්ථානය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 1. | සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්වල හදිසි අනතුරු ඒකක පහසුකම් වැඩිදියුණු කිරීම | ශික්ෂණ රෝහල - යාපනය, දිස්ත්‍රික් මහ රෝහල - පොළොන්නරුව, මූලික රෝහල - කල්මුණේ, දිස්ත්‍රික් මහ රෝහල - කළුතර, ශික්ෂණ රෝහල - අනුරාධපුර, ශික්ෂණ රෝහල - නුවර, පළාත් මහ රෝහල - බදුල්ල, දිස්ත්‍රික් මහ රෝහල - හලාවත, දිස්ත්‍රික් මහ රෝහල - මාතර, දිස්ත්‍රික් මහ රෝහල - කෑගල්ල, මූලික රෝහල - මුල්ලේරියාව, දිස්ත්‍රික් මහ රෝහල - ත්‍රිකුණාමලය, මූලික රෝහල - ගම්පොල | • ශික්ෂණ රෝහල - නුවර (25%), දිස්ත්‍රික් මහ රෝහල - ත්‍රිකුණාමලය (17%), දිස්ත්‍රික් මහ රෝහල - හලාවත (19%), දිස්ත්‍රික් මහ රෝහල - කෑගල්ල (9%) - ඉදිකිරීම් වල ප්‍රගතිය<br>• ශික්ෂණ රෝහල - අනුරාධපුර, මූලික රෝහල - මුල්ලේරියාව, මූලික රෝහල - ගම්පොල - කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ වැඩ අවසන් වී ඇත.<br>• දිස්ත්‍රික් මහ රෝහල - මාතර(කඹුරුගමුව) - වැඩබිම තවම තීරණය කර නැත.<br>• දිස්ත්‍රික් මහ රෝහල - අම්පාර - ප්‍රසම්පාදන මට්ටමේ පවතී. පළාත් මහ රෝහල - බදුල්ල - කොන්ත්‍රාත්තුව ප්‍රදාන කර ඇති අතර තවම වැඩබිම සකස් කරමින් පවතී. | 1,143.01 |
| 2. | මුල්ලේරියාව මූලික රෝහලේ ජාතික ආසාත ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම | මුල්ලේරියාව | අත්තිවාරමේ වැඩ සම්පූර්ණ කර ඇත. එහි ගොඩනැගිලි ව්‍යුහය ඉදිකිරීම ඉදිරියට කරගෙන යමින් පවතී. | 249.50 |
| 3. | කළුබෝවිල ශික්ෂණ රෝහලේ මිලේනියම් වාට්ටු සංකීර්ණය | කොළඹ දකුණ ශික්ෂණ රෝහල -කළුබෝවිල | ඉදිකිරීමේ වැඩ අවසන් කර ඇත. | 179.36 |
| 4. | මඩකලපුව ශික්ෂණ රෝහලෙහි හෘද රෝග ඒකකය, කැතීටර් රසායනාගාරය හා වාට්ටු සංකීර්ණ ඉදිකිරීම | ශික්ෂණ රෝහල මඩකලපුව | ගොඩනැගිලි ව්‍යුහය ඉදිකිරීමේ කටයුතු ඉදිරියට කරගෙන යමින් පවතී. | 77.30 |

| | | | | |
|---|---|---|---|---|
| 5. | සෙද පීඨය / නේවාසිකාගාර ඉදිකිරීම | ශ්‍රී ජයවර්ධනපුර / මුල්ලේරියාව | වැඩබිම සකස් කරමින් පවතී | 344.88 |
| 6. | හඳුනාගත් රෝහල්වල වෛද්‍යවරුන් සහ සෙද නිලධාරීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා නිල නිවාස ඉදි කිරීම. | ශික්ෂණ රෝහල - කරාපිටිය, ශික්ෂණ රෝහල - අනුරාධපුර, ශික්ෂණ රෝහල - යාපනය | • ශික්ෂණ රෝහල කරාපිටිය - වැඩ අවසන් කර ඇත.<br>• ශික්ෂණ රෝහල යාපනය - ගොඩනැගිල්ලේ වැඩ ආරම්භ කර ඇත.<br>• ශික්ෂණ රෝහල අනුරාධපුර - කපරාරු කරමින් පවතී. | 105.81 |
| 7. | වතු අංශයේ රෝහල් සංවර්ධනය කිරීම | සබරගමුව පළාත | තෝරාගත් වතු රෝහල්වල ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කර ඇත. | 95.24 |
| 8. | නව වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීම - දිස්ත්‍රික් රෝහල හලාවත | දිස්ත්‍රික් මහ රෝහල - හලාවත | ජම්බෝර බැස්සවීමේ වැඩ සම්පූර්ණ කර ඇත. | 42.00 |
| 9. | පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහල සංවර්ධනය කිරීම | දිස්ත්‍රික් මහ රෝහල - පොළොන්නරුව | වෛද්‍ය නිල නිවාසය ඉදිකිරීම අවසන් කර ඇත. බකමූණ ප්‍රාදේශීය රෝහලේ බාහිර රෝගී ප්‍රතිකාර අංශ ගොඩනැගිල්ල ඉදිකිරීම සහ මැදිරිගිරිය රෝහලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | 111.37 |
| 10. | කරාපිටිය රෝහල සංවර්ධනය කිරීම. | ශික්ෂණ රෝහල - කරාපිටිය | ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. | 200.07 |
| 11. | අංගොඩ රෝහලෙහි (IDH) බාහිර රෝගී ප්‍රතිකාර අංශය, පරීක්ෂණාගාරය සහ විකිරණවේදී අංශය වැඩිදියුණු කිරීම | බෝ වන රෝග කළමණාකරණය පිළිබඳ ජාතික ආයතනය NIIDM - අංගොඩ | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත. | 19.03 |
| 12. | කරාපිටිය, මහනුවර හා තෙලිප්පලෙයි රෝහල්වල පිළිකා ඒකක ඉදිකිරීම | ශික්ෂණ රෝහල - මහ නුවර<br>මූලික රෝහල - තෙලිප්පලෙයි | තෙලිප්පලෙයි මූලික රෝහලෙහි මහල් තුනකින් යුත් ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. මහනුවර රෝහලේ මහල් 8 කින් යුත් ගොඩනැගිල්ලෙහි මහල් 06 ක ගොඩනැගිලි ව්‍යුහය ඉදිකිරීම අවසන් කර ඇත. | 193.91 |
| 13. | සෙද පුහුණු පාසල් වැඩිදියුණු කිරීම | ගාල්ල, අනුරාධපුර, කළුතර සහ නුවර | ජම්බෝර බැස්සවීමේ වැඩ (piling) සම්පූර්ණ කර ඇත. | 238.22 |
| 14. | හොරණ මූලික රෝහලේ නවීන පහසුකම් සහිතව නව ශල්‍යාගාරය ඉදි කිරීම | මූලික රෝහල - හොරණ | අත්තිවාරමේ වැඩ කටයුතු සිදු වෙමින් පවතී. | 221.14 |

| | | | | |
|---|---|---|---|---|
| 15. | පිඹුර මූලික රෝහලේ X-ray ඒකකය, බාහිර රෝගී අංශය, හදිසි අනතුරු ඒකකය සහ ලේ බැංකුවකින් සමන්විත තුන් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | මූලික රෝහල - පිඹුර | යෝජිත ගොඩනැගිල්ලේ මහල් 2 ක ව්‍යුහය සකසා අවසන් කර ඇත. වහල සෙවිලි කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. | 4.24 |
| 16. | කල්පවතින වකුගඩු රෝග සහිත රෝගීන් හඳුනා ගැනීමේ මධ්‍යස්ථාන ඉදිකිරීම | දකුණ, නැගෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල | හම්බන්තොට, ත්‍රිකුණාමලය, මඩකලපුව, බදුල්ල, කරාපිටිය, මලවි, සෙට්ටිකුලම්, පදවිය, පදවි ශ්‍රීපුර, සම්පත්නුවර, අරලගන්විල, දෙහිඅත්තකණ්ඩිය, හෙට්ටිපොල, බකමූණ, වැල්ලවාය, තිස්සමහාරාමය, කැබිතිගොල්ලෑව සහ මන්වන්දුව යන රෝහල්වල ගොඩනැගිලි ඉදිකිරීම | 723.55 |
| 17. | අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීමෙ | කොළඹ | ජම්බෝර බැස්සවීමේ වැඩ (piling) සහ බිම් මහල් දෙකක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.<br>පළමු මහලේ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී. | 762.30 |
| 18. | කරාපිටිය, අම්පාර හා යාපනය විශේෂිත රෝහල්වල ළමා රෝග සේවා සංකීර්ණ ස්ථාපිත කිරීම | ශික්ෂණ රෝහල - කරාපිටිය, ශික්ෂණ රෝහල - යාපනය සහ දිස්ත්‍රික් මහ රෝහල - අම්පාර | • දිස්ත්‍රික් මහ රෝහල අම්පාර - ගොඩනැගිල්ලෙහි දෙවන මහලෙහි නිම කිරීමේ වැඩ අවසන් කර ඇත.<br>• ශික්ෂණ රෝහල කරාපිටිය - අත්තිවාරමේ වැඩ ආරම්භ කර ඇත. | 561.95 |
| 19. | නින්දවූර් මූලික රෝහලේ නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | නින්දවූර් | ජම්බෝර බැස්සවීමේ වැඩ (piling) අවසන් කර ඇත. | 200.00 |
| 20. | කරාපිටිය ශික්ෂණ රෝහලේ මුඛ සෞඛ්‍ය ඒකකයක් ඉදිකිරීම | ශික්ෂණ රෝහල - කරාපිටිය | වැඩ බිම සකස් කිරීම අවසන් කර ඇත. අත්තිවාරමේ වැඩ ආරම්භ කර ඇත. | 161.25 |
| 21. | රිජ්වේ ආර්යා ළමා රෝහලෙහි හෘද රෝග ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම | රිජ්වේ ආර්යා ළමා රෝහල - කොළඹ | බිම් අත්තිවාරමේ වැඩ අවසන් කර ඇත. ගොඩනැගිලි ව්‍යුහය ඉදිකිරීම ආරම්භ කර ඇත. | 103.94 |

### 3.20.2. විදේශාධාර මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

2018 දී විදේශාධාර මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත සඳහන් වේ.

| | ව්‍යාපෘතියේ නම | අරමුදල් ප්‍රභවය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|---|
| 1. | මාතර දිස්ත්‍රික්කයේ මාතෘ හා අලුත උපන් බිළිඳුන්ගේ සෞඛ්‍ය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (GOSL - KOICA) | KOICA | • විදුලි උත්පාදක යන්ත්‍ර සඳහා නව කාමරයක් ඉදිකර ඇත.<br>• නව ගොඩනැගිල්ල ඉදිකිරීම ආරම්භ කර ඇත | 187.00 |
| 2. | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීම හා පුනරුත්ථාපනය (SPMC) (Yen 1239.88 Mn) / For 2017 JICA (12) – LKR 1092.45 Mn and GoSL (17) LKR 175 Mn | JICA | • ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු අවසන් කර ඇත<br>• උපකරණ / යන්ත්‍ර සවිකිරීම 90% ක් පමණ අවසන් කර ඇත | 1,299.24 |
| 3. | හෙල්මට් කෝල් මාතෘ රෝහල කරාපිටිය - ගාල්ල (GOSL - Germany) | Kfw ජර්මන් | • ගොඩනැගිලි කොටස් පහක ඉදිකිරීම් වලින් 70% ක් සම්පූර්ණ කර ඇත<br>• නිම කිරීමේ වැඩ සිදුවෙමින් පවතී | 552.17 |
| 4. | විශේෂිත මාතෘ හා ළමා රෝහලක් කළුතර ඉදිකිරීම | නෙදර්ලන්ත අධාර | • ජම්බෝර බැස්සවීමේ වැඩ (piling) අවසන් කර ඇත<br>• පළමු මහලේ කොන්ක්‍රීට් කණු ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී | 811.80 |
| 5. | පළාත් සභා යටතේ පවතින දුෂ්කර රෝහල් සඳහා සායනික අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ඇති කිරීම තුළින් රෝගී සත්කාර සේවා වැඩිදියුණු කිරීම. (Australia) | ඕස්ට්‍රේලියා | ඉන්සිනරේටර් යන්ත්‍ර 5 ක් සහ මෙටාමයිසර් යන්ත්‍ර 20 ක් මිලදී ගෙන ස්ථාපිත කරන ලදී | 206.42 |
| 6. | ශ්‍රී ලංකා ජාතික රෝහලේ බාහිර රෝගී අංශය සංවර්ධනය කිරීම (GOSL - China) | චීන රජය | 8 වන මහල දක්වා ප්‍රධාන ගොඩනැලිලි ව්‍යුහය සම්පූර්ණ කර ඇත | 346.88 |
| 7. | දකුණු කොළඹ ශික්ෂණ රෝහල සඳහා MRI Scanner යන්ත්‍රයක් ලබා දීම (GOSL - China) | චීන රජය | MRI Scanner යන්ත්‍රය සවිකර ඇත | |
| 8. | පොළොන්නරුවේ නව රසායනාගාරයක් සහ වකුගඩු රෝග සඳහා රෝහලක් ඉදිකිරීම (GOSL - China) | චීන රජය | අත්තිවාරමේ වැඩ ආරම්භ කර ඇත. | |

### 3.20.3. දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය (SHSDP)

වර්ෂ පහක ව්‍යාපෘතියක් වූ SHSDP ව්‍යාපෘතිය 2014 දී ආරම්භ වූ අතර 2018 වර්ෂයේදී අවසන් කෙරිණි. මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලෝක බැංකුව විසින් ලබා දුන් අතර එය කොටස් දෙකකින් සමන්විත විය. කොටස් අංක 1 යටතේ ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලසුමේ අරමුණු ළඟාකරගැනීම සඳහා දායක විය. එම සැලසුම විශේෂයෙන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 4 ක් වෙත අවධානය යොමු කරමින් සම්පූර්ණ වැඩසටහනට සහයෝගය ලබා දෙන ලදී. එම විෂය ක්ෂේත්‍ර : සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම, මාතෘ හා ළමා සෞඛ්‍යය සහ පෝෂණය, බෝවන රෝග පාලනය හා වැලැක්වීම සහ බෝ නොවන රෝග වැලැක්වීම හා පාලනය . කොටස් අංක II යටතේ නව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම, මෙහෙයුම් පර්යේෂණ සහ ධාරිතා වර්ධනය සඳහා අවස්ථා ලබාදීම යන කටයුතු වලට සහාය ලබා දෙන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ දර්ශක 20 ක් ඇගයීමට ලක් කරන ලදී. මෙම දර්ශක 20 අතුරින් 09 ක් අරමුදල් වියදම් කිරීම හා සම්බන්ධ අතර 11 ක් අරමුදල් වියදම් කිරීම හා සම්බන්ධ නොවේ. 2018 දී DLI 1, DLI 3, DLI 5, DLI 6, DLI 7 සහ DLI 9 යන වියදම් කිරීම හා සම්බන්ධ දර්ශක 100% ක ප්‍රගතිය ලබා ගැනීම ඉලක්කගත කර තිබුණි. ප්‍රගති වාර්තාව අනුව DLI 1, DLI 5, DLI 6 සහ DLI 7 100% ක ප්‍රගතිය වාර්තා කර තිබූ අතර DLI 3 90% ද DLI 9 75.8% ද ළඟාකරගෙන තිබුණි. එම වර්ෂයේ සත්‍ය වියදම රු. මිලියන 2,142 කි.

### 3.20.4. ඒඩ්ස් (AIDS), ක්ෂය රෝගය (Tuberculosis) සහ මැලේරියා (Malaria) රෝග සඳහා සටන් කිරීමට ගෝලීය අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතිය (GFATM)

ගෝලීය අරමුදල මඟින් මූල්‍ය අනුග්‍රහය ලබාදුන් මෙම පස් අවුරුදු ව්‍යාපෘතිය 2018 දී සම්පූර්ණ කෙරිණි. මෙම ව්‍යාපෘතිය කොටස් හතරකින් සමන්විත විය. ඒවානම්, HIV, TB, මැලේරියා සහ HSS (සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම). සෑම කොටසක් යටතේම සැලසුම් කරන ලද බොහොමයක් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී. 2018 දී සම්පූර්ණ වියදම රුපියල් මිලියන 946.13 කි.

### 3.20.5. සර්ව සෞඛ්‍ය ආවරණය සඳහා වූ සෞඛ්‍ය සේවා සැපයීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

ප්‍රාථමික සෞඛ්‍ය සේවා සැපයීමේ පද්ධතිය ප්‍රතිසංවිධානය සහ ශක්තිමත් කිරීම මූලික කොටගෙන ඉහත ප්‍රතිපත්තිය බලගැන්වීම සහතික කිරීමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය කැප වී ඇත, ශ්‍රී ලංකා අත්‍යවශ්‍ය සේවා පැකේජය (SLESP) යටතේ හඳුනාගත් සේවාවන් ප්‍රාථමික වෛද්‍ය සේවා ආයතන මඟින් ලබා දේ. යෝජිත ප්‍රාථමික සෞඛ්‍ය සේවා සැපයීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, පහත සඳහන් ව්‍යාපෘති දෙක යටතේ ආරම්භ කෙරිණි.

- ලෝක බැංකුව මඟින් අරමුදල් සපයන ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PSSP)
  මෙම ව්‍යාපෘතිය දිවයිනේ සියළුම පළාත්වල වසර 5 ක කාලයක් පුරා ක්‍රියාත්මක කෙරේ.

- ආසියානු සංවර්ධන බැංකුව මඟින් අරමුදල් සපයන සෞඛ්‍ය පද්ධතිය උසස් කිරීමේ ව්‍යාපෘතිය (HSEP)
  මෙම ව්‍යාපෘතියද වසර 5 ක කාලයක් සඳහා වන අතර මධ්‍යම, උතුරුමැද, සබරගමුව සහ ඌව යන පළාත්වල පමණක් ක්‍රියාත්මක වේ.

## **4.0** රේඛීය අමාත්‍යාංශයට අයත් රෝහල්වල වාර්ෂික කාර්ය සාධන වාර්තාවේ සාරාංශය- 2018

| දර්ශකය | රෝහලේ නම | | | | | | | | | මණ්ඩලයක් මගින් පාලනය වන රෝහල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ජාතික රෝහල | ශික්ෂණ රෝහල අනුරාධපුර | ශික්ෂණ රෝහල මඩකලපුව | ශික්ෂණ රෝහල උතුරු කොළඹ | ශික්ෂණ රෝහල දකුණු කොළඹ, කළුබෝවිල | ශික්ෂණ රෝහල යාපනය | ශික්ෂණ රෝහල මහනුවර * | ශික්ෂණ රෝහල කරාපිටිය * | ශික්ෂණ රෝහල පේරාදෙණිය | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල |
| ඩෙංගු මරණ අනුපාතිකය | 0.45 | 0.36 | 0.2 | 0 | 0.22 | 0.107 | 0 | 0 | 0 | 0 | 0 |
| රෝහල්ගත හෘද් අකරණිය සහිත රෝගීන්ගෙන් මියගිය අනුපාතය | 14.7 | 12.2 | 10.91 | 6.73 | 10.17 | 15.16 | 9.9 | 16.9 | 11.2 | 7.93 | 0 |
| ඇඳන් සංඛ්‍යාව | 3231 | 2058 | 1150 | 1447 | 1110 | 1265 | 24.5 | 1908 | 957 | 1062 | 132 |
| ඇඳන් භාවිතා කිරීමේ අනුපාතිකය | 80 | 61.82 | 74.23 | 83.61 | 88.53 | 83.05 | 78 | 79.8 | 80 | 66.03 | 52.65 |
| වර්ෂයතුලදී සිදු කරන ලද ප්‍රධාන සැත්කම් සංඛ්‍යාව | 39864 | 15047 | 9090 | 9505 | 11874 | 11136 | 5171 | 3102 | 10839 | 8186 | 757 |
| බෝනොවන රෝගවලට ප්‍රතිකාර කිරීමට ඇති අත්‍යාවශ්‍ය බෙහෙත් වර්ග 16න් අවසාන කාර්තුවේ තිබෙන අත්‍යාවශ්‍ය බෙහෙත් ප්‍රතිශතය | 68.75 | 100 | 87.5 | 75 | 93.75 | 100 | 18.8 | - | 81.25 | 93.75 | 100 |
| එක් වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥකු විසින් මසකට සිදුකරන පරීක්ෂණ සංඛ්‍යාව | 7028200 | 52345.5 | 5518.1 | 6470.34 | 4675 | 4892 | 9029 | 3601 | 3886 | 3018 | 775 |
| බෙහෙත් සඳහා වෙන් කරනලද සම්පූර්ණ මුදල් ප්‍රමාණයෙන් දේශීය මිලදී ගැනීම් සඳහා වැයවූ මුදල් ප්‍රතිශතය | 71.4 | 120.59 | 0.05 | 7.8 | 1.75 | 99 | 72 | 112.34 | 4.14 | 60.25 | 77.9 |

*කාර්තුමය දත්ත ඇතුලත් කර ඇත

| දර්ශකය | රෝහලේ නම | | | | | | | | | මණ්ඩලයක් මගින් පාලනය වන රෝහල් | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ජාතික රෝහල | ශික්ෂණ රෝහල අනුරාධපුර | ශික්ෂණ රෝහල මඩකලපුව | ශික්ෂණ රෝහල උතුරු කොළඹ | ශික්ෂණ රෝහල දකුණු කොළඹ, කළුබෝවිල | ශික්ෂණ රෝහල යාපනය | ශික්ෂණ රෝහල මහනුවර * | ශික්ෂණ රෝහල කරාපිටිය * | ශික්ෂණ රෝහල පේරාදෙණිය | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | විජය කුමාරතුංග අනුස්මරණ රෝහල |
| වසරේ සීසේරියන් සැත්කම් අනුපාතිකය (සැම සජීවී උපත් 100කට සිදුකරන සීසේරියන් සැත්කම් සංඛ්‍යාව) | - | 35.54 | 43.14 | 40.36 | 40.25 | 37.13 | 44 | - | 59 | 52.8 | 0 |
| වසරේ පශ්චාත්-සීසේරියන් සැත්කම් අසාදන අනුපාතිකය | - | 0.4 | 0.27 | 1.5 | 0.55 | 0.34 | 0.3 | - | - | 0.53 | 0 |
| සේවක කාණ්ඩ අනුව වර්ෂය තුලදී අවම වශයෙන් ධාරිතා වර්ධන වැඩසටහන් එකකට හෝ සහභාගීවූ නිලධාරීන්ගේ ප්‍රතිශතය<br>1. වෛද්‍ය නිලධාරී | 22.4 | 0.05 | - | 13 | - | 57 | 14.8 | 4.86 | - | 76.73 | 20 |
| 2. හෙද නිලධාරීන් | 31.3 | 0.41 | - | 33 | - | 27 | 34.6 | 4.72 | - | 400 | 16 |
| 3. වෙනත් තාක්ෂණික නිලධාරීන් | 15.6 | 0.5 | - | 5 | - | 0 | 94.3 | 14.8 | - | 86.67 | - |
| 4. කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | 13.7 | 0.49 | - | - | - | 26 | 1.35 | 0 | - | 12.73 | 8 |
| එක් දිනකට එක් වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන බාහිර රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍යය | 48 | 92.35 | 62.66 | 66 | 34 | 114 | 25.56 | 113 | 41 | 40 | 95 |

*කාර්තුමය දත්ත ඇතුලත් කර ඇත

| දර්ශකය | රෝහලේ නම | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රිජ්වේ ආර්යා ළමා රෝහල | සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල පේරාදෙණිය | රක්තවේදය හා පුනුරුත්ථාපන රෝහල රාගම | ශ්වසන රෝග සඳහා වූ ජාතික රෝහල, වැලිසර | ජාතික වකුගඩු බද්ධ කිරීමේ හා රුධිර කාන්දු පෙරණ ආයතනය, මාළිගාවත්ත | අපේක්ෂා රෝහල මහරගම | ජාතික මානසික සෞඛ්‍ය ආයතනය, අංගොඩ | ජාතික අක්ෂි රෝහල | ද සොයිසා කාන්තා රෝහල | කාසල් වීදියේ කාන්තා රෝහල | ශික්ෂණ රෝහල මහමෝදර | ජාතික දන්ත රෝහල |
| ඩෙංගු මරණ අනුපාතිකය | 0.14 | 0.8 | - | - | | - | | - | - | 0 | 0 | - |
| රෝහල්ගත හෘද් අකරණීය සහිත රෝගීන්ගෙන් මියගිය අනුපාතය | - | 0 | - | - | | - | | - | - | 0 | 0 | - |
| ඇඳන් සංඛ්‍යාව | 1000 | 341 | 272 | 654 | | 950 | | 503 | 343 | 460 | 364 | |
| ඇඳන් භාවිතා කිරීමේ අනුපාතිකය | 64.9 | 52.48 | 54.2 | 52.5 | | 78 | | 64.5 | 82.45 | 0.67 | 74.36 | 76.25 |
| වර්ෂයතුලදී සිදු කරන ලද ප්‍රධාන සැත්කම් සංඛ්‍යාව | 3660 | 2021 | - | 798 | | 2630 | | 19663 | 3559 | 5711 | 5390 | - |
| බෝනොවන රෝගවලට ප්‍රතිකාර කිරීමට ඇති අත්‍යාවශ්‍ය බෙහෙත් වර්ග 16න් අවසාන කාර්තුවේ තිබෙන අත්‍යාවශ්‍ය බෙහෙත් ප්‍රතිශතය | - | - | 100 | 100 | | - | | 100 | 100 | 100 | 100 | - |
| එක් වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥකු විසින් මසකට සිදුකරන පරීක්ෂණ සංඛ්‍යාව | 11223 | 1942 | 29566 | 33544 | | 3782 | | 12640.5 | 13425 | 7139 | 24803 | - |

*කාර්තුමය දත්ත ඇතුලත් කර ඇත

| දර්ශකය | රෝහලේ නම | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රිජ්වේ ආර්යා ළමා රෝහල | සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහල පේරාදෙණිය | රක්තවේදය හා පුනුරුත්ථාපන රෝහල රාගම | ශ්වසන රෝග සඳහා වූ ජාතික රෝහල, වැලිසර | ජාතික වකුගඩු බද්ධ කිරීමේ හා රුධිර කාන්දු පෙරණ ආයතනය, මාළිගාවත්ත | අපේක්ෂා රෝහල මහරගම | ජාතික මානසික සෞඛ්‍ය ආයතනය, අංගොඩ | ජාතික අක්ෂි රෝහල | ද සොයිසා කාන්තා රෝහල | කාසල් වීදියේ කාන්තා රෝහල | ශික්ෂණ රෝහල මහමෝදර | ජාතික දන්ත රෝහල |
| බෙහෙත් සඳහා වෙන් කරනලද සම්පූර්ණ මුදල් ප්‍රමාණයෙන් දේශීය මිලදී ගැනීම් සඳහා වැයවූ මුදල් ප්‍රතිශතය | 91.07 | 61 | 0 | 22.7 | | - | | 99.3 | 100 | 4.2 | 1.2 | - |
| වසරේ සිසේරියන් සැත්කම් අනුපාතිකය (සෑම සජීවී උපත් 100කට සිදුකරන සීසේරියන් සැත්කම් සංඛ්‍යාව) | - | - | - | - | | - | | - | 29.45 | 33.66 | 36 | - |
| වසරේ පශ්චාත්-සීසේරියන් සැත්කම් අසාදන අනුපාතිකය | - | - | - | - | | - | | - | 0.92 | 7.5 | 0.1 | - |
| සේවක කාණ්ඩ අනුව වර්ෂය තුලදී අවම වශයෙන් ධාරිතා වර්ධන වැඩසටහන් එකකට හෝ සහභාගීවූ නිලධාරීන්ගේ ප්‍රතිශතය<br>1. වෛද්‍ය නිලධාරී | - | 31 | 78 | 41 | | 36.9 | | 4 | 48.4 | 49 | 14 | 32.96 |
| 2. හෙද නිලධාරීන් | - | 38 | 85 | 56.9 | | 77.7 | | 14 | 64.22 | 43 | 68 | 56.6 |
| 3. වෙනත් තාක්ෂණික නිලධාරීන් | - | 24 | 65 | 46 | | 92.1 | | - | 58.06 | 36 | 12 | 37.5 |
| 4.. කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | - | 5.7 | 38 | 57 | | 44.2 | | 56 | 21.0 | 25 | 22 | 60.89 |
| එක් දිනකට එක් වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන බාහිර රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍යය | 227 | 35 | 16/Clinic | 19 | | No OPD | | 39 | 11 | 12 | 35 | 19 |

| දර්ශකය | රෝහලේ නම | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පළාත් මහ රෝහල බදුල්ල | පළාත් මහ රෝහල කුරුණෑගල | ශික්ෂණ රෝහල රත්නපුර | දිස්ත්‍රික් මහ රෝහල අම්පාර * | දිස්ත්‍රික් මහ රෝහල හලාවත | දිස්ත්‍රික් මහ රෝහල හම්බන්තොට | දිස්ත්‍රික් මහ රෝහල කළුතර | දිස්ත්‍රික් මහ රෝහල කෑගල්ල | දිස්ත්‍රික් මහ රෝහල මාතර | දිස්ත්‍රික් මහ රෝහල මොණරාගල | දිස්ත්‍රික් මහ රෝහල නුවරඑළිය * | දිස්ත්‍රික් මහ රෝහල පොළොන්නරුව | දිස්ත්‍රික් මහ රෝහල ත්‍රිකුණාමලය |
| ඩෙංගු මරණ අනුපාතිකය | | 0.19 | 0.227 | 0 | 0 | - | 0.12 | 0.23 | 0.15 | 0 | 0 | 0 | 0.43 |
| රෝහල්ගත හෘද් අකරණිය සහිත රෝගීන්ගෙන් මියගිය අනුපාතය | | 13.51 | 8.413 | 16.31 | 9.1 | 2.67 | 12.96 | 16 | 11.49 | 6.1 | 13.26 | 16 | 1.0 |
| ඇඳන් සංඛ්‍යාව | | | 1400 | | 579 | 655 | 1099 | | 1034 | 465 | 422 | 920 | 523 |
| ඇඳන් භාවිතා කිරීමේ අනුපාතිකය | | | 70 | 59.42 | 59.5 | 70.55 | 58.6 | 64 | 68.6 | 89 | 85.78 | 83.5 | 63.99 |
| වර්ෂයතුලදී සිදු කරන ලද ප්‍රධාන සැත්කම් සංඛ්‍යාව | | 17762 | 8900 | 29.23 | 4317 | 1359 | 1568 | 16859 | 18514 | 3792 | 55.47 | 7283 | 4191 |
| බෝනොවන රෝගවලට ප්‍රතිකාර කිරීමට ඇති අත්‍යාවශ්‍ය බෙහෙත් වර්ග 16න් අවසාන කාර්තුවේ තිබෙන අත්‍යාවශ්‍ය බෙහෙත් ප්‍රතිශතය | | 100 | 100 | - | - | 100 | 100 | 81.25 | 100 | 87.5 | 87.5 | 62.5 | 25 |
| එක් වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥකු විසින් මසකට සිදුකරන පරීක්ෂණ සංඛ්‍යාව | | 4201.76 | 4530.01 | 4721.2 | 41478 | 6493 | 2900 | 2303 | 2814 | 11646 | 16002 | 4743 | 43816 |

*කාර්තුමය දත්ත ඇතුලත් කර ඇත

| දර්ශකය | රෝහලේ නම | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පළාත් මහ රෝහල බදුල්ල | පළාත් මහ රෝහල කුරුණෑගල | ශික්ෂණ රෝහල රත්නපුර | දිස්ත්‍රික් මහ රෝහල අම්පාර * | දිස්ත්‍රික් මහ රෝහල හලාවත | දිස්ත්‍රික් මහ රෝහල හම්බන්තොට | දිස්ත්‍රික් මහ රෝහල කළුතර | දිස්ත්‍රික් මහ රෝහල කෑගල්ල | දිස්ත්‍රික් මහ රෝහල මාතර | දිස්ත්‍රික් මහ රෝහල මොණරාගල | දිස්ත්‍රික් මහ රෝහල නුවරඑළිය * | දිස්ත්‍රික් මහ රෝහල පොළොන්නරුව | දිස්ත්‍රික් මහ රෝහල ත්‍රිකුණාමලය |
| බෙහෙත් සඳහා වෙන් කරනලද සම්පූර්ණ මුදල් ප්‍රමාණයෙන් දේශීය මිලදී ගැනීම් සඳහා වැයවූ මුදල් ප්‍රතිශතය | | 91.8 | 7.78 | 81.81 | 36.4 | 83.85 | 79.57 | 9.21 | 10.07 | 29.6 | 7.67 | 30 | 8.86 |
| වසරේ සීසේරියන් සැත්කම් අනුපාතිකය (සෑම සජීවී උපත් 100කට සිදුකරන සීසේරියන් සැත්කම් සංඛ්‍යාව) | | 44.98 | 42.833 | 35.9 | 41.5 | 43.53 | 40.96 | 20 | 44.28 | 36 | 32.99 | 40.7 | 35.6 |
| වසරේ පශ්චාත්-සීසේරියන් සැත්කම් අසාදන අනුපාතිකය | | - | 1.859 | 0.8 | | 0.49 | 0.59 | 1.13 | 0.3 | 1.2 | 0.77 | 0.7 | 2.21 |
| සේවක කාණ්ඩ අනුව වර්ෂය තුලදී අවම වශයෙන් ධාරිතා වර්ධන වැඩසටහන් එකකට හෝ සහභාගීවූ නිලධාරීන්ගේ ප්‍රතිශතය<br>1. වෛද්‍ය නිලධාරී | | - | 74 | 262.5 | 30 | 58 | 2.58 | 56 | 76.61 | 20.3 | 244.5 | 83 | 81.5 |
| 2. හෙද නිලධාරීන් | | 78.25 | 31.36 | 325 | 49 | 152 | 41.18 | 107 | 126.99 | 55 | 66.03 | 88 | 88.2 |
| 3. වෙනත් තාක්ෂණික නිලධාරීන් | | - | 17.8 | 151.2 | - | 84 | 11.34 | 95 | 36.3 | 9.2 | 43.39 | 7 | 59.7 |
| 4. කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | | 9.56 | 10 | 54.33 | 16 | 35 | 51.79 | 30 | 60.9 | 6.7 | 65.34 | 21 | 61.8 |
| එක් දිනකට එක් වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන බාහිර රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍යය | | 58.66 | 117.5 | 61 | 320 | 38 | 55 | 53 | 50 | 64 | 72 | 105 | 50.8 |

| දර්ශකය | රෝහලේ නම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ශික්ෂණ රෝහල අනුරාධපුර | ශික්ෂණ රෝහල ගම්පොල | ශික්ෂණ රෝහල කොළඹ උතුර | ශික්ෂණ රෝහල කොළඹ දකුණ | ශික්ෂණ රෝහල කෑගල්ල | ශික්ෂණ රෝහල කරාපිටිය | ජාතික ආයතනය, මහරගම | රෝග ආයතනය | දන්ත රෝහල, පේරාදෙණිය |
| ඩෙංගු මරණ අනුපාතිකය | 0 | 0 | 0.2 | 0.1 | 0 | 0 | - | - | - |
| රෝහල්ගත හෘද් අකරණිය සහිත රෝගීන්ගෙන් මියගිය අනුපාතය | 18 | 9.09 | 4.1 | 17.6 | 6.38 | 7.18 | - | 2.8 | - |
| ඇඳන් සංඛ්‍යාව | 274 | 371 | 374 | 279 | 235 | | | - | 40 |
| ඇඳන් භාවිතා කිරීමේ අනුපාතිකය | 60 | 62.13 | 63 | 77 | 41.42 | 60.72 | - | 53.9 | 56.26 |
| වර්ෂයතුලදී සිදු කරන ලද ප්‍රධාන සැත්කම් සංඛ්‍යාව | 1983 | 4055 | 2331 | 2305 | 632 | 740 | - | - | 573 |
| බෝනොවන රෝගවලට ප්‍රතිකාර කිරීමට ඇති අත්‍යාවශ්‍ය බෙහෙත් වර්ග 16න් අවසාන කාර්තුවේ තිබෙන අත්‍යාවශ්‍ය බෙහෙත් ප්‍රතිශතය | 100 | 81.25 | 100 | 100 | 100 | 90 | - | 94 | 6.25 |
| එක් වෛද්‍ය රසායනාගාර කාර්මික විශේෂඥකු විසින් මසකට සිදුකරන පරීක්ෂණ සංඛ්‍යාව | 13866 | 33732 | 3217 | 4513.5 | | 29056.43 | - | 10709 | - |
| බෙහෙත් සඳහා වෙන් කරනලද සම්පූර්ණ මුදල් ප්‍රමාණයෙන් දේශීය මිලදී ගැනීම් සඳහා වැයවූ මුදල් ප්‍රතිශතය | 1.9 | 12.64 | 67 | 98.07 | 75.28 | 9.75 | 64.5 | 36.4 | - |
| වසරේ සීසේරියන් සැත්කම් අනුපාතිකය (සෑම සජීවී උපත් 100කට සිදුකරන සීසේරියන් සැත්කම් සංඛ්‍යාව) | 36 | 56 | 35.57 | 50.8 | 34.41 | 26.4 | - | - | 0 |
| වසරේ පශ්චාත්-සීසේරියන් සැත්කම් අසාදන අනුපාතිකය | 0.4 | 0.28 | 0.47 | 1.21 | 1.56 | 0 | - | - | 0 |
| සේවක කාණ්ඩ අනුව වර්ෂය තුලදී අවම වශයෙන් ධාරිතා වර්ධන වැඩසටහන් එකකට හෝ සහභාගීවූ නිලධාරීන්ගේ ප්‍රතිශතය<br>1. වෛද්‍ය නිලධාරී | 38 | 11 | 17 | 87.5 | 66.67 | 44.9 | 49 | 54 | 69.38 |
| 2. හෙද නිලධාරීන් | 70 | 25 | 14 | 77 | 83.33 | 64.7 | 85 | 95 | 88.3 |
| 3. වෙනත් තාක්ෂණික නිලධාරීන් | 65 | 6 | 39 | 57.62 | 61.76 | 50 | 64 | 90 | 100 |
| 4. කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | 60 | 23 | 7 | 22.9 | 100 | 58.39 | 39 | 20 | 36.9 |
| එක් දිනකට එක් වෛද්‍ය නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන බාහිර රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍යය | 46 | 72 | 94 | 84 | 56.4 | 59.41 | 14 | 56 | 18.67 |

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2018

## දේශීය වෛද්‍ය අංශය

## சுதேச மருத்துவப் பிரிவு

## Indigenous Medicine sector






## දැක්ම

හෙළ වෙදකමින් සැමට සුවසෙත

## මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික, ආර්ථික හා සහස්‍ර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ප්‍රබල අයුරින් දායක කරවීම



## පෙළ ගැස්ම


| | | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 3 |
| 2. | දේශීය වෛද්‍ය අංශයේ ප්‍රමුඛතා | 4 |
| 3. | දේශීය වෛද්‍ය අංශය හා ඒ යටතේ ඇති ආයතන | 5 |
| 4. | දේශීය වෛද්‍ය අංශයේ මූල්‍ය ප්‍රගතිය | 6 |
| 5. | ආයතන හා පාලන අංශය | 7 |
| 6. | දේශීය වෛද්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන්වල ප්‍රගතිය | 10 |
| 7. | දේශීය වෛද්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම | 14 |
| 8. | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 15 |
| 8.1 | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය | 38 |
| 8.2 | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය | 41 |
| 8.3 | ආයුර්වේද වෛද්‍ය සභාව | 42 |
| 8.4 | ආයුර්වේද ඔසු උයන් | 44 |
| 8.5 | අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය | 49 |
| 9. | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | 51 |
| 10. | හෝමියෝපති වෛද්‍ය ක්‍රමය | 58 |
| 10.1 | හෝමියෝපති රෝහල | 59 |
| 10.2 | හෝමියෝපති වෛද්‍ය සභාව | 62 |

## 01. හැඳින්වීම

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට පෙර පැවති වෛද්‍ය ක්‍රමය වූයේ පාරම්පරිකව පැවත ආ දේශීය චිකිත්සාව හෙවත් පාරම්පරික සිංහල වෙදකමයි. ශ්‍රී ලංකාව වෙත බුදු දහම සම්ප්‍රාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාවෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අපට දායාද විය. ඒ අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය උතුරු ඉන්දීය ආයුර්වේද වෛද්‍ය සම්ප්‍රදාය දකුණු ඉන්දීය සිද්ධ වෛද්‍ය සම්ප්‍රදාය අරාබි යුනානි වෛද්‍ය සම්ප්‍රදාය සහ ශ්‍රී ලංකාවේ පාරම්පරික දේශීය චිකිත්සා ක්‍රමය යන සියල්ලෙහි සංකලනයක් ලෙසින් දේශීය වෛද්‍ය ක්‍රමය ස්ථාපිත වී ඇත. එසේ වුවද ශ්‍රී ලංකාව ස්වකීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ආවේණික සම්ප්‍රදායක් තුළ පවත්වා ගෙන යන අනන්‍ය වෛද්‍ය විද්‍යාවක් ලෙස පිළිගෙන තිබේ.

ආයුෂ පවත්වා ගෙන යාමේ විද්‍යාව යනු ආයුර්වේදය යන්නෙහි අදහසයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය රෝග නිවාරණය පදනම් කර ගත්තකි. එහි ප්‍රතිකාර ක්‍රම මෙන්ම ඇවතුම් පැවතුම් ක්‍රම හා වත් පිළිවෙත් ද පවතී. හුදෙක් රෝගයකට ප්‍රතිකාර කිරීමට වඩා රෝගයන්ට ගොදුරු නොවන පරිදි කායිකව හා මානසිකව සුවදායී සෞඛ්‍යමත් ජීවිතයක් පවත්වා ගෙන යාම ආයුර්වේදය මඟින් අදහස් කෙරේ.

ඓතිහාසික ග්‍රන්ථ හා පුරා විද්‍යාත්මක සාධක යනාදිය මඟින් ශ්‍රී ලංකාවේ දියුණු, එමෙන්ම විධිමත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් පැවති බව සනාථ කරයි. ආරෝග්‍ය ශාලා ඉදිකර, ඖෂධ හා ආහාර පාන වැනි දෑ සම්පාදනය කිරීම පිළිබඳව මහාවංශයෙහි තොරතුරු දැක්වේ. එමෙන්ම ඉපැරණි ආරෝග්‍ය ශාලාවන් සහ වෛද්‍ය මෙවලම් හා උපකරණවල නෂ්ඨාවශේෂ මිහින්තලේ, මැදිරිගිරිය, ආළාහණ පිරිවෙණ ආදී ස්ථාන වලින් හමුවී තිබේ,

දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන මෙම මහඟු වෙදකමේ උන්නතිය හා ව්‍යාප්තිය සඳහා කටයුතු සම්පාදනය කරන ලද්දේ නිදහසින් පසුවයි. 1949 අංක 49 දරණ ව්‍යවස්ථාව මඟින් ස්වදේශීය ආඥා පනත සංශෝධනය කිරීම, 1957 ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1961 අංක 31 දරණ ආයුර්වේද පනත සම්මත කර ගැනීම 1980 වසරේ දේශීය වෛද්‍ය ප්‍රවර්ධනය සඳහා නව අමාත්‍යාංශයක් පිහිටුවීම වැනි සංධිස්ථාන පසු කරමින් 1994 දී මෙය කැබිනට් අමාත්‍යාංශයක් දක්වා වැඩිදියුණු විය. එතැන් පටන් කැබිනට් අමාත්‍යවරයකුගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වූ මෙම අමාත්‍යාංශය 2015.01.18 සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට ගැනුණු අතර 2015.09.21 දින සිට මේ දක්වා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

සුව කිරීමට අසීරු බොහෝ රෝගයන්ට පවා සාර්ථක පිළියම් ලබාදීමට දේශීය වෙදකමට හැකියාව ලැබී ඇත. ශ්‍රී ලංකාවේ පමණක් නොව දේශ දේශාන්තරයන්හි පවා මෙම මහඟු වෙදකම පිළිගත් වෛද්‍ය ක්‍රමයක් බවට පත්ව ඇත්තේ එහෙයිනි.

වර්තමානයේ නව පර්යේෂණ ක්‍රම ඔස්සේ යමින් දේශයේ සෞඛ්‍ය සංරක්ෂණය උදාකරලීම සඳහා දේශීය වෛද්‍ය අංශය පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- සෞඛ්‍ය සම්පන්න ජාතියක් ගොඩනැගීම සඳහා දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීම.
- දේශීය ඔසු වගාව පුළුල් ලෙස ක්‍රියාත්මක කරමින් ඖෂධ නිෂ්පාදනය ඉහළ දැමීම.
- සුරක්ෂිත ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය වැඩිදියුණු කර එය රටේ සංවර්ධනයට දායක කර ගැනීම.
- හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ ප්‍රවර්ධනයක් ඇති කිරීම.

## 02. දේශීය වෛද්‍ය අංශයේ ප්‍රමුඛතා අංශ

| විශේෂ අවධානයට ලක්වූ ප්‍රමුඛතා අංශ | ප්‍රතිඵල නිමවුම් දර්ශකය |
|---|---|
| 1. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ නීතිමය රාමුව සවිමත් කිරීම | ■ ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතයේ අක්‍රමිකතා අවම වීම.<br>■ වෘත්තීමය වශයෙන් තෘප්තිමත් ආයුර්වේද වෛද්‍යවරුන් බිහිවීම.<br>■ ආයුර්වේද ප්‍රතිකාර ආයතන නීතිමය පදනමක් මත ශක්තිමත් කිරීම. |
| 2. ආයුර්වේද පර්යේෂණ ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම | ■ ගුණාත්මක භාවයෙන් යුත් නව ආයුර්වේද නිෂ්පාදනවල ප්‍රමාණාත්මක වැඩි වීම.<br>■ ආයුර්වේද පර්යේෂකයින්ගේ අයිතීන් තහවුරු වීම.<br>■ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය සම්බන්ධ පිළිගැනීම පුළුල් වීම.<br>■ ආයුර්වේද පර්යේෂණ හා පර්යේෂකයින් සඳහා වැඩි අවස්ථාවන් සැළසීම.<br>■ බෝ නොවන රෝග පාලනය සඳහා දේශීය වෛද්‍ය ක්‍රම හඳුන්වා දීම.<br>■ සංරක්ෂණය වූ පාරම්පරික ආයුර්වේද ලේඛන ප්‍රමාණය ඉහළ යාම.<br>■ ආයුර්වේදයට සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතීන් සුරක්ෂිත වීම හා විධිමත් වීම.<br>■ තෘප්තිමත් ආයුර්වේද වෛද්‍ය සේවාවක් ස්ථාපිත වීම. |
| 3. ආයුර්වේදය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම | ■ යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් නිර්මාණය වීම.<br>■ ක්‍රමවත් ජාලගත මෙහෙයුම් පද්ධතියක් නිර්මාණය වීම.<br>■ ඊ - ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් නිර්මාණය වීම.<br>■ දේශීය වෙදකමේ නිම් වළලු පුළුල් වීම. |
| 4. ආයුර්වේද සෞඛ්‍ය සංරක්ෂණය යාවත්කාලීන හා වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය | ■ ගුණාත්මක භාවයෙන් යුත් මානව සම්පත ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>■ වෘත්තීමය වශයෙන් තෘප්තිමත් මානව සම්පත වැඩි වීම.<br>■ දේශීය වෛද්‍ය ක්‍රමය සඳහා ඇති ගෝලීය ඉල්ලුම සැපිරිය හැකි වීම.<br>■ පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුම හා කුසලතාවය නූතන සමාජ අවශ්‍යතාවය උදෙසා යාවත්කාලීන වීම.<br>■ නිපුණතාවයෙන් යුත් දේශීය වෛද්‍යවරු ප්‍රමාණාත්මකව වැඩි වීම.<br>■ රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයුර්වේද වෛද්‍ය ක්‍රම භාවිතා කරන්නන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා වැඩිදියුණු වී තිබීම. |
| 5. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ ඖෂධීය පැලෑටි වගා කිරීම, වැඩිදියුණු කිරීම සහ ඔසු උයන් ආරම්භ කිරීම | ■ ඉහළ ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක ඖෂධ ප්‍රමාණය වැඩිවීම.<br>■ ආයුර්වේදය තුළින් ආදායම් උත්පාදනය ඉහළ යාම.<br>■ ආයුර්වේද ඖෂධ සඳහා ඇති විදේශීය වෙළඳ පොළ අවස්ථා ඉහළ යාම.<br>■ භාවිතයට පහසු ඖෂධ නිෂ්පාදනය ඉහළ යාම. |
| 6. ආයුර්වේදය වාණිජකරණය අනුව පවත්වාගෙන යාම | ■ පාරම්පරික වෙදකම, ආයුර්වේද, සිද්ධ හා යුනානි වෛද්‍ය ක්‍රම ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත වීම.<br>■ විශේෂිත වූ ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සැපයීමට හැකිවන පරිදි නවීන පහසුකම් සහිත රෝහල් ඇති වීම.<br>■ පවතින ඔසු උයන් හා නව ඔසු උයන් උසස් තත්ත්වයට පත් වීම. |
| 7. හෝමියෝපති වෛද්‍ය ක්‍රම භාවිතය ඉහළ නැංවීම | ■ සේවාලාභීන් සඳහා වූ තෘප්තිමත් හෝමියෝපති වෛද්‍ය සේවාවක් ස්ථාපිත කිරීම.<br>■ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ආශ්‍රිත ආයතන විධිමත් ලෙස ස්ථාපිත වීම.<br>■ වෘත්තීමය වශයෙන් තෘප්තිමත් හෝමියෝපති මානව සම්පතක් ඇති වීම. |

## 03. දේශීය වෛද්‍ය අංශය යටතේ ඇති ආයතන



## 04. දේශීය වෛද්‍ය අංශය - 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය

| කාණ්ඩය/වැය විෂයය/අයිතමය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | **250,946,848.50** | **220,592,502.76** | **87.90** |
| සාමාන්‍ය පරිපාලනය / වෙනත් වැඩසටහන් | 211,946,848.50 | 184,678,568.93 | 87.13 |
| <u>ආයතන සේවා</u> | | | |
| රාජ්‍ය ආයතන | | | |
| i. හෝමියෝපති වෛද්‍ය සභාව | 16,000,000.00 | 15,632,730.28 | 97.70 |
| ii. පෝෂණ වැඩසටහන් | 5,000,000.00 | 4,853,249.50 | 97.06 |
| | 21,000,000.00 | 20,485,979.78 | 97.55 |
| • හෝමියෝපති රෝහල | 18,000,000.00 | 15,427,954.05 | 85.71 |
| **ප්‍රාග්ධන** | **179,021,469.00** | **99,185,141.97** | **55.40** |
| **සාමාන්‍ය පරිපාලනය** | 2,502,910.00 | 1,765,386.25 | 70.53 |
| විශේෂ වැඩසටහන් | | | |
| • ඖෂධ සංස්ථාව | 100,000,000.00 | 47,000,000.00 | 47.00 |
| • සංරක්ෂණ සභා | 7,000,000.00 | 5,740,278.61 | 82.00 |
| • හෝමියෝපති වෛද්‍ය සභාව | 2,500,000.00 | 1,824,409.02 | 72.98 |
| • හෝමියෝපති ක්‍රම සංවර්ධනය | 30,000,000.00 | 7,135,882.55 | 23.79 |
| • පෝෂණ මන්දිර ස්ථාපනය කිරීම | 7,000,000.00 | 5,900,626.54 | 84.29 |
| • ඖෂධ උයන් සඳහා නළ ළිං | 2,836,659.00 | 2,836,659.00 | 100.00 |
| අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහල් ගෙවන වාට්ටු සංකීර්ණය වැඩ නිම කිරීම | 27,181,900.00 | 26,981,900.00 | 99.26 |
| මුළු එකතුව | **429,968,317.50** | **319,777,644.73** | **74.37** |

**05.** ආයතන හා පාලන අංශය

**2018.12.31 දිනට**

| අනු අංකය | තනතුර | අදාළ වන සේවය | පන්තිය/ ශ්‍රේණිය | වැටුප් කේතය | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | අතිරේක ලේකම් (පාලන) | SLAS | විශේෂ | SL3-2016 | 01 | 01 | - |
| 02 | අතිරේක ලේකම් (සංවර්ධන) | SLAS | විශේෂ | SL3-2016 | 01 | 01 | - |
| 03 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | SLAS | I | SLI-2016 | 01 | 01 | - |
| 04 | අධ්‍යක්ෂ (සංවර්ධන) | SLAS | I | SLI-2016 | 01 | 01 | - |
| 05 | අධ්‍යක්ෂ (සැලසුම්) | SLPS | I | SLI-2016 | 01 | 01 | - |
| 06 | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS | I | SLI-2016 | 01 | 01 | - |
| 07 | අභ්‍යන්තර විගණක | SLAcS | III/II | SLI-2016 | 01 | - | 01 |
| 08 | ගණකාධිකාරී | SLAcS | III/II | SLI-2016 | 01 | 01 | - |
| 09 | සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) | SLAS | III/II | SLI-2016 | 01 | - | 01 |
| 10 | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | SLPS | III/II | SLI-2016 | 01 | 01 | - |
| 11 | සහකාර/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශිල්පීය වෛද්‍ය) | SLAyMS | III/II | SLI-2016 | 01 | 01 | - |
| 12 | සහකාර ලේකම්(පාලන) | SLAS | III | SLI-2016 | 01 | - | 01 |
| 13 | නීති නිලධාරී | Dept | III/II | SLI-2016 | 01 | - | 01 |
| 14 | පරිපාලන නිලධාරී | PMAS | Supra | MN7-2016 | 01 | 01 | - |
| 15 | භාෂා පරිවර්තක | TS | | MN6-2016 | 01 | - | 01 |
| 16 | සංඛ්‍යාලේඛන නිලධාරී | | | MN5-2016 | 01 | 01 | - |
| 17 | සංවර්ධන නිලධාරී | DOS | | MN4-2016 | 336 | 208 (ප්‍රා.ලේ.) 10 (ප්‍ර.කාර්යාලය) | 118 |
| 18 | සංවර්ධන සහකාර | ASSO.Officer | | MN4-2016 | 08 | 08 | - |
| 19 | සැපයුම් සහකාර | ASSO.Officer | | MN4-2016 | 02 | 01 (හෝමියෝපති රෝහල) | 01 |
| 20 | සංඛ්‍යාලේඛන සහකාර | ASSO.Officer | | MN4-2016 | 01 | 01 | - |
| 21 | අයවැය සහකාර | ASSO.Officer | | MN4-2016 | 01 | - | 01 |
| 22 | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | III/II/I/Sp | MN2-2016 | 23 | 16 | 07 |
| 23 | වීඩියෝ කැමරාකරු | Dept | | MT2-2016 | 01 | 01 | - |
| 24 | නිශ්චල ඡායාරූප ශිල්පී | Temporary | | PL3-2016 | 01 | - | 01 |
| 25 | රියදුරු | DS | | PLI-2016 | 14 | 05 | 09 |
| 26 | කැමරා සහායක | Dept | | PLI-2016 | 01 | - | 01 |
| 27 | කාර්යාල කාර්ය සහායක | OES | | PLI-2016 | 14 | 08 | 06 |
| 28 | කම්කරු | Dept | | PLI-2016 | 01 | 01 | - |

දේශීය වෛද්‍ය අංශය මඟින් ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන්

## I. දේශීය

| අනු අංකය | විස්තරය | පුහුණු ආයතනය | සහභාගී වූ සංඛ්‍යාව | වියදම රු. |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය නිලධාරියකුගේ කාර්යක්ෂමතාව කෙරෙහි ආහාර හා පෝෂණයේ වැදගත්කම | දේශීය වෛද්‍ය අංශය | 70 | 8,185.00 |
| 02. | කාර්ය පරිපාටි රීති හා ආයතන සංග්‍රහය | දේශීය වෛද්‍ය අංශය | 50 | 4,685.00 |
| 03. | කාර්යාල උපකරණ පාලනය පිළිබඳ වැඩමුළුව | Skills Development fund | 02 | 17,000.00 |
| 04. | සාර්ථක වෘත්තීය ජීවිතයකට ධනාත්මක ආකල්ප | දේශීය වෛද්‍ය අංශය | 60 | 10,045.00 |
| 05. | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිළිබඳ දෙදින වැඩමුළුව | Skills Development fund | 01 | 8,500.00 |
| 06. | සාර්ථක ජීවිතයක් සඳහා කළමනාකරණ මඟ පෙන්වීම | දේශීය වෛද්‍ය අංශය | 50 | 2,443.75 |
| 07. | Diploma in Public Procurement and Contract Administration | Miloda Academy of financial studies | 01 | 100,000.00 |
| 08. | කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන 2018 | දේශීය වෛද්‍ය අංශය | 60 | 37,280.00 |
| එකතුව | | | | **188,138.75** |

## II. විදේශීය

| පුහුණුවේ නම | පුහුණු ආයතනය/රට | කාලය | සහභාගී වූ නිලධාරීන් |
|---|---|---|---|
| BIMSTEC Conference on the Protection of Traditional Knowledge and Genetic Resources | තායිලන්තය | 2018 මැයි 21,22 | අතිරේක ලේකම් (සංවර්ධන)-දේශීය වෛද්‍ය අංශය |
| BIMSTEC Conference on the Protection of Traditional Knowledge and Genetic Resources | තායිලන්තය | 2018 මැයි 21,22 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශිල්පීය වෛද්‍ය) - දේශීය වෛද්‍ය අංශය |
| WHO- Expert for upcoming working group meetings to Develop WHO Documents on Benchmark for practice in Ayurveda/ Unani/ Panchakarma | ඉන්දියාව | 2018 සැප්තැම්බර් 17-19 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශිල්පීය වෛද්‍ය) - දේශීය වෛද්‍ය අංශය |
| WHO- Expert for upcoming working group meetings to Develop WHO Documents on Benchmark for practice in Ayurveda/ Unani/ Panchakarma | ඉන්දියාව | 2018 සැප්තැම්බර් 17-19 | අධ්‍යක්ෂ,ආයුර්වේද පර්යේෂණ රෝහල, නින්දවූර් |
| Training Programme on 'Diversity' Documentation Genc Banking and Data Base for Medical Plants for IORA Member Countries | ඉන්දියාව | 2018 නොවැම්බර් 25- දෙසැම්බර් 01 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහල |
| 8th World Ayurveda Congress and Arogya Expo- 2018 | ඉන්දියාව | 2018 දෙසැම්බර් 14-17 | ආයුර්වේද කොමසාරිස්, නියෝජ්‍ය අධ්‍යක්ෂ(ශිල්පීය වෛද්‍ය), ආයුර්වේද වෛද්‍ය නිලධාරී |
| Capacity Bulding Training Programme | Malayasia | 07 Days | 01 |

**සකස් කරන ලද අණපනත් හා ව්‍යවස්ථා**

- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ , සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/4/2/37/1(1)/2012 දිනැති 2018.12.07 ලිපිය මඟින් කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව වෙත යොමු කර ඇත.

- ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ කටයුතු අවසන් අදියරේ පවතී.

## 06. දේශීය වෛද්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති/වැඩසටහන්වල ප්‍රගතිය

### 6.1 ආයුර්වේද ජීවන දර්ශනය සහ පෝෂණය - දේශීය ආහාර රටාව තුළින් බෝ නොවන රෝග පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

**වැඩසටහන් අරමුණු**

- දේශීය ආහාර වල ඖෂධීය වටිනාකම පිළිබඳ දැනුවත් කිරීම
- මාතෘ හා ළමා පෝෂණය සම්බන්ධව දැනුවත් කිරීම.
- ප්‍රජාවගේ අපේක්ෂිත යහපත් සෞඛ්‍යමය චර්යාත්මක වෙනස්වීම් ඉලක්කගත වන සේ වැඩසටහන් සකස් කිරීම හා අන්තර් සන්නිවේදනය.
- පෝෂණ අවශ්‍යතාවයන් පිළිබඳ ස්වයං තක්සේරුවක යෙදීමට ප්‍රජාවට ප්‍රමාණවත් දැනුමක් ලබාදීම
- වකුගඩු රෝග වැනි කාලීන රෝග තත්ත්වයන්ගෙන් ප්‍රජාව වළක්වා ගැනීමට සෞඛ්‍ය සංරක්ෂණ උපාය මාර්ග පහදා දීම හා දායකත්වයක් දැක්වීම
- දේශීය ආහාර සැකසීම, වියැකී යන දේශීය ආහාර සංස්කෘතිය නැවත ස්ථාපනය උදෙසා ප්‍රජාව දැනුවත් කිරීම සඳහා ප්‍රායෝගික වැඩසටහන් සිදු කිරීම

පෝෂණ වැය ශීර්ෂය සඳහා රු.මිලියන 5ක් වෙන්වූ අතර ඒ යටතේ 2018.01.01 සිට 2018.12.31 දින දක්වා රු. 4,997,794.00ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාදීමට කටයුතු කර ඇත. එහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා අනුයුක්ත දේශීය වෛද්‍ය සංවර්ධන නිලධාරීන් 200 දෙනෙකු මඟින් ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශය වෙත ගෙන්වා විධිමත් ඇගයීමකින් පසු ප්‍රතිපාදන වෙන්කරනු ලබයි. එහිදී විශේෂයෙන් ව්‍යාපෘති මාතෘකාව, ඉලක්කගත ප්‍රජාව, හා ඇස්තමේන්තු සැකැස්ම හා එයින් ඇතිවන සමාජමය ප්‍රතිලාභය තියුණු ලෙස විමර්ශණය කරයි.

පෝෂණය පිළිබඳ දැනුවත් කිරීම උදෙසා කොට්ඨාශයට අනුයුක්ත ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණයකින් දේශීය වෛද්‍ය සංවර්ධන නිලධාරීන් මෙම කටයුතු මෙහෙයවන අතර ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ වැඩසටහන අධීක්ෂණය කරයි. යම් පෝෂණ වැඩසටහනක් අවසන් වූ පසු එහි ප්‍රගතිය අමාත්‍යාංශය වෙත එවිය යුතු අතර අනතුරුව දේශීය වෛද්‍ය අංශයේ අතිරේක ලේකම් හා අධ්‍යක්ෂ විසින් අධීක්ෂණය කිරීම සිදුවේ.

**ප්‍රතිලාභ**

- ළමා පෝෂණය වැඩිහිටි පෝෂණය සම්බන්ධව ශ්‍රී ලංකාව තුළ සිදු කර ඇති පර්යේෂණයන් සහ වැඩසටහන් ඉතා ගැඹුරින් සළකා බැලීමේදී පෙනී යන්නේ සෞඛ්‍ය සංරක්ෂණ උපාය මාර්ග ජනතාව අතරට ගෙන ගොස් දැනුවත් කිරීම තුළින් වඩා ඵලදායී ප්‍රතිඵල ලබා ගත හැකි බවයි. එනම් ප්‍රජාවගේ සහභාගීත්ව සන්නිවේදනය තුළින් පෝෂණ වැඩසටහන් පිළිබඳ මනා අවබෝධයක් ලබා දිය හැකිය. ඒ නිසා පසුගිය වසරක කාලය තුළ පෝෂණ තත්ත්වයන්හි කැපී පෙනෙන වර්ධනයක් දැන ගත හැකි වීම.

- දේශීය ආහාර සංස්කෘතිය රැකගැනීම උදෙසා සාර්ථක ලෙස ප්‍රජාව දැනුවත් කිරීමට හැකිවීම

- වකුගඩු රෝග වැනි බෝ නොවන රෝග පිළිබඳ, වස විස සහිත ආහාර සමාජගතවීමේ ව්‍යසනය පිළිබඳ විශාල වැඩසටහන් ප්‍රමාණයක් සිදු කිරීම මඟින් සෞඛ්‍ය සංරක්ෂණය උදෙසා විශාල දායකත්වයක් දැක්වීමට හැකිවීම.





| අනු අංකය | වැඩසටහන් ප්‍රවර්ගය | වැඩසටහන් ගණන | සහභාගී වූ ප්‍රමාණය | වැය කළ මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදු කරන ලද පෝෂණ වැඩසටහන් | 501 | එක් වැඩසටහනකට දළ වශයෙන් 50-100ත් අතර සංඛ්‍යාවක් | 4,687,894.00 |
| 02 | පෝෂණ වැඩසටහන් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය | 19 | | 309,900.00 |
| **එකතුව** | | **520** | | **4,997,794.00** |

### 6.2 පෝෂණ මන්දිර වැඩසටහන

2018 වර්ෂයේ අයවැය මගින් පෝෂණ මන්දිර ඉදිකිරීම සඳහා රු.මි. 7.0 ක් වෙන් කර තිබූ තිබූ අතර, එම ප්‍රතිපාදන වලින් 2018 වර්ෂයේ අළුතින් පෝෂණ මන්දිර 5 ක් ඉදි කරන ලදී. එම පෝෂණ මන්දිර ඉදිකිරීමටත්, ඒවාට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ලබා ගැනීමට ලබා දී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය පහතින් දැක්වේ.

| අනු අංකය | පෝෂණ මන්දිර ස්ථාපිත කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) | භෞතික ප්‍රගතිය | විවෘත කර ඇත/නැත |
|---|---|---|---|---|
| 01. | ගිරිබාව | 1,515,728.84 | 100% | නැත |
| 02. | මාස්පොත | 1,070,003.69 | 100% | නැත |
| 03. | කුලියාපිටිය (බටහිර) | 1,309,685.22 | 100% | විවෘත කර ඇත |
| 04. | වාරියපොල | 834,159.04 | 100% | විවෘත කර ඇත |
| 05. | පූජාපිටිය | 688,260.00 | 100% | විවෘත කර ඇත |

එසේම පෙර වර්ෂවල ඉදි කිරීම් ආරම්භ කළ පෝෂණ මන්දිර වල ඉදි කිරීම් අවසන් කිරීමටත්, ඒවාට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීමටත්, 2018 වර්ෂයේ ලද ප්‍රතිපාදන වලින් නිකුත් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය පහත පරිදි වේ.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | කාරණය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| 01. | ගලේවෙල | නාම පුවරුව සකස් කිරීමට | 5,500.00 |
| 02. | කොබෙයිගනේ | ඉදිකිරීම් අවසන් කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 443,948.68 |
| 03. | අම්පාර | ඉදිකිරීම් අවසන් කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 318,030.00 |
| 04. | ඉංගිරිය | ඉදිකිරීම් අවසන් කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 425,500.00 |
| 05. | බොරැල්ල පෝෂණ මන්දිරය | අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 87,703.91 |
| 06. | තිහගොඩ | ඉතිරි ඉදිකිරීම් වලින් කොටසක් සිදු කිරීමට හා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට | 254,575.18 |

මීට අමතරව, උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යන පෝෂණ පියසට අවශ්‍ය උපකරණ ලබා ගැනීමට රු.44,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් 2018.07.23 දින නිදහස් කර ඇත. ඒ අනුව, 2018 වර්ෂයේ ලද රු.මි.7.0 න් රු.6,997,094.56 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දී ඇත.

### 6.3 ආයුර්වේද සංරක්ෂණ සභා

**2018.01.01 සිට 2018.12.31 දින දක්වා ප්‍රගතිය**

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් සඳහා අදාළ ආයුර්වේද සංරක්ෂණ සභා 03 ක වෛද්‍යවරුන්ගේ පරිහරණය වෙනුවෙන් නව පුස්තකාල පහසුකම් ලබා දී ඇත. ඒ සඳහා එක් පුස්තකාලයක් වෙනුවෙන් වානේ අල්මාරියක් සහ දේශීය වෛද්‍ය පොත් මිල දී ගැනීමට රු. 50,000.00 බැගින් අදාළ ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

- පසුගිය වර්ෂ වල දී පුස්තකාල පහසුකම් ලබා දී ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 49 ක ආයුර්වේද සංරක්ෂණ සභා 49 ක් සඳහා නැවත අදාළ පොත් මිල දී ගැනීමට මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව පුස්තකාල 48 ක් වෙනුවෙන් රු. 20,000.00 බැගින් හා යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ආයුර්වේද සංරක්ෂණ සභාව වෙනුවෙන් රු. 14,601.18 ලෙස මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

- ආයුර්වේද සංරක්ෂණ සභා 03 ක් සඳහා ගොඩනැගිලි ඉදි කිරීම වෙනුවෙන් පහත පරිදි අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ආයුර්වේද සංරක්ෂණ සභාව | ප්‍රතිපාදන ප්‍රමාණය (රු.) |
|---|---|---|---|
| 01 | ඉබ්බාගමුව | ඉබ්බාගමුව | 1,296,663.89 |
| 02 | වැල්ලවාය | වැල්ලවාය | 1,998,693.12 |
| 03 | කොරළෙයිපත්තු (දකුණ) | කොරළෙයිපත්තු (දකුණ) | 2,000,000.00 |

- ඇහැළියගොඩ ආයුර්වේද සංරක්ෂණ සභාවට අදාළ ඔසු උයනක් නිර්මාණය කිරීම වෙනුවෙන් ආරක්ෂිත වැටක් ඉදි කිරීම සඳහා එම ප්‍රාදේශීය ලේකම් වෙත රු. 440,000.00 ක මුදල් ප්‍රතිපාදන ලබා දී ඇත.

❖ 2017 වර්ෂයේ ප්‍රතිපාදන මත නිෂ්පාදනය කරන ලද ඖෂධ නිෂ්පාදන උපකරණ 19 ක් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රවාහනය කිරීම වෙනුවෙන් රු. 140041.84 ක් ප්‍රවාහන වියදම් ලෙස ලබා දී ඇත.



ගනේවත්ත සංරක්ෂණ සභා ගොඩනැගිල්ල



යටියන්තොට පුස්තකාලය

## 6.4 ආයුර්වේද එක්ස්පෝ - 2018

ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පූර්ණ සහයෝගය සහ අනුග්‍රහය යටතේ අනෙකුත් රාජ්‍ය ආයතනද සමඟ එක්ව ආයුර්වේද එක්ස්පෝ 2018 ජාත්‍යන්තර දේශීය වෛද්‍ය ප්‍රදර්ශනය, සල්පිල හා සම්මන්ත්‍රණය ජූලි මස 13,14 සහ 15 යන දිනයන්හි බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.

දේශීය වෛද්‍ය ක්‍රමය හා ආයුර්වේද නිෂ්පාදනයන්හි විශිෂ්ඨත්වය පිළිබඳව මහජනතාවගේ අවධානය ඉහළනැංවීම හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රචලිත කිරීම මෙහි අරමුණ වේ.









## 07. දේශීය වෛද්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ පිවිසුම

රාජ්‍ය අංශය පරිගණක දැනුම අතින් සන්නද්ධ කිරීම සඳහා වූ ජාතික වැඩපිළිවෙල යටතේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජායතනයෙන් නිකුත් කළ ප්‍රතිපත්ති අංක 101101 හා 101102 යටතේ දේශීය වෛද්‍ය අංශයේ තොරතුරු තාක්ෂණ අංශය ක්‍රියාත්මක වේ. දේශීය වෛද්‍ය අංශය හා අනුබද්ධ ආයතනවල තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන්ට ඇවැසි උපදෙස් හා සහයෝගය දෙන අතරම දේශීය වෛද්‍ය ක්‍රමයේ දැනුම හා යහපත් සෞඛ්‍ය පුරුදු ලක් වැසි ජනතාවට හා ලෝකවාසී ජනතාව අතර පැතිරවීමේ ඩිජිටල් කාර්යභාරය මෙම අංශයේ ප්‍රධාන කාර්යයි.

1. දේශීය වෛද්‍ය අංශයේ අවශ්‍යතා සඳහා මෘදුකාංග විසඳුම් සැපයීම
2. You tube video sharing පද්ධතියක් සැකසීම
3. දේශීය වෛද්‍ය අංශයේ කාර්යභාරය හා දැනුම ව්‍යාප්ත කිරීම සඳහා සමාජ ජාලා වෙබ් අඩවි තුළ ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීම
4. නව තාක්ෂණික ක්‍රමෝපායන් හඳුන්වා දීම
5. මුද්‍රණ යන්ත්‍ර පොදු භාවිතය
6. අන්තර්ජාල සබඳතා කළමනාකරණය කිරීම
7. LGN. 02. ලබාගෙන සියළුම පරිගණක සඳහා රැහැන් රහිත අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබාදීම
8. ජාල කළමනාකරණය
9. දේශීය වෛද්‍ය අංශයේ විද්‍යුත් තැපැල පවත්වාගෙන යාම
10. පරිගණක දෝෂ නිරාකරණය කිරීම
11. උත්සව හා රැස්වීම් අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘෂ්‍ය පහසුකම් සැපයීම හා හැසිරවීම
12. දේශීය වෛද්‍ය අංශයේ සියළුම ග්‍රැෆික් නිර්මාණ කටයුතු (පොත් කවර, දැන්වීම්, බැනර් සහ සංයුක්ත තැටි නිර්මාණය කිරීම)

.



# ආයුර්වේද දෙපාර්තමේන්තුව

## 08. ආයුර්වේද දෙපාර්තමේන්තුව



**දැක්ම**

ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම තුළින් සැමට සුවසෙත

**මෙහෙවර**

ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා අනන්‍යතාවය සුරක්ෂිත කිරීම තුළින් සැමට සුවසෙත ළඟා කර දීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

අයුර්වේද දෙපාර්තමේන්තුව දේශීය වෛද්‍ය අංශයේ කාර්යය භාරය හා මෙහෙවර ඉටු කරන ප්‍රධාන ආයතනය වන අතර 1961 අංක 31 දරණ පනත යටතේ ස්ථාපිත කර ඇත. මෙහි ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

01. ආයුර්වේදය අනුව රෝග සුව කිරීම, සෞඛ්‍ය සංරක්ෂණය හා රෝග වළක්වාලීම.
02. ආයුර්වේද පර්යේෂණ කාර්යයන් දිරිමත් කිරීම, ආයුර්වේද අධ්‍යාපනය ඖෂධ වගා සංවර්ධනය, ඖෂධ නිෂ්පාදනය හා ජනතාව දැනුවත් කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

- පර්යේෂණ හා ශික්ෂණ කටයුතු සඳහා රෝහල් හා අනෙකුත් අංශ පිහිටුවීම හා නඩත්තු කිරීම.
- සම්මන්ත්‍රණ, අභ්‍යාස පන්ති හා අධ්‍යයන පාඨමාලා පැවැත්වීම.
- සායනික වෛද්‍ය සේවා හා සාහිත්‍ය පර්යේෂණ පැවැත්වීම.
- ඖෂධීය ශාක වගා කිරීම, සංරක්ෂණය හා ප්‍රචලිත කිරීම.
- දිවයිනේ සියළු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අධීක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම.
- ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා ආයුර්වේ ඖෂධ නිෂ්පාදන ආයතන හා පෞද්ගලික ආයුර්වේද අධ්‍යාපනයට අදාළ කටයුතු සඳහා නීති හා රෙගුලාසි සකස් කිරීම.

# ආයුර්වේද දෙපාර්තමේන්තුව

## ප්‍රධාන කාර්යාලය

1. ආයතන සහ පාලන අංශය
2. ශිල්පීය අංශය
3. ගිණුම් අංශය
4. සංවර්ධන අංශය
5. විභාග අංශය

## ආයුර්වේද ශික්ෂණ රෝහල්

1. ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල
2. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල -යක්කල
3. සිද්ධ ශික්ෂණ රෝහල - කයිතඩි
4. සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය
5. යුනානි ආයුර්වේද රෝහල - මත්වන්තුඩුව

## නාවින්න ආයුර්වේද පර්යේෂණායතනය

## ආයුර්වේද පර්යේෂණ රෝහල්

1. හම්බන්තොට ආයුර්වේද පර්යේෂණ රෝහල
2. පාරම්පරික පර්යේෂණ රෝහල, මිහින්තලය
3. අම්පාර ආයුර්වේද රෝහල
4. නාවින්න ආයුර්වේද පර්යේෂණ රෝහල
5. මැදවච්චිය ආයුර්වේද පර්යේෂණ රෝහල
6. නින්දවූර් ආයුර්වේද පර්යේෂණ රෝහල

## දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

## ඔසු උයන්

1. ගිරාදුරුකෝට්ටේ
2. පල්ලේකැලේ
3. හල්දුම්මුල්ල
4. පින්නදූව
5. පට්ටිපොළ
6. කන්නෙලිය
7. නාවින්න
8. මිහින්තලේ
9. වෙදගම

## අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය

## (1) ආයතන හා පාලන අංශය - ආයතනික කාර්යයන්

| අනු අංකය | කාර්යය | සේවක ගණය | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බඳවා ගැනීම් | **ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්** | **650** |
| | | ආයුර්වේද වෛද්‍ය | |
| | | II ශ්‍රේණිය 2015.03.09 දිනට පත්වීම් | 09 |
| | | II ශ්‍රේණිය 2016.11.01 දිනට පත්වීම් | 23 |
| | | ඒකාබද්ධ රියදුරු සේවය | |
| | | I ශ්‍රේණිය | 01 |
| | | I ශ්‍රේණිය | 01 |
| 2 | උසස්වීම් ලබා දීම | උපස්ථායක | 23 |
| | | විදුලි කාර්මික | 01 |
| | | ආහාර නිරීක්ෂක | 01 |
| | | රසායනාගාර සේවක | 04 |
| | | ඖෂධ සංයෝජක | 03 |
| | | ටිකට් ලිපිකරු | 01 |
| | | සුළු සේවා පාලක | 02 |
| | | සංචාරක බංගලා භාරකරු | 03 |
| 3 | කාර්ය මණ්ඩල අනුමත කිරීම් | **BMARI ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය සඳහා බඳවාගැනීමට අනුමත කාර්ය මණ්ඩලය** | |
| | | ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය භාර නිලධාරී | 01 |
| | | වැඩසටහන් නිෂ්පාදක | 01 |
| | | තාක්ෂණ නිලධාරී | 01 |
| | | පරිගණක ක්‍රියාකරු | 01 |
| | | කැමරා ශිල්පී | 01 |
| | | වීඩියෝ සංස්කාරක | 01 |
| | | ශබ්ද සංස්කාරක | 01 |
| | | ආයුර්වේද සේවා සහායක | 01 |
| | | **ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවාවේ තනතුරු අනුමත කාර්ය මණ්ඩලය** | |
| | | අධ්‍යක්ෂ | 01 |
| | | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | 22 |
| | | ලියාපදිංචි දේශීය වෛද්‍ය | 84 |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 01 |
| | | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරී | 210 |
| | | රියදුරු | 01 |
| | | කම්කරු | 08 |
| 4 | අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය | බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරු සංශෝධනය කිරීම | |
| | | රාජ්‍ය කළමනාකරණ සහකාර | 19 |

දේශීය පුහුණු වැඩසටහන්

| අනු අංකය | පැවැත් වූ ආයතනය හා ස්ථානය | සහභාගී වූ පුහුණු පාඨමාලාව හා සේවක ගණය | කාලය |
|---|---|---|---|
| 01 | ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුව | පොත් බැඳුම්කරුවන් පුහුණු කිරීම<br>ආයුර්වේද සේවා සහයක | මාස 01 |
| 02 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | කාර්යාල ක්‍රම හා මුදල් රෙගුලාසි පුහුණු පාඨමාලාව<br>රාජ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 01 |
| | | වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ නිලධාරීන් -13 | දින 01 |
| | | පෞද්ගලික ලිපිගොනු ඵලදායි ආකාරයෙන් පවත්නාගෙන යාම<br>ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් -03 | දින 01 |
| | | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සැකසීම<br>ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් -03 | දින 01 |
| | | පිළිගැනීම් නිලධාරීන්ගේ හා දුරකථන ක්‍රියාකරුවන්ගේ කුසලතා වර්ධන දෙදින පුහුණු වැඩසටහන<br>කාර්යාල කාර්යය සහයක -03 | දින 02 |
| | | ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා කාර්යාල කාර්ය සහයකයින් සහ රියදුරන්ගේ වෘත්තීය සංවර්ධනය<br>කාර්යාල කාර්යය සහයක -03 | දින 01 |
| | | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි<br>ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් -02 | දින 02 |
| 03 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අධිකාරිය | අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලනය පිළිබඳ වැඩමුළුව<br>සංවර්ධන නිලධාරී -01<br>රාජ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 02 |
| | | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි<br>රාජ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 02 |
| | | අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලනය පිළිබඳ වැඩමුළුව<br>වෛද්‍ය නිලධාරීන් -01<br>සංවර්ධන නිලධාරීන් -01 | දින 02 |
| 04 | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | තොරතුරු තාක්ෂණය පිළිබඳ එක්දින වැඩසටහන වෛද්‍ය නිලධාරීන් -04 | දින 01 |
| 05 | මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | රාජ්‍ය නිලධාරීන් සඳහා දෙමළ භාෂා දින 06 (පැය 50) පුහුණු වැඩසටහන<br>ආයුර්වේද සේවා සහයක - 04<br>රියදුරන් -03 | දින 07 |
| 06 | Modern Research & Development Complex, Industrial Technology Institute Maiabe | Training Programme on Essential Oils, Herbal Cosmetics<br>වෛද්‍ය නිලධාරීන් -02 | දින 08 |
| 07 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | Workshop on IT Procurement Management<br>සංවර්ධන නිලධාරීන් -01<br>රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර -01 | දින 02 |

විදේශ පුහුණු වැඩසටහන්

| අනු අංකය | සේවක ගණන | සහභාගී වූ පාඨමාලාව | සහභාගී වූ ප්‍රමාණය | රට | කාලය |
|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ, නාවින්න ආයුර්වේද පර්යේෂණායතනය | 2018 Seminar on Traditional Chinese Medicine for Developing Countries | 01 | චීනය | දින 18 |
| 2 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | | 04 | | |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආයුර්වේද ශික්ෂණ රෝහල, බොරැල්ල | | 01 | | |
| 4 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Modernization of Traditional Medicine | 3 | කොරියාව | දින 23 |
| 5 | විශේෂඥ වෛද්‍ය නිලධාරී | Sithargal Thiruvizha | 1 | ඉන්දියාව | දින 03 |
| 6 | ගණකාධිකාරී (ගිණුම්) | International Programme on Management Auditing for the Public Sector Internal Auditors | 1 | මැලේසියාව | දින 07 |
| 7 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Training for Medical Workers from Developing Countries | 1 | චීනය | මාස 01 |
| 8 | සහකාර කොමසාරිස් (ශිල්පීය) | 2018 Seminar on Traditional Chinese Medical Culture for countries Under Belt & Road Initiative | 1 | චීනය | දින 20 |
| 9 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | | 1 | | |
| 10 | ආයුර්වේද කොමසාරිස් | Training Programme on International Exposure & Professional Development programme on Social Responsibility & Effective Management | 1 | තායිලන්තය | දින 10 |
| 11 | අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය | | 1 | | දින 10 |
| 11 | සහකාර කොමසාරිස් (සංවර්ධන) | | 1 | | දින 10 |
| 12 | සහකාර කොමසාරිස් (ආයතන) | | 1 | | දින 10 |
| 13 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Overseas Training Programme for Postgraduate Scholars of Postgraduate Diploma Kayacikitsa/Panchakarma | 10 | ඉන්දියාව | දින 10 |
| 14 | හෙද සොයුරිය | Seminar on Medical Equipment Research Development & Maintenance for Developing Countries | 1 | චීනය | දින 21 |
| 15 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Training on Essential Oil, Perfumery & Aromatherapy FFDC | 1 | ඉන්දියාව | දින 07 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 16 | ප්‍රධාන ගණකාධිකාරී | Public Financial Management Workshop for Accountants in Singapore from 03-07 September 2018 | 1 | සිංගප්පූරුව | දින 07 |
| 17 | ගණකාධිකාරී (වැටුප්) | | 1 | | |
| 18 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Foreign Study Tour M.Sc. Ayurvedic Hospital Management Programme (2017 Intake) | 9 | ජපානය | දින 10 |
| 19 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | Training Programme on "Diversity, Documentation, Gene Banking and Database for Medical Plants'' for IORA Member Countries, 25th November 2018 to 01st December 2018, Laknow, India | 1 | ඉන්දියාව | දින 07 |
| 20 | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | International Workshop on Drugs Development from Herbs and Marine Medicinal Materials, Vietman from 10 -12 December | 1 | වියට්නාමය | දින 5 |
| 21 | ආයුර්වේද කොමසාරිස් | World Ayurvedic Congress 2018 | 1 | ඉන්දියාව | දින 04 |
| | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | | 7 | | දින 05 |

**සංවර්ධන අංශය**
**ආයතනික කාර්යයන්**

- **හිසතෙල් ගෑමේ උත්සවය - 2018.04.15**

සිංහල සහ හින්දු අලුත් අවුරුදු නිමිති කොට පවත්වන හිසතෙල් ගෑමේ මහෝත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කථානායක ගරු දේශබන්ධු කරු ජයසූරිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු රාජිත සේනාරත්න මැතිතුමාගේ සහභාගීත්වයෙන් අත්තනගල්ල පුරාණ රජමහා විහාර භූමියේදී උත්සවශ්‍රීයෙන් පවත්වන ලදී.

**ආ) අනෙකුත් වැඩසටහන්**
**රෝගී ප්‍රතිකාර සේවා - ජංගම සායන**

| වැඩසටහන | සායනය පැවැත්වූ ආයතනය | පැවැත්වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල | 35 |
| | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල | 11 |
| | ආයුර්වේද රෝහල - අම්පාර | 17 |
| | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට | 12 |
| | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය - නාවින්න | 06 |
| | බෝ නොවන රෝග ආයුර්වේද පර්යේෂණ රෝහල - නින්දවූර් | 01 |
| | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු (ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් පවරනු ලැබූ) | 16 |
| | සම්බන්ධීකරණය කරන ලද මුළු වැඩසටහන් ගණන | 98 |

**අනෙකුත් සේවා**

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිලාභී/ ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| 1. | දේශීය පාන වර්ග ජනප්‍රිය කිරීමේ වැඩසටහන | 45,500 |
| 2. | නොමිලේ පැල ලබා දීම (රාජ්‍ය ආයතන, පාසල්, පන්සල් සඳහා) | 22,053 |
| 3. | ප්‍රදර්ශන | 21 |
| 4. | ඖෂධ උයන් නැරඹීම සඳහා ඉල්ලීම් | 19 |

**ඉදිකිරීම් ප්‍රගතිය**

| වැය විෂය | කාර්යය | මූල්‍ය ප්‍රතිපාදන (රු. මිලි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 2- 1-2104 | 2 අදියරේ ඉදිකිරීම් කටයුතු- ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල | 356.2 | 337.890 | සැලසුම් කරන ලද ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත |
| 2-3-2104 | ඖෂධාලය ඉදිකිරීම- ආයුර්වේද ශික්ෂණ රෝහල - කයිතඩි | 11.66 | 11.65 | |
| 2- 5-2104 | සිද්ධ වෛද්‍ය ශික්ෂණ රෝහල -ත්‍රිකුණාමලය | .244 | | සංශෝධිත ඇස්තමේන්තු මුදල කැබිනට් අනුමැතියට යොමු කර ඇත. මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශන ආයතනයෙන් සැලැස්මක් කැඳවා ඇත. |
| 2-2104 | ප්‍රජා සෞඛ්‍ය කාර්යාල ඉදි කිරීම | 35 | 16.238 | රඹෑව ප්‍රජා සෞඛ්‍ය කාර්යාල ඉදි කිරීම - 85%<br>තිරප්පනේ ප්‍රජා සෞඛ්‍ය කාර්යාලය ඉදි කිරීම -60%<br>නාච්චදූව ප්‍රජා සෞඛ්‍ය කාර්යාලය ඉදි කිරීම - 70% |
| 4-2104 | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය | 2 | - | ප්‍රතිපාදන පවරා ඇති අතර අක් මුදල් ලැබී නොමැත. |
| | නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම, ටයිල් කිරීම සහ සිවිලිම | | | භෞතික ප්‍රගතිය - 100% |
| 5-2104 | ඖෂධ උයන් | 6 | 5.9 | |
| | පට්ටිපොල ඖෂධ උයන | | | භෞතික ප්‍රගතිය - 80% |

අලුත්වැඩියා කටයුතු ප්‍රගතිය

| වැය විෂය | කාර්යය | මූල්‍ය ප්‍රතිපාදන (රු. මිලි.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1-2001 | ප්‍රධාන කාර්යාලය | 2.5 | 1.9 | 100% |
| 2-2001 | ශික්ෂණ රෝහල් | 65 | 19.95 | ප්‍රතිපාදන පවරා ඇති අතර අක් මුදල් ලැබීනොමැත |
| | ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරුල්ල | | | 80% |
| | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල | | | 75% |
| | ආයුර්වේද ශික්ෂණ රෝහල - කයිතඩි | | | 70% |
| | ආයුර්වේද රෝහල - මන්චන්තුඩුවායි | | | 100% |
| | ආයුර්වේද රෝහල - අම්පාර | | | 100% |
| 3-2001 | පර්යේෂණ රෝහල් | 32 | 15.8 | ප්‍රතිපාදන පවරා ඇති අතර අක් මුදල් ලැබීනොමැත |
| | චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට | | | 100% |
| | බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය - නාවින්න | | | 90% |
| 4-2001 | දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය | 14 | 0.083 | 100% |
| 5-2001 | ඖෂධ උයන් | 6 | 5.338 | 2017 අක් මුදල් නොලැබීම් වලට හිඟ මුදල් ගෙවා ඇත |

ඖෂධ ගොවි ව්‍යාපෘතිය



මෙම ව්‍යාපෘතිය යටතේ වගා ක්ෂේත්‍ර ආරම්භ කිරීම සඳහා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් පහත සඳහන් ක්ෂේත්‍රයන්හි අවසන් කිරීම.

**ක්ෂේත්‍ර වටා ආරක්ෂිත වැටවල් ඉදි කිරීම**

අක්මීමන - ගල්ගමුව

කහටගස්දිගිලිය - ඇටවීරගොල්ල

පොල්පිතිගම - රාවා ඇළ වගා



**ළිං ඉදි කිරීම** - පොල්පිතිගම - බෝගොල්ල
කහටගස්දිගිලිය - ඇටවීරගොල්ල

**ඖෂධීය වගා ක්ෂේත්‍ර ස්ථාපනය සඳහා කටයුතු කිරීම**

(අ) හල්දුම්මුල්ල, පට්ටිපොළ, ගිරාදුරුකෝට්ටේ හා පින්නදූව ඔසු උයන්වලින් රෝපණ ද්‍රව්‍ය සකස් කර වගා ක්ෂේත්‍ර වෙත බෙදා දීම.

සැවැන්දරා, රත්නිටුල්, බැබිල, ඉඟුරු පියලි, කිරිබද්ද, මලිත, හීං අරත්ත, ඉරිවේරිය, හාතවාරිය, බුළු, ගම්මාළු, අංකෙන්ද, මී, මඟුල් කරඳ, කරාබු, කරපිංචා, බෙලි, නා,රුක්, නෙල්ලි, බෙහෙත් බැබිල





බීජ ලබාදීම - කටුවැල් බටු, තිරස්වාලු, නිල් අවරිය, සෙනෙහෙකොළ, කපු, කිනිස්ස, අමුක්කරා වගා ක්ෂේත්‍ර ආරම්භ කර ඇති ස්ථාන



i. පදවිය - (දේශීය වී වර්ග ඇතුළුව ඖෂධීය ශාක)
ii. අලව්ව - ගලතරය
iii. පොල්පිතිගම - රාවා ඇල
iv. පොල්පිතිගම - බෝගොල්ල



.

අක්මීමන හා කහටගස්දිගිලිය පැල තවාන් ස්ථාපිත කර ඇති අතර ක්ෂේත්‍ර වගාවන් ලබන වසර මුල් කාලයේදී සිදු කිරීමට අපේක්ෂිතයි

**BACC ව්‍යාපෘතිය**

1. ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පහළ ගිරිබාව හා වන්නිකුඩාවැව ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි ගෙවතු 100ක් සංවර්ධනය සඳහා එක් ගෙවත්තකට ඖෂධීය ශාක 20 බැගින් බෙදා දීම. (2018.11.10 හා 11)

2. ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගිරිබාව කණිෂ්ඨ විදුහලේදී 2018.12.20 දින පැවති ඖෂධීය ශාක හඳුනාගැනීම හා භාවිතයන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ "ජෛව විවිධත්ව පොළ" සඳහා ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරමින් දැනුවත් කිරීම් සිදු කිරීම.

3. ජෛව විවිධත්ව ලේඛනය ( Community Biodiversity Register) සකස් කිරීමට අදාළව ඖෂධීය ශාක ඡායාරූප හා තොරතුරු රැස් කිරීම හා රැස් කර ඇති තොරතුරු නැවත සාකච්ඡා කිරීම මඟින් ලේඛනය යාවත්කාලීන කිරීම. (2018.11.21)

4. ඖෂධීය ශාක ඇසුරින් ස්වයං රැකියා සඳහා නිෂ්පාදන හඳුන්දීමේ වැඩසටහන යටතේ පහළ ගිරිබාව හා වන්නිකුඩා වැව ගම්වැසියන් 33ක් සඳහා මදුරුනාශක හඳුන්කූරු නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ හා පුහුණු වැඩමුළුවක් පැවැත්වීම. (2018.11.22)

5. පහළ ගිරිබාව හා වන්නිකුඩාවැව ගම්මාන දෙකෙහි ඖෂධීය ශාක වගාවන් හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම හා ඉඩම් හා ගොවීන් 35ක් හඳුනාගැනීම. (2018.11.20 හා 21)

6. ගිරිබාව, මිල්ලනිය හා උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනෙහි ග්‍රාම නිලධාරී වසම් 09ක සිදු කරන ලද ඖෂධීය ශාක පිළිබඳ ගෙවතු සමීක්ෂණ ඇසුරින් සකස් කරන ලද ග්‍රන්ථ 03 මුද්‍රණය සඳහා පැලැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ පිහිටි ව්‍යාපෘති කාර්යාලය වෙත භාරදීම.

7. ගෙවතු සමීක්ෂණ ඇසුරින් හඳුනාගත් ඌන භාවිතා ඖෂධීය ශාක 50ක් පිළිබඳ ශාක සංග්‍රහය සකස් කිරීම සඳහා තෝරා ගත් සම්පත්දායකයන් විසින් ශාකයේ උද්භිද විද්‍යාත්මක හඳුනාගැනීම, රසායනික සංඝටක ඒවා ආශ්‍රිත පර්යේෂණ, ඖෂධීය ගුණ භාවිතයෙන්, කෘෂි විද්‍යාත්මක තොරතුරු හා වෙනත් තොරතුරු යටතේ ලිපි රචනා කිරීම ආරම්භ කිරීම.

**ශිල්පීය අංශය**

**ආයුර්වේද සමාගම් ලියාපදිංචි කිරීම / බලපත්‍ර නිකුත් කිරීම/නිර්දේශ කිරීම**

| කාරණය | ලියාපදිංචි කළ ආයතන සංඛ්‍යාව | ලැබූ ආදායම (රු.) |
|---|---|---|
| ලියාපදිංචි කිරීම | ප්‍රතිකාර මධ්‍යස්ථාන | 420,400.00 |
| | පංචකර්ම ආයතන | 222,000.00 |
| | හෝටල් තුළ පංචකර්ම ආයතන | 87,000.00 |
| | රෝහල් | 54,000.00 |
| | | **783,400.00** |

**ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර නිකුත් කිරීම**

| කාරණය | ආයතන සඳහා බලපත්‍ර නිකුත් කළ සංඛ්‍යාව | | ලැබූ ආදායම (රු.) |
|---|---|---|---|
| බල පත්‍ර නිකුත් කිරීම් | පෞද්ගලික ආයුර්වේද රෝහල් | 27 | 214,375.00 |
| | නිෂ්පාදනාගාර | 166 | 604,000.00 |
| | ප්‍රවාහන | 35 | 22,500.00 |
| | වෙළඳසැල් | 239 | 253,250.00 |
| | හෝටල් ආශ්‍රිත පංචකර්ම | 35 | 310,000.00 |
| | පංචකර්ම ආයතන | 42 | 336,000.00 |
| | ආනයනික ඖෂධ සඳහා - නව | 55 | 676,000.00 |
| | ආනයනික ඖෂධ සඳහා - අළුත් කිරීම් | 71 | 392,166.66 |
| | දේශීය ඖෂධ සඳහා - නව | 37 | 80,833.33 |
| | දේශීය ඖෂධ සඳහා - අළුත් කිරීම් | 97 | 93,000.00 |
| **එකතුව** | | **804** | **2,982,124.99** |

** ග්‍රන්ථ සකස් කිරීම හා මුද්‍රණය - ආයුර්වේද සමීක්ෂාව ග්‍රන්ථ 750ක් මුද්‍රණය කර ඇත.

**අනු කමිටු පැවැත්වීම**

| අනු අංකය | කමිටුව | පැවැත්වූ වාර ගණන |
|---|---|---|
| 01. | තාක්ෂණික කමිටුව | 12 |
| 02. | රීති සම්පාදන කමිටුව | 02 |
| 03. | මාධ්‍ය වාරණ | 01 |
| 04. | සූත්‍ර කමිටුව | 09 |
| 05. | තීරු බදු රහිත ඖෂධ ආනයන කමිටුව | 21 |
| 06. | සමීක්ෂාව අවසන් සෝදුපත් බැලීමේ කමිටුව | 02 |
| 07. | අයදුම්පත් සකස් කිරීමේ කමිටුව | 52 |

** මූලික විමර්ශන/විනය පරීක්ෂණ පැවැත්වීම සහ නිර්දේශ නිකුත් කිරීම් 35ක් සිදු කර ඇත.

** ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර සඳහා කංසා, පරිපාක ස්පිතු නිර්දේශ ලබා දීම.

කංසා චූර්ණය - කි.ග්‍රෑම්. 113.640
පරිපාක ස්පිතු - ලීටර 47,200

** 2018 වර්ෂයේ හිස තෙල් ගෑමේ රාජ්‍ය උත්සවය වෙනුවෙන් ආයුර්වේද ලිත හා අවුරුදු අත් පොත සැලසුම් කිරීම, මුද්‍රණය කිරීම හා දිවයින පුරා බෙදා හැරීම

ලිත් - සිංහල මාධ්‍ය - 75,000
දෙමළ මාධ්‍ය - 5,000

අවුරුදු පොත් - සිංහල මාධ්‍ය - 6,250
දෙමළ මාධ්‍ය - 1,250

මූල්‍ය අංශය

**2018 මූල්‍ය ප්‍රගතිය**

| කාණ්ඩය/වැය විෂයය/අයිතමය | ප්‍රතිපාදන (රු.) | වියදම (රු.) | වියදම් ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **1,590,600,000.00** | **1,558,332,006.00** | **97.97** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 114,900,000.00 | 112,748,792.00 | 98.13 |
| 2. රෝහල් සේවා | 1,136,964,569.00 | 1,121,710,306.00 | 98.66 |
| 3. පර්යේෂණ | 229,500,000.00 | 215,193,409.00 | 93.77 |
| 4. අධ්‍යාපන හා පුහුණු | 29,730,500.00 | 29,676,585.00 | 99.82 |
| 5. ඖෂධ වගාව, සංරක්ෂණය හා ව්‍යාපතිය | 79,504,931.00 | 79,002,914.00 | 99.37 |
| | | | |
| **ප්‍රාග්ධන වියදම්** | **651,000,000.00** | **473,710,794.00** | **72.77** |
| 1. සාමාන්‍ය පරිපාලනය | 10,700,000.00 | 5,517,849.00 | 51.57 |
| 2. රෝහල් සේවා | 493,600,000.00 | 401,822,357.00 | 81.41 |
| 3. පර්යේෂණ | 79,900,000.00 | 24,891,331.00 | 31.15 |
| 4. අධ්‍යාපන හා පුහුණු | 42,900,000.00 | 24,718,945.00 | 57.62 |
| 5. ඖෂධ වගාව හා සංරක්ෂණ ව්‍යාපෘතිය | 23,900,000.00 | 16,760,312.00 | 70.13 |
| **මුළු වියදම්** | **2,241,600,000.00** | **2,032,042,800.00** | **90.65** |
| | | | |
| 1. සාමාන්‍ය පරිපාලනය | 125,600,000.00 | 118,266,641.00 | 94.16 |
| 2. රෝහල් සේවා | 1,630,564,569.00 | 1,523,532,663.00 | 93.44 |
| 3. පර්යේෂණ | 309,400,000.00 | 240,084,740.00 | 77.60 |
| 4. අධ්‍යාපන හා පුහුණු | 72,630,500.00 | 54,395,530.00 | 74.89 |
| 5. ඖෂධ වගාව හා සංරක්ෂණ ව්‍යාපෘතිය | 103,404,931.00 | 95,763,226 | 92.61 |

2018.01.01 සිට 2018.12.31 දින දක්වා අත්තිකාරම් ˜බී˜ ගිණුමට සම්බන්ධ මාසික ලැබීම් හා ගෙවීම්

| **කාලය** | **ගෙවීම් (රු.)** | **ලැබීම් (රු.)** |
|---|---|---|
| ජනවාරි - දෙසැම්බර් | 52,838,375.55 | 39,654,993.96 |

**සැපයුම් අංශය**

| අනු අංකය | ප්‍රසම්පාදන විෂය | 2018.01.01- 2018.12.31 කාලය තුළ වියදම | | | | |
|---|---|---|---|---|---|---|
| | | මෙහෙයුම් | රෝගී සත්කාර | පර්යේෂණ | අධ්‍යාපනික | ඔසු උයන් |
| 01. | නිමි ඖෂධ | - | 41,334,098.00 | 18,885,535.00 | - | - |
| 02. | අමු ඖෂධ | - | 4,034,684.00 | - | - | - |
| 03. | ආරක්ෂක සේවය | 1,587,000.00 | 28,504,546.00 | 6,016,362.00 | 1,251,000.00 | 7,456,200.00 |
| 04. | පිරිසිදු කිරීමේ සේවය | 2,272,550.00 | 19,708,612.00 | 8,768,557.00 | 1,607,823.00 | 1,298,103.00 |
| 05. | වියළි ඖෂධ | - | 26,151,294.00 | 3,247,350.00 | - | - |
| 06. | ආහාර | - | 28,674,010.00 | 6,373,064.00 | - | - |
| 07. | ගෑස් | - | 6,075,291.00 | 1,238,371.00 | - | - |
| 08. | රජක සේවය | - | 1,156,730.00 | 267,755.00 | 68,305.00 | - |
| 09. | දර | - | 1,440,843.00 | 123,901.00 | - | - |
| 10. | කාර්යාලීය ලිබඩු පරිගණක හා ආශ්‍රිත උපකරණ මිලට ගැනීම | 983,421.38 | 3,681,684.00 | 833,632.67 | 407,802.41 | 142,325.18 |
| | | 782,402.84 | 1,166,957.37 | 380,257.92 | 269,568.75 | 100,384.68 |
| 11. | වායු සමීකරණ ඉලෙක්ට්‍රොනික් උපකරණ මිලට ගැනීම | 220,225.00 | 228,160.00 | 215,280.00 | - | - |
| | | 200,225.00 | 228,160.00 | 215,280.00 | - | - |
| 12. | සේවා ගිවිසුම | 869,278.37 | 2,577,448.08 | 876,397.85 | 342,183.53 | 31,560.00 |

**වැටුප් අංශය**

2018 වර්ෂය සඳහා පුද්ගල පඩි නඩි වෙනුවෙන් දරණ ලද මුළු පිරිවැය (අතිකාල සමඟ) රු. 1,168,801,777.00කි.

**විභාග අංශය**

| අනු අංකය | ක්‍රියාකාරකම් | පැවැත්වූ කාල වකවානුව | සහභාගී වූ සංඛ්‍යාව | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| 01. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන කාණ්ඩ MT – 02 යටතේ බඳවා ගන්නා ලද භෛෂජ්‍යජක තනතුරේ II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පැවැත්වීම | 2018 ජනවාරි | 01 | |
| 02. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන කාණ්ඩ MN – 01 යටතේ බඳවා ගන්නා ලද ලිනන් ලිපිකරු, වාට්ටු ලිපිකරු, සම්බාහනකරු, I,II,III ශ්‍රේණි සඳහා කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත පරීක්ෂණය පැවැත්වීම | 2018 පෙබරවාරි | 09 | ප්‍රතිඵල නිකුත් කර ඇත |

| | | | | |
|---|---|---|---|---|
| 03. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන 02 PL 01 ක්ෂේත්‍ර අංක යටතේ බඳවා ගන්නා ලද ආයුර්වේද සේවා සහායක I,II,III ශ්‍රේණි සඳහා කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත පරීක්ෂණය පැවැත්වීම | 2018 අප්‍රේල් | 92 | ප්‍රතිඵල නිකුත් කර ඇත |
| 04. | ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් ලිඛිත පරීක්ෂණ පැවැත්වීම - 017-1 | 2018 ජූලි | 723 | |
| 05. | රජයේ ආයුර්වේද සම්බාහන තනතුරට බඳවා ගැනීමේ සීමිත ලිඛිත පරීක්ෂණය | | 17 | |
| 06. | රජයේ ආයුර්වේද සම්බාහන ඖෂධ සංයෝජක ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව අවසාන ඇගයීම් පරීක්ෂණය (වයඹ පළාත) | | 44 | |
| 07. | ලංකා සිද්ධ ආයුර්වේද අවසාන පරීක්ෂණය පැවැත්වීම | 2018 අගෝස්තු | 29 | |
| 08. | ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල කාර්ය සහායක II වන ශ්‍රේණිය සඳහා කාර්යක්ෂමතා කඩ ඉම් ලිඛිත පරීක්ෂණය පැවැත්වීම | | 11 | |
| 09. | රජයේ ආයුර්වේද උපස්ථායිකා ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව අවසාන ඇගයීම් පරීක්ෂණය ( බස්නාහිර පළාත) | 2018 සැප්තැම්බර් | 40 | |
| 10. | රජයේ ආයුර්වේද ඖෂධ සංයෝජක ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව අවසාන ඇගයීම් පරීක්ෂණය ( ඌව පළාත) | | 14 | |
| 11. | රජයේ ආයුර්වේද ඖෂධ සංයෝජක ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව ( බස්නාහිර පළාත) | 2018 දෙසැම්බර් | 21 | |

**ආයුර්වේද ශික්ෂණ රෝහල්**

**සියළුම ප්‍රතිකාර සේවා**

| අනු අංකය | ප්‍රතිකාර සේවාව | බොරැල්ල | යක්කල | කයිතඩි | මන්චන්තොඩුවායි | ත්‍රිකුණාමලය |
|---|---|---|---|---|---|---|
| 01. | බාහිර | 219,961 | 47,462 | 36,564 | 18,013 | 16,449 |
| 02. | සායන | 264,781 | 37,713 | 15,800 | - | 6,726 |
| 03. | නේවාසික | 2,352 | 899 | 1,235 | 221 | 51 |
| 04. | පංචකර්ම සායනය | - | 4,111 | 149 | - | - |
| | එකතුව | **487,094** | **90,185** | **53,748** | **18,234** | **23,226** |

### නේවාසික රෝගී ප්‍රතිකාර සේවා

| අනු අංකය | ප්‍රතිකාර සේවාව | බොරැල්ල | යක්කල | කයිතඩි | මන්වන්තොඩුවායි | ත්‍රිකුණාමලය |
|---|---|---|---|---|---|---|
| 01. | කැඩුම් බිඳුම් | 63 | 212 | 18 | - | - |
| 02. | සන්ධි සායන | 707 | 264 | 550 | 166 | 42 |
| 03. | අංශභාග | 592 | 144 | 260 | 22 | 09 |
| 04. | ළමා රෝග | 179 | - | 03 | 05 | - |
| 05. | ස්ත්‍රී රෝග | 234 | 27 | 02 | - | - |
| 06. | ගුද මාර්ගය ආශ්‍රිත රෝග | 65 | - | - | - | - |
| 07. | චර්ම රෝග | - | - | 57 | - | - |
| 08. | වෙනත් | 512 | 252 | 17 | 28 | - |
| 09. | වාතරෝග | - | - | 316 | - | - |
| 10. | සර්වාංග රෝග | - | - | 12 | - | - |
| | එකතුව | **2,352** | **899** | **1,235** | **221** | **51** |

### සාමාන්‍ය සායන

| අනු අංකය | සායන | බොරැල්ල | යක්කල | කයිතඩි | | | | ත්‍රිකුණාමලය |
|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන | ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන | ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන | | සුවවීමේ ප්‍රතිශතය (%) | | ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන |
| | | | | ගැහැණු | පිරිමි | ගැහැණු | පිරිමි | |
| 1. | පොදු සායන | 49,254 | - | - | - | - | - | 1,490 |
| 2. | ශාලාක්‍ය (ඇස්, උගුර, කන, නාසය) | 10,926 | 4,646 | 1 | 1 | 60 | 65 | 321 |
| 3. | ශල්‍ය | 22,132 | 10,131 | 135 | 116 | 70 | 65 | - |
| 4. | යුනානි වෛද්‍ය | 17,474 | - | - | - | - | - | - |
| 5. | දන්ත රෝග | 1,154 | - | - | - | - | - | - |
| 6. | සන්ධි රෝග | 12,111 | - | - | - | - | - | 1,456 |
| 7. | කායික රෝග | 8,375 | | - | - | - | - | 313 |
| 8. | ළමා රෝග | 5,468 | 502 | 61 | 47 | 70 | 75 | 583 |
| 9. | සිද්ධ වෛද්‍ය | 3,117 | - | - | - | - | - | 1,220 |
| 10. | ස්ත්‍රී රෝග | 6,190 | - | - | - | - | - | 187 |
| 11. | චර්ම රෝග | 4,859 | 1,466 | - | - | - | - | 344 |
| 12. | නිදන්ගත රෝග/බෝ නොවන රෝග | 3,020 | 1,330 | - | - | - | - | 463 |
| 13. | ජ්‍යෙෂ්ඨ පුරවැසි සායන | 1,725 | 598 | 444 | 314 | 75 | 70 | 349 |
| 14. | විශේෂ සායන | 7,227 | - | 278 | 157 | 85 | 85 | - |
| 15 | නාරිවේදී සායන | - | 2,249 | 192 | 18 | 75 | 50 | - |
| .16. | ජංගම සායන | - | 2,397 | - | - | - | - | - |
| 17. | කොරියන් කටු | - | 1,269 | - | - | - | - | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | චිකිත්සාව | | | | | | | |
| 18. | වකුගඩු සායන | - | - | 2 | 12 | 25 | 25 | - |
| 19. | මානසික රෝග | 1,677 | 721 | - | - | - | - | - |
| 20. | කැඩුම් බිඳුම් | 21,074 | 8,095 | - | - | - | - | - |
| 21. | පංච කර්ම | 10,117 | - | - | - | - | - | - |
| 22. | මධුමේහ සායන | 2,213 | 99 | 89 | 83 | 70 | 75 | - |
| 23. | කටු චිකිත්සාව | 32,373 | - | 86 | 82 | 75 | 80 | - |
| 24. | යෝග සායනය | 18,248 | 32 | - | - | - | - | - |
| 25. | රුවනාරී සායනය | 2,073 | 1,149 | - | - | - | - | - |
| 26. | අතිස්ථෞල්‍ය සායන | 8,798 | - | - | - | - | - | - |
| 27. | පාරම්පරික සායන | - | 1,693 | - | - | - | - | - |
| 28. | වාත රෝග | - | 1236 | - | - | - | - | - |
| 29. | අම්ලපිත්ත රෝග | - | 100 | - | - | - | - | - |
| 30. | වෛද්‍ය සායන | - | - | 220 | 133 | 75 | 75 | - |
| 31. | හදිසි ප්‍රතිකාර | 2,705 | - | - | - | - | - | - |

**විශේෂිත සායන (පාරම්පරික වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන සායන)**

| අනු අංකය | සායන | බොරැල්ල | යක්කල |
|---|---|---|---|
| 01. | අක්ෂි | 679 | 650 |
| 02. | කැඩුම් බිඳුම් | 2,483 | 59 |
| 03. | ගෙඩි වණ | 443 | - |
| 04. | සර්ප විෂ | 660 | - |
| 05. | මානසික රෝග | 119 | - |
| 06. | දැවුම් පිළිස්සුම් | 142 | 25 |
| 07. | විකලාංග | - | 1,330 |
| 08. | ලිංගික රෝග | - | 20 |
| 09. | අංශභාග | - | 1,199 |

**ප්‍රජා සෞඛ්‍ය සත්කාර සේවා**

| අනු අංකය | ජංගම සායන | 2018 වර්ෂය (රෝගී පැමිණීම) | | | |
|---|---|---|---|---|---|
| | | බොරැල්ල | යක්කල | කයිතඩි | මන්තොඩුවායි |
| 01. | පාර්ලිමේන්තු සායන | 2,773 | - | - | - |
| 02. | පොලිස් ස්ථානවල පවත්වන ලද සායන | 1,1183 | - | - | - |
| 03. | විහාරස්ථානවල පවත්වන ලද සායන | - | 1,116 | - | - |
| 04. | පොදු සායන | 2,853 | - | - | 190 |
| 05. | විශ්ව විද්‍යාල | 955 | - | 964 | - |
| 06. | අනෙකුත් ස්ථානවලදී පවත්වන ලද සායන | 784 | 1,055 | 2,072 | - |
| 07. | පාසල්වල පවත්වන ලද සායන | - | 228 | - | - |

**සේවා හා වෙනත් පහසුකම් සැපයීම්**

- **ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල**

දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රදර්ශන 02ක් සඳහා සහභාගීත්වය ලබා දී ඇති අතර වෛද්‍ය, ශිෂ්‍යයින් 3,966 දෙනෙකු සඳහා අධ්‍යයන පහසුකම් ලබා දී ඇත.

- **ආයුර්වේද ශික්ෂණ රෝහල - කයිතඩි**

යාපනය විශ්ව විද්‍යාලයේ සිද්ධ අංශය සිසුන් 05 දෙනෙකු සඳහා මාස 03 පුහුණුව ලබාදීම, අභ්‍යන්තර වෛද්‍ය නිලධාරීන් 09 දෙනෙකු, පාරම්පරික වෛද්‍යවරු වෙත වාර්තා කිරීම, කයිතඩි රෝහල විසින් සම්පාදිත වෛද්‍ය ශිෂ්‍යයින් සඳහා පවත්වනු ලබන වැඩසටහන් වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායම් 05ක් වෙත ලබා දීම.

- **ආයුර්වේද ශික්ෂණ රෝහල - මන්වන්තුඩුවායි**

පාසල්, පූජනීය ස්ථාන, රජයේ ආයතන 07ක් සඳහා ඩෙංගු මර්දනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

- **සිද්ධ ශික්ෂණ රෝහල - ත්‍රිකුණාමලය**

දැනුවත් කිරීමේ වැඩසටහන් 01ක් සහ පාසල් සඳහා ව්‍යාපෘති උපදෙස් ලබා දීමක් සිදු කර ඇති අතර, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍යයින් සඳහා සඳුදා සිට සිකුරාදා දින දක්වා අධ්‍යයන පහසුකම් සැපයීම සිදු කර ඇති අතර, රසායනික නොවන ආහාර සහ බෝ නොවන රෝගයන් හඳුන්වාදීමේ වැඩසටහන් කරන ලදී.

- **ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල**

ප්‍රදර්ශන 4ක් සඳහා සහ වෛද්‍ය ශිෂ්‍යයින්, කථිකාචාර්යවරුන් 683ක් සඳහා ශික්ෂණ පහසුකම් ලබා දීම සිදු කර ඇත.

**ඖෂධ නිෂ්පාදනය හා භාවිතය**

| අනු අංකය | ඖෂධ වර්ගය (බෝතල්/කි.ග්‍රෑම්) | බොරැල්ල | | යක්කල | කයිතඩි | | මන්වන්තුඩුවායි | ත්‍රිකුණාමලය |
|---|---|---|---|---|---|---|---|---|
| | | නිෂ්පාදනය | භාවිතය | භාවිතය | නිෂ්පාදනය | භාවිතය | භාවිතය | භාවිතය |
| | බෝතල් | | | | | | | |
| 01. | අරිෂ්ඨ | 4,010 | 2,968 | - | - | 2,842 | 681 | 636 |
| 02. | ආසව | 3,055 | 2,659 | 359 | - | 2,962 | 601 | 372 |
| 03. | තෛල | 13,984 | 10,820 | 1,238.5 | 2,059.25 | 6,287.5 | 1,453 | 822 |
| 04. | සිරප් | 939 | 931 | - | 138 | 479 | 215509 | 33 |
| 05. | ක්වාථ | 68,200 | 68,200 | 13,200 | - | 719 | - | 487 |
| 06. | පාන | - | - | - | | | - | 61 |
| 07. | කෂාය | 61,829 | 61,829 | 618 | 36,935 (මිලි ලී. 120 බෝතල් | | - | - |
| 08. | වෙනත් | 90 | 90 | - | 6.25 | - | - | - |
| 09. | අනුපාන (මිලි ලීටර 60) | - | - | - | 11,837 | 11,837 | - | - |
| | කිලෝ ග්‍රෑම් | | | | | | | |
| 10. | ගුලි | 467.900 | 720.536 | - | 18.785 | 172.42 | 76 | 41.5 |
| 11. | කල්ක | 1,681.165 | 13,788.765 | - | - | 173 | 61.7 | 20.3 |
| 12. | ලේප | 1,931.520 | 1,528.070 | - | 91.45 | 182.93 | 60.75 | 24.5 |
| 13. | චූර්ණ | 4,620.410 | 4,262.670 | - | 356.655 | 1,287.725 | 199.5 | 139 |
| 14. | ක්ෂාර | 739 | 739 | - | - | - | - | - |
| 15. | පාණ්ඩ | 106.500 | 106.500 | - | - | - | - | - |
| 16. | පත්තු | 2,415.575 | 2,415.575 | - | 12,409(ග්‍රෑම් 60පැකට් | | - | 05 |
| 17. | ලේහ | - | - | - | - | - | 34.4 | - |
| 18. | වෙනත් | 126.965 | 63.528 | | 3.525 | 67.27 | - | - |
| 19. | වෙනත්(පැකට්) | - | - | - | 30 | 23 | - | - |

**වෛද්‍ය රසායනාගාරයේ සාම්පල පරීක්ෂාව**

| අනු අංකය | පරීක්ෂණය | පරීක්ෂා කළ ප්‍රමාණය | | |
|---|---|---|---|---|
| | | බොරැල්ල | යක්කල | ත්‍රිකුණාමලය |
| 01. | රුධිර සාම්පල | 4,197 | 331 | 60 |
| 02. | මුත්‍රා සාම්පල | | 128 | - |
| 03. | මේදහර පරීක්ෂාව(Cholesterol) | | - | - |
| 04. | X-Ray | 2,949 | - | - |
| 05. | ECG | - | 38 | - |

### ආයුර්වේද පර්යේෂණ රෝහල්

| අනු අංකය | ප්‍රතිකාර සේවාව | නාවින්න | හම්බන්තොට | අම්පාර | මැදවච්චිය | නින්දවූර්(බාහිර රෝගී අංශය) |
|---|---|---|---|---|---|---|
| 01. | බාහිර | 53,359 | 29,748 | 34,224 | 8,990 | 14,188 |
| 02. | සායන | 34,803 | - | 1,681 | 409 | 1,176 |
| 03. | නේවාසික | 541 | 538 | 341 | 126 | 885 |
| 04. | පංචකර්ම | 2,530 | - | - | - | - |
| | එකතුව | **91,233** | **30,286** | **36,246** | **9,525** | **16,249** |

### නේවාසික රෝගී ප්‍රතිකාර සේවා

| අනු අංකය | ප්‍රතිකාර සේවාව | නාවින්න | හම්බන්තොට | අම්පාර | මැදවච්චිය | නින්දවූර් |
|---|---|---|---|---|---|---|
| 01. | කැඩුම් බිඳුම් | 14 | 44 | 4 | 94 | 98 |
| 02. | සන්ධි සායන | 307 | 364 | 103 | - | 443 |
| 03. | අංශ භාග | 115 | 31 | 58 | - | 177 |
| 04. | ළමා රෝග | 71 | 24 | - | - | - |
| 05. | ස්ත්‍රී රෝග | 34 | - | - | - | 32 |
| 06. | වකුගඩු රෝග | - | - | - | 16 | - |
| 07. | මධුමේහ | - | - | - | 1 | - |
| 08. | අධික රුධිර පීඩනය | - | - | - | 15 | - |
| 09. | වෙනත් රෝග | - | 29 | - | | 130 |
| 10. | චර්ම රෝග | - | - | 19 | - | - |
| 11. | ආමවාත | - | - | 6 | - | - |
| 12. | ශීර්ෂ රෝග | - | - | 4 | - | - |
| 13. | මානසික රෝග | - | - | 1 | - | - |
| 14. | ගුද රෝග | - | - | 2 | - | - |
| 15. | වාත රෝග | - | - | 137 | - | - |
| 16. | කුෂ්ඨ | - | - | 1 | - | - |
| 17. | අම්ල පිත්ත | - | - | 1 | - | - |
| 18. | තුවාල | - | - | 3 | - | - |
| 19. | ශිරා ග්‍රන්ථි | - | - | 2 | - | - |

**සාමාන්‍ය සායන - ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන**

| අනු අංකය | සායන | නාවින්න | හම්බන්තොට | අම්පාර | නින්දවූර් |
|---|---|---|---|---|---|
| 01. | පොදු සායන | - | 27,948 | 1,681 | 1,007 |
| 02. | ශාලාක්‍ය (ඇස්,උගුර,කන,නාසය) | 1,414 | - | 2,855 | - |
| 03. | ශල්‍ය | 949 | - | 2,782 | - |
| 04. | සන්ධි රෝග | 2,865 | - | 9,837 | - |
| 05. | කායික රෝග | - | - | 6,509 | - |
| 06. | ළමාරෝග | 385 | - | 1,650 | - |
| 07. | ස්ත්‍රී රෝග | 1,007 | - | 2,160 | - |
| 08. | චර්ම රෝග | 1,643 | - | 1,724 | - |
| 09. | දේශීය චිකිත්සාව | - | - | 3,394 | - |
| 10. | නිදන්ගත රෝග/බෝ නොවන රෝග | - | - | 2,505 | - |
| 11. | විශේෂ සායන/ගැබිණි මව්වරුන් සඳහා | - | - | - | 262 |
| 12. | අක්ෂි රෝග | 1,157 | - | - | - |
| 13. | ශ්විතර සායනය | 1,362 | - | - | - |
| 14. | ශිරා ග්‍රන්ථි සායනය | 1,027 | - | - | - |
| 15. | වකුගඩු සායනය | 401 | - | - | - |
| 16. | වැඩිහිටි සායනය | 605 | - | - | - |
| 17. | ශල්‍ය ගුද රෝග | 565 | - | - | - |
| 18. | පංචකර්ම සායනය | 1,068 | - | - | - |
| 19. | මධුමේහ සායනය | 721 | - | - | - |
| 20. | කැඩුම් බිඳුම් සායන | 2,566 | - | - | - |
| 21. | මේදස් වෘද්ධි සායනය | 388 | - | - | - |
| 22. | අකාල පලිත සායනය | 257 | - | - | - |
| 23. | වාත රෝග සායනය | 373 | - | - | - |
| 24. | හෘද රෝග සායනය | 339 | - | - | - |
| 25. | පිළිකා සායනය | 292 | - | - | - |
| 26. | දන්ත රෝග | - | - | 808 | - |
| 27. | වෙනත් සායන (ජංගම සායන,පාසල් සායන) | - | - | - | 2,099 |

**විශේෂිත සායන (පාරම්පරික වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන සායන)**

| අනු අංකය | සායනය | නාවින්න | අම්පාර | හම්බන්තොට |
|---|---|---|---|---|
| 01. | අක්ෂි | 1,156 | - | 1,544 |
| 02. | කැඩුම් බිඳුම | 1,831 | 2,456 | - |
| 03. | ගෙඩි වණ | 271 | - | - |
| 04. | සර්ප විෂ | - | 657 | - |
| 05. | මානසික රෝග | 22 | - | - |
| 06. | දැවුම් පිළිස්සුම් | 04 | 281 | - |

**ප්‍රජා සෞඛ්‍ය සත්කාර සේවා - 2018 ප්‍රතිකාර ලැබූ රෝගීන් ගණන**

| අනු අංකය | ජංගම සායන | නාවින්න | හම්බන්තොට | අම්පාර | මැදවච්චිය | නින්දවූර් |
|---|---|---|---|---|---|---|
| 01. | පොලිස් ස්ථානවල පවත්වන ලද සායන | 124 | 158 | 851 | - | - |
| 02. | විහාරස්ථානවල පවත්වන ලද සායන | - | - | 111 | 173 | - |
| 03. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වන ලද සායන | - | 77 | 136 | - | 170 |
| 04. | පොදු සායන | 359 | - | 563 | 219 | - |
| 05. | මරණාධාර සමිති | - | - | - | 87 | - |
| 06. | පාසල් | - | - | - | - | 173 |
| 07. | MOH | - | - | 290 | - | 262 |

**සේවා හා වෙනත් පහසුකම් සැපයීම්**

**චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල - හම්බන්තොට**

හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා කාර්යාලය විසින් පවත්වනු ලැබූ ප්‍රදර්ශනය සහ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශනය සඳහා සහභාගී වන ලදී.

**ආයුර්වේද පර්යේෂණ රෝහල - අම්පාර**

අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙහෙයවනු ලැබූ මාතෘ වැඩමුළුවකට සහ උහන පැවැත්වූ ප්‍රදර්ශනයට සහභාගී වන ලදී. අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පෝෂණ මන්දිරය සඳහා දැනුවත් කිරීම, විශ්ව විද්‍යාල සිසුන් හට ඖෂධිය ශාක පිළිබඳ තොරතුරු සැපයීම හා ආධුනික වෛද්‍යවරුන් පුහුණු කිරීම් සිදු කරන ලදී.

**බෝ නොවන රෝග ආයුර්වේද පර්යේෂණ රෝහල - නින්දවූර්**

| සායනය | ප්‍රමාණය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|---|
| රෝහල් සායන | 19 | 1,007 |
| ජංගම සායන | 06 | 881 |
| පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන් | 05 | 698 |
| ගැබිණි මව්වරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 02 | 262 |
| සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් | 03 | 740 |
| ජාත්‍යන්තර දියවැඩියා දිනය වෙනුවෙන් පැවැත්වූ වැඩසටහන් | 02 | 520 |
| ආහාර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්(විෂ සහිත) | 02 | 450 |

ඖෂධ නිෂ්පාදනය හා භාවිතය

| අනු අංකය | ඖෂධ වර්ගය (බෝතල්/කි.ග්‍රෑම්) | නාවින්න | | හම්බන්තොට | | අම්පාර | | මැදවච්චිය |
|---|---|---|---|---|---|---|---|---|
| | | නිෂ්පාදනය | භාවිතය | නිෂ්පාදනය | භාවිතය | නිෂ්පාදනය | භාවිතය | නිෂ්පාදනය භාවිතය |
| | බෝතල් | | | | | | | |
| 01. | අරිෂ්ඨ | - | - | - | - | - | - | - 47 |
| 02. | ආසව | 2209 | | - | 1,165 | | | 30 |
| 03. | තෛල | 1033 | | 10.5 | 1,939 | 209 | 174 | 644 |
| 04. | පැණි | | | - | 75 | | 99 | |
| 05. | ක්වාථ | | 27182 | 11.281 | 1,940 | | 411 | 100 |
| 06. | පාන | | | - | - | | | |
| 07. | කෂාය | | 1701.02 | 1,200 | - | | 1223.4 | |
| 08. | අනුපාන | | | 38 | - | | | |
| 09. | වෙනත්(තැම්බූ වතුර) | | 6133.56 | 361 | - | | | |
| 10. | වෙනත් (ද්‍රව) | | 201.5 | | | | | |
| | කිලෝ ග්‍රෑම් | | | | | | | |
| 11. | ගුලි | 88.046 | | - | 66 | | | 141.52 |
| 12. | කල්ක | | | 800 | 81.750 | | | 176.61 |
| 13. | ලේප | | | 5.500 | 40.750 | | 9.59 | 40.15 |
| 14. | චූර්ණ | 2367.37 | | 3.100 | 557.500 | 143.73 | 138.78 | 389.4 |
| 15. | පාණ්ඩ | | | | - | | | |
| 16. | පත්තු | | | 46 | - | | 1.80 | |
| 17. | වෙනත් (ඝන) | 370.105 | | | - | | | |
| 18. | ලේහ | | | | 5.600 | | | |
| 19. | වටී | | | | 64 | | | |
| 20. | රස | | | | 18 | | | |
| 21. | පොට්ටනි | 107.5 | | | 168 | | | |

## 8.1 බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

**නාවින්න පර්යේෂණ රෝහල**

| | | |
|---|---|---|
| ආරම්භය | - | 1962.10.14 |
| වාට්ටු ගණන | - | 04 |
| ඇඳන් | - | 67 |

**පර්යේෂණායතනය**

- රෝගී ප්‍රතිකාර සඳහා බාහිර හා නේවාසික රෝගී අංශය ලෙසද, ප්‍රමිතිකරණ, උද්භිද, ඖෂධ නිෂ්පාදන, සාහිත්‍ය පර්යේෂණ යන අංශයන්ගෙන් සමන්විත වේ.

- පාසල් අධ්‍යාපන සේවා යටතේ වැඩමුළු 02ක්, දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක්, පාසල් සහ විශ්ව විද්‍යාල සඳහා දැනුවත් කිරීම් 04ක් හා පෞද්ගලික ආයතන 02ක පැවැත්වූ සායන 02ක් සඳහා සහභාගී වී ඇත.

**වෛද්‍ය රසායනාගාරයේ සාම්පල පරීක්ෂාව**

| අනු අංකය | පරීක්ෂණය | පරීක්ෂා කළ ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|
| | | නාවින්න | අම්පාර | මැදවච්චිය | නින්දවූර් |
| 01. | රුධිර සාම්පල | 29 | 33 | 379 | 1,021 |
| 02. | මුත්‍රා සාම්පල | 03 | 731 | | - |

**පුස්තකාල පහසුකම් සැපයීම**

| අංකය | ක්‍රියාකාරකම | පහසුකම් සැපයූ ආයතනය | සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ආයුර්වේද වෛද්‍ය<br><br>පශ්චාත් උපාධි වෛද්‍ය | 2017 බණ්ඩාරනායක අණුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය<br><br>ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල | සීමාවාසික වෛද්‍ය නිලධාරීන් 100ක් පමණ |
| 2. | විශ්ව විද්‍යාල ශිෂ්‍ය | ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br>කොළඹ විශ්ව විද්‍යාලය | 08<br>03 |
| 3. | පාසල් සිසුන් | ප්‍රෙස්බිටීරියන් බාලිකා ජාතික පාසල | 03 |
| 4. | වෙනත් (ආයුර්වේද ශාස්ත්‍රීය යනාදිය) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දෙහිඹිවිට | 01 |

## 1. ප්‍රමිතිකරණ අංශය

### ❖ ප්‍රමිතිකරණ සේවා

| සේවා සැපයූ ක්ෂේත්‍රය | සේවාව ලබා දුන් ආයතනය |
|---|---|
| වියලි ඖෂධ මිලදී ගැනීම- 2018 වර්ෂය සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් යොමු කරන ලද සාම්පල සඳහා අදාළ ප්‍රමිති වාර්තා ලබා දීම | තාක්ෂණික ඇගයීම් කමිටුව<br>ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| ගබඩාව හරහා එවන ලද අමු ද්‍රව්‍ය පරීක්ෂාව | ගබඩාව<br>ආයුර්වේද පර්යේෂණායතනය |
| ඖෂධ නිෂ්පාදනාගාරය හරහා එවන ලද නිමි ඖෂධ පරීක්ෂාව | ඖෂධ නිෂ්පාදනාගාරය<br>ආයුර්වේද පර්යේෂණායතනය |
| ශිල්පීය අංශය මඟින් යොමු කරන ලද සාම්පලයක් සඳහා පරීක්ෂණ වාර්තා ලබා දීම (2018.03.19) | ශිල්පීය අංශය<br>ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| ඖෂධ සංස්ථාව මඟින් යොමු කරන ලද පැඟිරි තෙල් සාම්පලයක් සඳහා තත්ත්ව වාර්තා ලබා දීම.<br>එම ආයතනයේම වර්ජින් කොකනට් ඔයිල් සාම්පලයක් සඳහා තත්ත්ව වාර්තාවක් ලබා දීම | ඖෂධ සංස්ථාව නාවින්න |
| දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් එම ආයතනයේ උපාධි අපේක්ෂකයෙකුගේ පර්යේෂණ ඖෂධයක් සහාTLC වාර්තාවක් ලබා දීම | දේශීය වෛද්‍ය විද්‍යායතනය |
| තල තෙල් සාම්පලයක් සඳහා තත්ත්ව වාර්තා ලබා දීම | බස්නාහිර පළාත් සභාව ආයුර්වේද දෙපාර්තමේන්තුව |

### ❖ ව්‍යාප්ති සේවාවන්

| ව්‍යාප්ති සේවාව | කුමක් පිළිබඳවද යන්න | සේවාව ලබා දුන් ආයතනය/ පුද්ගල කණ්ඩායම |
|---|---|---|
| දැනුවත් කිරීම් | විශ්ලේෂණ උපකරණ ක්‍රියාකාරීත්වය හා ඒවායේ භාවිතයන් පිළිබඳව,<br><br>ආයුර්වේද ඖෂධ තත්ත්ව පාලනය හා ප්‍රමිතිකරණයේදී විශ්ලේෂණ උපකරණ වල භාවිතය හා අවශ්‍යතාවය | රුහුණු විශ්ව විද්‍යාලයේ හා ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනෙයේ උපාධි අපේක්ෂක සිසුන් සඳහාත්, පාරම්පරික වෛද්‍යවරුන් සඳහාත්, නින්දවූර් පර්යේෂණ රෝහලේ වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා |
| පුහුණු වැඩසටහන් | ආයුර්වේද ඖෂධ තත්ත්ව පාලනය හා ප්‍රමිතිය, ආයුර්වේද ඖෂධ ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය | වයඹ පළාත් සභා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරීන්ට සහ දකුණු පළාත් සභා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩලය සඳහා |

### ❖ අත්පත්‍රිකා ග්‍රන්ථ සකස් කිරීම

| අත්පත්‍රිකා ග්‍රන්ථ සකස් කිරීම | විෂය ක්ෂේත්‍රය | මාතෘකාව | සහාය වූ අංශය/ආයතනය |
|---|---|---|---|
| සම්පත් දායකත්වය තමරා නවරත්න මිය | ඖෂධීය ශාකයන්හි ශාක රසායන හා ජීව විද්‍යාත්මක තොරතුරු රැස් කිරීම | ඖෂධීය ශාක සංග්‍රහය, BACC ව්‍යාපෘතිය | සංවර්ධන අංශය ආයුර්වේද දෙපාර්තමේන්තුව |

## 2. උද්භිද විද්‍යා අංශය

**පර්යේෂණ ප්‍රගතිය - ආයතනික**

| පර්යේෂණ ක්ෂේත්‍රය | පර්යේෂණ මාතෘකාව | අපේක්ෂිත නිමැවුම | ආරම්භ කළ වර්ෂය | ප්‍රගතිය% | වගකීම/පර්යේෂණ කණ්ඩායම |
|---|---|---|---|---|---|
| ඖෂධීය ශාක හඳුනා ගැනීම | Investigation of morphoanatomical variation recorded in Srilanka<br>මානව උද්භිද විද්‍යා සමීක්ෂණය දොළුකන්ද රක්ෂිතය | Sida විශේෂ 7 නිවැරදිව හඳුනා ගැනීම<br>තර්ජනයට ලක්ව ඇති ඖෂධීය ශාක සංරක්ෂණය | 2018<br>2018 | 35%<br>25% | සියළු පර්යේෂණ සහකාර නිලධාරීන් |
| ඖෂධීය අමුද්‍රව්‍ය හඳුනා ගැනීම සහ තහවුරු කිරීම | දශාංශ හා පිප්ල්‍යාසවය සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය | ප්‍රමිතියෙන් යුතු ඖෂධ නිෂ්පාදනය | 2018 අවසන් භාගය | 25% | |

- ❖ **ව්‍යාප්ති සේවා**

| ව්‍යාප්ති සේවා | සේවාව ලබා දුන් ආයතනය/පුද්ගල කණ්ඩායම හා සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | පාසල් | රජයේ ආයතන | වෙනත් |
| දැනුවත් කිරීම් | 02 | 05 | |
| වැඩමුළු | - | 01 | |
| ප්‍රදර්ශන | 01 | 04 | 01 |

- ආයුර්වේද දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව කෝමාරිකා වගාව සම්බන්ධව අත් පත්‍රිකා මුද්‍රණයට භාරදී ඇත.

**Evaluation of Annual Action Plan – 2018**

Bandaranayaka Memoroyal Ayurvedic Research Institute

| | Completed project | Ongoing project |
|---|---|---|
| Collaborative Research on Prameha Medications | ✓ | |
| Research and Development on medicinal plants | | ✓ |
| Strengthening of drug research and standardization laboratory facilities. | | ✓ |
| Literary Research | | ✓ |
| Development and strengthening of clinical service division | | ✓ |

## 8.2 දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

ආයුර්වේදය හා දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ නිර්මාණාත්මක හා ඵලදායී අධ්‍යයන කේන්ද්‍රස්ථානයක් ලෙස හඳුන්වා දිය හැකි මෙම ආයතනය 1987 වර්ෂයේ ආරම්භ කරන ලදී. ආයුර්වේද සත්කාර සේවය කාර්යක්ෂමව, ගුණාත්මකව හා වඩාත් ඵලදායී ලෙස ජනතාවට සැපයීම උදෙසා සියළුම පාර්ශවයන්ගේ අවබෝධය, කෞෂල්‍ය හා හැසිරීම පුහුණුව මඟින් වර්ධනය කිරීම මෙම ආයතනය මඟින් සිදු වේ. සම්භාෂා හා ගුරුකුල වැඩසටහන් පැවැත්වීමත් ඒ තුළින් එක් රැස් කරන දත්ත හරහා දේශීය වෛද්‍ය ක්‍රම පෝෂණය තිරසාර භාවිතයට සෘජුවම මැදිහත්වීම හා අදාළ පිරිස් සඳහා අවශ්‍ය දැනුම ලබා දීමද ආයතනය මඟින් ඉටු කෙරේ. වෛද්‍යවරයාගේ සිට උපස්ථායකයා දක්වාත්, පාසල් සිසුන් ,රාජ්‍ය නිලධාරීන්, වැඩිහිටියන්, රූපලාවන්‍ය ශිල්පීන් ආදී ඉලක්ක ගත කණ්ඩායම් සඳහාත් මෙම පාඨමාලා පවත්වනු ලබයි.

**දැක්ම**

ආයුර්වේදයේ විශිෂ්ඨත්වය තුළින් නිරෝගීමත් සමාජයක්

**මෙහෙවර**

ආයුර්වේදීය මානව සම්පත් සංවර්ධනයේ විශිෂ්ඨතම ආයතනය බවට පත් වීම



### 2018.01.01 සිට 2018.12.31 දක්වා ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.) | වියදම (රු.) |
|---|---|---|---|---|---|
| 01 | වෛද්‍ය නිලධාරී පුහුණු වැඩසටහන් | 18 | 1396 | 23,266,172.00 | 17,708,775.19 |
| 02 | පාරම්පරික වෛද්‍ය නිලධාරී පුහුණු වැඩසටහන් | 09 | 266 | 811,900.00 | 590,124.00 |
| 03 | හෙද හා වෛද්‍ය සහාය කාර්ය මණ්ඩල හා වෙනත් පුහුණු | 09 | 112 | 120,825.25 | 58,768.25 |
| 04 | ප්‍රජා සෞඛ්‍ය/මාතෘ හා ළමා පෝෂණ පුහුණු වැඩසටහන් | 29 | 5922 | 2,151,230.00 | 1,865,533.00 |
| 05 | කාර්ය මණ්ඩල පුහුණු | 04 | 19 | 212,000.00 | 212,000.00 |
| 06 | විශේෂිත වැඩසටහන් | 01 | ප්‍රජාව | 311,500.00 | 285,880.00 |
| **එකතුව** | | **70** | **7,715** | **26,873,627.25** | **20,721,080.44** |

## 8.3 ආයුර්වේද වෛද්‍ය සභාව

1927 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශයන් අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. පසුව 1935 අංක 46 දරණ ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරණ ස්වදේශීය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ යළි ප්‍රතිස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපිත කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

**දැක්ම**

වෘත්තීය ගුණාත්මකභාවය හා අභිමානය සුරක්ෂිත කරමින් ශ්‍රී ලංකා ආයුර්වේද ක්ෂේත්‍රයේ උත්තරීතර ආයතනය බවට පත්වීම

**මෙහෙවර**

වෘත්තීය ආචාරධර්ම වලට අනුගත වූ උපරිම මහජන සේවාවක් සලසමින් ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය සඳහා අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.

**කාර්ය භාරයන්**

(අ) ආයුර්වේද උගන්වන යම් ආයතනයක් මේ පනතෙහි කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න නිර්දේශ කිරීම.
(ආ) ආයුර්වේද වෛද්‍යවරයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම
(ඇ) ආයුර්වේද ඖෂධ සංයෝජකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම
(ඈ) ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම
(ඉ) එසේ ලියාපදංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම හා,
(ඊ) ආයුර්වේද වෛද්‍යවරයන්ගේ, ආයුර්වේද ඖෂධ සංයෝජකයන්ගේ, ආයුර්වේද සාත්තු සේවකයන්ගේ වෘත්තීය හැසිරීම් විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහාද මේ වගන්තියෙහි (අ) සිට (ඉ) තෙක් ඡේදවල සඳහන් කරුණුවලින් යමක් සඳහාද ව්‍යවස්ථා සම්පාදනය කිරීම

**කාර්ය මණ්ඩල තොරතුරු**

| | | |
|---|---|---|
| සභාපති | - | 01 |
| ආයුර්වේද වෛද්‍ය සභාව | - | 17 |
| ලේඛකාධිකාරී | - | 01 |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | - | 01 |
| කළමනාකරණ සහකාර | - | 10 |
| කම්කරු | - | 02 |

ආයුර්වේද වෛද්‍ය සභාව වෙත 2018 වර්ෂය සඳහා රජයේ ප්‍රතිපාදන වශයෙන් රුපියල් ලක්ෂ හැටක් (6,000,000.00) ලැබී ඇත. 2018 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විවිධ ක්ෂේත්‍ර මඟින්

රු. 6,101,126ක ආදායමක් ලැබුණු අතර වියදම රු. 13,834,434.00කි. ඒ අනුව ආයුර්වේද වෛද්‍ය සභාව වෙත 2018 වර්ෂය සඳහා ලැබුණු මුළු ලැබීම් රු. 12,101,126.00කි.
ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් 2018 වර්ෂය සඳහා ස්ථාවර අනුකමිටු 02ක් ක්‍රියාත්මක කරන ලදී.

1. විභාග පාලක මණ්ඩලය
2. දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව

- විභාග පාලක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය 2018 ජුලි මස 21 හා 22 යන දිනයන්හි පවත්වන ලදී. මෙම පරීක්ෂණය සඳහා කැඳවූ අයදුම්පත් සංඛ්‍යාව 591ක් වූ අතර ලිඛිත පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 414ක් සහභාගී වී ඇත.

- විනය නියෝගවලට අනුගතව පිහිටුවා ඇති සංකීර්ණ වූත්, වගකීම් සහිත වූත් නෛතික විමර්ශන ක්‍රියාවලියක් වන දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව වෙත 2018 වර්ෂයේ 12 දෙනෙකු යොමු කළ අතර ඒ සම්බන්ධ පරීක්ෂණ කටයුතු ඉදිරියේදී පැවැත්වීමට තීරණය කර ඇත.

- ලියාපදිංචි ආයුර්වේද වෛදවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනුකමිටුව - මේ යටතේ 2018 වර්ෂය සඳහා සහතික 11ක් නිකුත් කර ඇත.

**විමර්ශන කටයුතු**

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන පැමිණිලි විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. එම වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා වෘත්තීය විෂමාචාර ආයුර්වේද ආචාරධර්මවලට පටහැනිව ක්‍රියා කිරීම ආදිය විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණයි. සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම් පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශනය සඳහා යොදා ගන්නා ලදී. ඒ අනුව 2018 වර්ෂයේ විමර්ශනය කර ඇති පැමිණිලි සංඛ්‍යාව 13කි.

**විශේෂ වෛද්‍ය මණ්ඩල**

2018 වසරේ පවත්වා ඇති විශේෂ වෛද්‍ය මණ්ඩල ගණන 04කි.

**පනතේ 55 (1) හා 55 (2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම**

පහත සඳහන් මූලික ප්‍රතිපත්ති මත වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය සිදු කරයි.

- ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්, අභිඥාණපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතික පත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදිංචි කිරීම

- ආයුර්වේද වෛද්‍ය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව සුදුසුකම් ලත් පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

- සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමක් සිදු කරන අතර පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් ඔවුන්ගේ ලකුණු ප්‍රමාණය අනුව මාස තුනක, මාස හයක හා වසරක් ආදී වශයෙන් ඇගයුම් කාලයකට යටත් කොට නැවත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

- 2018 වර්ෂය අවසන් වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව 25,431කි. මේ අතරින් 2018 වර්ෂය තුළ පහත සඳහන් අංශ යටතේ ලියාපදිංචි කළ ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව 356කි.

| | | |
|---|---|---|
| සාමාන්‍ය (සර්වාංග) උපාධිධාරීන් | - | 274 |
| සාමාන්‍ය (සර්වාංග) ඩිප්ලෝමාධාරීන් | - | 27 |
| පාරම්පරික සර්වාංග | - | 11 |
| පාරම්පරික විශේෂ | - | 44 |

- 2018 වර්ෂයේ ආයුර්වේද සාත්තු සේවකයින් -හෙද නිලධාරීන් 08ක් ලියාපදිංචි කර ඇත.

**වෘත්තීය සංවර්ධන වැඩසටහන්**

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පැවැත්වූ වෘත්තීය සංවර්ධන වැඩසටහන සඳහා වෛද්‍යවරුන් 220ක් සහභාගී වූහ. නැගෙනහිර, මධ්‍යම, දකුණ, ඌව යන පළාත්වල පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් විසින් පැවැත්වූ වැඩසටහන් සඳහාද, 2018 ආයුර්වේද එක්ස්පෝ අන්තර් ජාතික අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය සඳහාද ආයුර්වේද වෛද්‍ය සභාව සහභාගී වී ඇත.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ වෙනත් කාර්යයන්**

| අයිතමය | 2018 |
|---|---|
| මියගොස් ඇති බව දන්වා ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | 107 |
| වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව | 738 |
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 490 |
| වාහන නිල ලාංඡන නිකුත් කිරීම | 126 |
| නවක ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා මූලික වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 67 |
| නිකුත් කළ වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව | 1,398 |

## 8.4 ඔසු උයන්

**දැක්ම**

ඖෂධීය ශාක හා අමුද්‍රව්‍ය හඳුනා ගැනීම, නිෂ්පාදනය තිරසාර භාවිතය පිළිබඳව දැනුවත් පරපුරක් බිහි කිරීම.

**මෙහෙවර**

භෞතික සම්පත් ප්‍රශස්ත මට්ටමින් යොදා ගැනීම හා මානව සම්පත්හි කුසලතා හා ආකල්ප වර්ධනය කර සංවර්ධන අවශ්‍යතා සපුරාලීම.

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය මහජනතාව තුළ ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනය වූ ආයුර්වේද දෙපාර්තමේන්තුව දිවයිනේ විවිධ ප්‍රදේශවල විවිධ පාරිසරික කලාප නියෝජනය වන පරිදි

ඔසු උයන් පිහිටුවීම 1964 වසරේ සිට ආරම්භ කරන ලද්දේ පහත සඳහන් අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා වේ.

- ඖෂධීය ශාක විශේෂ රාශියක් එක් ස්ථානයක වගා කිරීම තුළින් සජීවී ශාකාගාරයක් ලෙස පවත්වා ගෙන යාම.
- දුර්ලභ හා ආවේණික ඖෂධීය ශාක සංරක්ෂණය කිරීම.
- ඔසු පැළ තවාන් මඟින් ඔසු පැළ ව්‍යාප්ත කිරීම සහ පර්යේෂණ සිදු කිරීම මඟින් ඖෂධීය ශාක වගා තාක්ෂණ ක්‍රමවේද හඳුන්වා දීම.

**ඉටු කරනු ලබන වෙනත් කාර්යයන්**

- පාසල්, විහාරස්ථාන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන තුළ ඔසු උයන් පිහිටු වීම සඳහා අවශ්‍ය ඖෂධ ශාක හා තාක්ෂණ උපදෙස් ලබා දීම.
- ඖෂධීය ශාක හා ප්‍රකාශන අලෙවි කිරීම.
- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශව විසින් කරනු ලබන ඉල්ලීම් පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

මේ අනුව දැනට පිහිටුවා ඇති ඔසු උයන් ගණන 7කි

| අනු අංක | ජාතික පර්යේෂණ ඔසු උයන | පිහිට වු වර්ෂය |
|---|---|---|
| 1. | ජාතික පර්යේෂණ ඔසු උයන -නාවින්න | 1964 |
| 2. | පර්යේෂණ හා ව්‍යාප්ති සේවා පිළිබඳ ජාතික ඔසු උයන -හල්දුම්මුල්ල | 1984 |
| 3. | පර්යේෂණ හා ව්‍යාප්ති සේවා පිළිබඳ ඔසු උයන -පට්ටිපොළ | 1985 |
| 4. | පර්යේෂණ හා ව්‍යාප්ති සේවා පිළිබඳ ඔසු උයන -ගිරාඳුරුකෝට්ටේ | 1988 |
| 5. | පර්යේෂණ හා ව්‍යාප්ති සේවා පිළිබඳ ඔසු උයන -පල්ලෙකැලේ | 1990 |
| 6. | පර්යේෂණ හා ව්‍යාප්ති සේවා පිළිබඳ ඔසු උයන -පින්නදූව | 2001 |
| 7. | පර්යේෂණ හා ව්‍යාප්ති සේවා පිළිබඳ ඔසු උයන -කන්නෙලිය | 2001 |

**සංරක්ෂණ කාර්යයන්**

| | | හල්දුම්මුල්ල | පට්ටිපොළ | ගිරාඳුරුකෝට්ටෙ | නාවින්න | පල්ලෙකැලේ | පින්නදූව | කන්නෙලිය |
|---|---|---|---|---|---|---|---|---|
| **A** | **භූමිය සංරක්ෂණය** | | | | | | | |
| I. | ජීව වැටි | 300 (අඩි) | 05 (අක්කර) | 01 (අක්කර) | - | 30(අඩි) | 200 (මීටර) | මීටර 100 |
| II. | භූමි ආවරණ වගා | ½ (අක්කර) 300 (අඩි) | 29 (අක්කර) | 25 | - | 1000 (වර්ග අඩි) | 800 (මීටර) | |
| III. | ගල්වැටි හා කාණු කැපීම | 6,475 (ඝණඅඩි) | 30 (අක්කර) | - | - | අඩි 100 | 300 (මීටර) | |
| **B** | **ශාක සංරක්ෂණය** | | | | | | | |
| I. | දුර්ලභ | 19 | - | 05 | 05 | 07 | 07 | 02 |
| II. | ආවේණික | 19 | - | - | 02 | 10 | 06 | 04 |
| III. | වඳ වී යන ශාක | 13 | - | 08 | 05 | 10 | 06 | - |
| IV | සුලබ ශාක | 125 | - | 08 | 15 | 300 | 48 | 10 |

**ඖෂධීය අමුද්‍රව්‍ය නිෂ්පාදනය**

| අනු අංකය | ශාක විශේෂය | ස්වභාවය | | ලබාදිය හැකි කාලය |
|---|---|---|---|---|
| | | අමු (කි.ග්‍රෑම්.) | වියළි (කි.ග්‍රෑම්.) | |
| | **හල්දුම්මුල්ල** | | | |
| 1. | ආඩතෝඩා | 200 | - | වසර පුරා |
| 2. | ලොත්සුඹුල් | 200 | - | |
| 3. | මලිත | - | 50 | ජූලි, අගෝස්තු, සැප්තැම්බර් |
| 4. | නික | - | 10.15 | වසර පුරා |
| 5. | හිං අරත්ත | - | 100 | |
| | **පටිපොළ ඖසු උයන** | | | |
| 1. | ලොත් සුඹුල් | - | 250 | - |
| 2. | දාරුහරිද්‍රා | 500 | - | -- |
| 3. | අංකෙන්ද | 100 | - | - |
| 4. | අරත්ත | 250 | - | - |
| 5. | කෝමාරිකා | 100 | - | - |
| 6. | සැවැන්දරා | 20 | - | - |
| | **ගිරාඳුරුකෝට්ටේ ඖසු උයන** | | | |
| 1. | නික | - | 1000 | 2019 මාර්තු |
| 2. | ආඩතෝඩ | 500 | | |
| 3. | නෙල්ලි (ගෙඩි) | - | 25 | 2019 මැයි |
| 4. | කුඹුක් | 100 | - | 2019 මාර්තු |
| 5. | මාදං | 100 | - | |
| 6. | සැවැන්දරා | - | 02 | 2019 මැයි |
| 7. | කිරාත (සහමුල්) | - | 10 | |
| 8. | සමන්පිච්ච | 05 | - | |
| 9. | මහමිදි | 10 | - | |
| 10. | කෝමාරිකා (පත්‍ර) | 15 | - | 2019 අප්‍රේල් |
| 11. | කටුකරඬු | 05 | - | |
| 12. | මහ මිදි | 08 | | |
| 13. | කෝමාරිකා | 15 | - | මැයි |
| 13. | දෙළුම් | 02 | - | 2019 පෙබරවාරි |
| 14. | රත්නිටොල් | 02 | - | |
| 15. | හීං අරත්ත | 20 | - | |

පල්ලෙකැලේ ඖසු උයනේ ආඩතෝඩා කිලෝ 50ක්ද, කප්පරවල්ලිය කිලෝ 20ක්ද 2019 අප්‍රේල් - සැප්තැම්බර් කාලය තුළ ලබා ගැනීමට නියමිතය.

**ඔසු පැළ නිෂ්පාදනය හා අලෙවි කාර්යයන්**

| අනු අංකය | ඔසු උයන | නිෂ්පාදනය කළ පැළ සංඛ්‍යාව | පැළ අලෙවි ආදායම | |
|---|---|---|---|---|
| | | | පැළ ප්‍රමාණය | වටිනාකම (රු.) |
| 1. | පින්නදූව | 16,379 | 7,488 | 373,895.00 |
| 2. | පට්ටිපොළ | 3,661 | 1,219 | 52,260.00 |
| 3. | පල්ලෙකැලේ | 18,929 | 15,486 | 49,0070.00 |
| 4. | හල්දුම්මුල්ල | 28,388 | 11,834 | 459,200.00 |
| 5. | නාවින්න | 5,533 | 7,899 | 353,830.00 |
| 6. | ගිරාඳුරුකෝට්ටේ | 31,174 | 614 | 86,840.00 |
| | එකතුව | **104,064** | **44,540** | **1,816,095.00** |

**ඔසු උයන් මඟින් ලබා දෙන සේවාවන්**

**ප්‍රකාශන හා පොත්පත්**

| අනු අංකය | ඔසු උයන | ප්‍රමාණය | ආදායම |
|---|---|---|---|
| 1. | පින්නදූව | 110 | 1100.00 |
| 2. | පල්ලෙකැලේ | 23 | 230.00 |
| 3. | හල්දුම්මුල්ල | 80 | 800.00 |
| 4. | නාවින්න | 31 | 310.00 |
| එකතුව | | **244** | **2440.00** |

**විවිධ ආදායම්**

| අනු අංකය | ඔසු උයන | වටිනාකම (රු.) |
|---|---|---|
| 1. | කුලියට දීම - සංචාරක බංගලා/ නේවාසිකාගාර/දේශන ශාලා/නිවාඩු නිකේතන | |
| | හල්දුම්මුල්ල | 537,000.00 |
| | පට්ටිපොළ | 334,500.00 |
| | ගිරාඳුරුකෝට්ටේ | 70,800.00 |
| | කතරගම | 155,800.00 |
| 2. | **වෙනත්** | |
| | **පට්ටිපොළ ඔසු උයන** | |
| | සංචාරක නිවාසයේ ඇඳ ඇතිරිලි ලබාදීම වෙනුවෙන් ලත් මුදල් | 17,670.00 |

**සමාජ සත්කාර කාර්යයන්**

- ඔසු උයන් 07 මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් 190ක්ද, වැඩමුළු 09ක්ද, ප්‍රදර්ශන 10ක්ද , තාක්ෂණික වගා උපදෙස් වැඩසටහන් 812ක්ද පවත්වා ඇත.
- පට්ටිපොළ ඔසු උයනේ අතුරු නිෂ්පාදන ලෙස මල් අලෙවියෙන් රු. 11,795.00ක ආදායමක් ලබා ඇත.

**නොමිලේ පැළ/ අමුද්‍රව්‍ය නිකුත් කිරීම්**

| අනු අංකය | ඔසු උයන | නොමිලේ පැළ නිකුත් කිරීම් | | ඔසු උයන් අතර පැළ හුවමාරුව | |
|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය | වටිනාකම (රු.) | ප්‍රමාණය | වටිනාකම (රු.) |
| 1 | පින්නදූව | 36,623 | 109,930.00 | - | - |
| 2 | පට්ටිපොළ | 2,031 | 68,800.00 | 1,381 | 44,930.00 |
| 3 | පල්ලෙකැලේ | 7,631 | 235,110.00 | - | - |
| 4 | ගිරාදුරුකෝට්ටේ | 6,079 | 195,450.00 | - | - |
| 5 | නාවින්න | 6,258 | 202,970.00 | - | - |
| 6 | හල්දුම්මුල්ල | 8,047 | 243,310.00 | - | - |
| | එකතුව | **66,669** | **1,055,570.00** | **1,381** | **44,930.00** |

**විශේෂ ව්‍යාපෘති (ගොවි සහභාගිත්ව වැඩසටහන/ ඔසු ගොවි වැඩසටහන) සඳහා නිකුත් කළ පැළ වර්ගයන්**

| අනු අංකය | ඖෂධ වර්ගය | හල්දුම්මුල්ල | පට්ටිපොළ | පින්නදූව |
|---|---|---|---|---|
| 1. | අමුක්කරා | 325 | - | 1400 |
| 2. | තිරස්තවාලු | බීජ 200 | - | 565 |
| 3. | කපුකිණිස්ස | බීජ 600 | - | 340 |
| 4. | හීංඅරත්ත | 1000 | - | - |
| 5. | වදකහ | - | 950 | - |

**විශේෂ ව්‍යාපෘති (ගොවි සහභාගිත්ව වැඩසටහන) සඳහා නිකුත් කළ පැළ ප්‍රමාණයන්**

| ව්‍යාපෘතියේ නම | පැළ ප්‍රමාණය | වටිනාකම (රු.) |
|---|---|---|
| **පින්නදූව ඔසු උයන** | | |
| ගොවි සහභාගිත්ව ඔසු වගා ව්‍යාපෘතිය | 1400 | 43,000.00 |
| ඔසු ගොවි වැඩසටහන -මතුගම | 565 | 18,950.00 |
| ඔසු ගොවි වැඩසටහන | 340 | 11,400.00 |
| **නාවින්න ඔසු උයන** | | |
| BACC ව්‍යාපෘති | 107 | 11,050.00 |
| ඔසු ගොවි වැඩසටහන | 86 | 3,560.00 |
| **පල්ලේකැලේ ඔසු උයන** | | |
| BACC ව්‍යාපෘති | 1,085 | 33,150.00 |

**පර්යේෂණ - අභ්‍යන්තර**

| | පර්යේෂණ මාතෘකාව | සමායෝජක නිලධාරි | අදාළ විස්තර |
|---|---|---|---|
| **පින්නදූව ඔසු උයන** | | | |
| 1. | නේත්‍රාපළම් කෙසෙල් බාහිර පරිසරයට හුරු කිරීම | සී.එස්. හෙට්ටිආරච්චි | සාර්ථකව සිදු කර ඇත. |
| 2. | දැත්ත බීජ ජීවානුහරණය | | සාර්ථකව සිදු කර ඇත |
| 3. | අල බෙහෙත් බාහිර පරිසරයට හුරු කිරීම | | |
| 4. | රත් හඳුන් අග්‍රස්ථ අංකුර ජීවානුහරණය | | |
| 5. | කුංකුම ජීවානුහරණය | | පර්යේෂණ මටට්මේ ඇත. |
| 6. | මස්බැද්ද කඳන් කැබලි ජීවානුහරණය | | |
| 7. | අල බෙහෙත් ගුණනය | | සාර්ථකව සිදු කර ඇත |
| 8. | කෝමාරිකා බාහිර පරිසරයට හුරු කිරීම | | සාර්ථකව සිදු කර ඇත |
| 9. | රත් මිල්ල ජීවානුහරණය | | පර්යේෂණ මටට්මේ ඇත |
| 10. | රුක් අගුණ අංකුර ජීවානුහරණය | | |

## 8.5 අනුරාධපුර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය

දේශීය වෛද්‍ය අංශයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 පුරා ක්‍රියාත්මක වන්නා වූ රෝග නිවාරණ වැඩසටහනකි. 2001 වර්ෂයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රිකකයේ මෙය ආරම්භ කරන ලද අතර දැනට ස්ථිර සේවාවක් බවට පත්ව ඇත. මෙහි අරමුණ වනුයේ ආයුර්වේද ජීවන දර්ශනය තුළින් කායික, මානසික, සමාජයීය,ආධ්‍යාත්මික හා ආර්ථික වශයෙන් සමෘද්ධිමත් ප්‍රජාවක් සිරිලක තුළ බිහි කිරීමයි.

**කාර්ය මණ්ඩල තොරතුරු**

| | |
|---|---|
| අධ්‍යක්ෂ | 01 |
| ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් | 24 |
| සංවර්ධන සහකාර(කෘෂි) නිලධාරීන් අනුයුක්ත | 03 |
| ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරීන් | 204 |
| කළමනාකරණ සහකාර | 01 |
| රියදුරු | 01 |
| ආයුර්වේද සේවා සහයක (අනුයුක්ත) | 02 |



**බෝ නොවන රෝග පාලන වැඩසටහන**



**පෝෂණ වැඩසටහන්**

මෙම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතර, පහත වැඩසටහන් ප්‍රමුඛතාවයෙහිලා සැලකේ.

අනුරාධපුර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | වැඩසටහන් විස්තරය | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 1. | බෝ නොවන රෝග පාලනය | 1.ජංගම වෛද්‍ය සායන | 318 | |
| | | ප්‍රතිකාර කළ රෝගීන් සංඛ්‍යාව | 6,391 | |
| | | යොමු කළ රෝගීන් සංඛ්‍යාව | 307 | |
| | | 2. රෝගීන් හඳුනාගැනීමේ මූලික පරීක්ෂණ | 569 | 16,674 |
| | | 3. රාජකාරි සේවා ස්ථාන ආශ්‍රිත සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | 220 | 4,597 |
| | | 4. යෝග සහ සංයම අභ්‍යාස තුළින් මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය | 177 | 2,233 |
| | | 5. දැනුවත් කිරීමේ වැඩසටහන් | 3,975 | 74,796 |
| | | 6. ආවේක්ෂණය කළ රෝගීන් සංඛ්‍යාව | 2,768 | |
| 2. | බෝ වන රෝග පාලන වැඩසටහන | බෝ වන රෝග පාලන වැඩසටහන් | 2,803 | 44,713 |
| 3. | පෝෂණ වැඩසටහන | දේශීය ආහාර ප්‍රචලිත කිරීම/ශ්‍රී ලාංකිකයන් සඳහා සුදුසු පෝෂණ සංකල්ප ප්‍රවර්ධන වැඩසටහන | | |
| | | 1.ප්‍රායෝගික වැඩසටහන් | 2,058 | |
| | | 2.දැනුවත් කිරීමේ වැඩසටහන් | 2,641 | |
| 4. | ළමා සෞඛ්‍ය සංරක්ෂණය | ළමා සෞඛ්‍ය සංරක්ෂණ පෙර පාසල්/පාසල් ස්වස්ථවෘත වැඩසටහන | | |
| | | 1. ළමා ස්වස්ථතා ප්‍රවර්ධන වැඩසටහන් | 1,755 | |
| | | 4. ළමා සායන | 741 | |
| | | 5. දැනුවක් කිරීමේ වැඩසටහන් | 1,384 | |
| 5. | ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය සේවා වැඩසටහන | වැඩිහිටි සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන | | 14,947 |
| | | 1.සායන  සංඛ්‍යාව | 614 | |
| | | 2.අධීක්ෂණය කළ වැඩිහිටියන් සංඛ්‍යාව | 17,939 | |
| | | 3.වැඩිදුර ප්‍රතිකාර මධ්‍යස්ථාන කරා යොමු කිරීමේ සංඛ්‍යාව | 796 | |
| 6. | මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන | මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | 203 | 5,641 |
| 7. | මාතෘ සංරක්ෂණය | මාතෘ සායන | 206 | 2,258 |
| 8. | පාසල් වැඩසටහන් | 1. පාසල් සිසුන් සහ ආචාර්ය මණ්ඩලය දැනුවත් කිරීම | 151 | 9,190 |
| | | 2. 5 වසර ශිෂ්‍යත්ව උපකාරක වැඩසටහන් | 86 | 4,587 |
| | | 3. පාසල් ආශ්‍රිත සායනික සේවා වැඩසටහන | 36 | 1,515 |
| | | 4. යෝග හා සංයම අභ්‍යාස වැඩසටහන | 369 | 653 |
| 9. | ගෘහ ඒකක දැනුවත් කිරීම | ගෘහ ඒකක දැනුවත් කිරීම | 43,461 | 62,114 |
| 10. | ප්‍රජා සත්කාරක සේවා වැඩසටහන් හා වෙනත් විශේෂ වැඩසටහන් | 1.බෝ වන රෝග පාලනය/වෙනත් විශේෂ වැඩසටහන් | 755 | 10,556 |
| | | 2.විශේෂ වකුගඩු සායනය/බෝ නොවන රෝග පාලනය | 132 | 1,851 |
| | | 3.අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන | 19 | 251 |
| 11. | ඖෂධ පැලෑටි සංරක්ෂණය හා තිරසර භාවිතය | 1. ආදර්ශ පැල තවාන් | 53 | |
| | | 2.කාබනික ගෙවතු වගා වැඩසටහන් සංඛ්‍යාව | 558 | 5,168 |
| | | .ගෙවතු සංඛ්‍යාව | 2,471 | |
| | | 3.ඔසු උයන් (පාසල්/රාජ්‍ය ආයතන/වෙනත්) | | |
| | | ඔසු උයන් සංඛ්‍යාව | 207 | |

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

## 09. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

**දැක්ම**

සෞඛ්‍ය සම්පන්න සමාජයක් ගොඩනැගීමේදී ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් පවතින අවශ්‍යතා උසස් ප්‍රමිතියකින් යුක්තව සපුරාලන අතරතුර දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් සේවා සැපයුම මූලික කොටගත් ප්‍රමුඛයකු බවට පත්වීම.

**මෙහෙවර**

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරලමින් සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි මස 11 වන දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් ගරු කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍ය පිලිප් ගුණවර්ධන මැතිතුමා විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ස්ථාපනය කරන ලදී.

**සංස්ථාවේ ප්‍රධාන අරමුණු**

1. ආයුර්වේද ඖෂධ උසස් ප්‍රමිතියෙන් යුතුව නිෂ්පාදනය කිරීම.
2. රාජ්‍ය අංශයේ සියළුම ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා හා නිදහස් ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන වලට ඖෂධ සපයන ප්‍රධාන සැපයුම්කරු වීම.
3. ආයුර්වේද, සිද්ධ, යුනානි ඖෂධවලට අමුද්‍රව්‍ය ආනයනය හා දේශීය වෙළඳපොළ අවශ්‍යතාවයට අලෙවි කිරීම.
4. තරඟකාරී පෞද්ගලික වෙළඳපොල ඉලක්ක කොට, ගුණාත්මකභාවයෙන් සපිරි දේශීය ඖෂධ නිෂ්පාදනය කොට ප්‍රජාව වෙත ප්‍රචලිත කිරීම.
5. දේශීයව නිපදවන අමුද්‍රව්‍ය සහතික මිල ගණන්වලට මිලදී ගැනීම, ගබඩා කිරීම හා සාධාරණ මිලට අලෙවි කිරීම මගින් නිෂ්පාදක ගොවීන්ට උපරිම මිලක් ලබා ගැනීම.
6. ඖෂධ පැලෑටි සංරක්ෂණය කිරීම සහ වගාවන් ව්‍යාප්ත කිරීම.
7. ඖෂධ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය සඳහා පර්යේෂණය කිරීම හා එබඳු ඖෂධ වර්ග ප්‍රමිතිගත කිරීම.
8. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය එහෙත් නීතියෙන් තහනම් ඖෂධ නීත්‍යානුකූලව ලබාගෙන ඖෂධ නිෂ්පාදනය කරනු ලබන වෛද්‍යවරුන්ට නීත්‍යානුකූලවම ලබාදීම මගින් පාරම්පරික වෛද්‍ය ක්‍රමය රැකගැනීමට ක්‍රියාකිරීම.

සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | **සිව් මහල් ගබඩා සංකීර්ණය ඉදි කිරීම** - මෙය වර්ග අඩි 28,500 කින් යුක්තවන අතර භූගත මහලේ වියළි අමුද්‍රව්‍ය, හිස් බෝතල්, සීනි, ප්ලාස්ටික් ඇසුරුම් වැනි ද්‍රව්‍ය ගබඩා කර ඇත. බිම් මහලේ රාජ්‍ය අංශයට බෙදා හරින සියළුම නිමි ඖෂධත්, 1 වන මහල තුළ රසායනාගාරය, තොරතුරු තාක්ෂණ ඒකකය සහ ලේබල් ගබඩාව ස්ථාපනය කර ඇති අතර 2 වන මහල තුළ සේවක විවේකාගාර දෙකක් ස්ථාපිත කර ඇත. 3 වන මහල තුළ බහුකාර්ය දේශන ශාලාව සහ ගිණුම් අංශය ස්ථාපනය කර ඇත | 157.00 | 100% | 95% |
| 02 | **ප්‍රධාන නිෂ්පාදනාගාරයේ වහල නවීකරණය කිරීම** - රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ උපදෙස් අනුව වහළ ප්‍රතිසංස්කරණය කිරීම සිදු කෙරිණ. මෙම වහළ ප්‍රතිසංස්කරණය කිරීමෙන් වහලේ අලංකාරය පමණක් නොව දිගු කල් පැවැත්මට ද යහපත් නිෂ්පාදන පිළිවෙත් අනුව ඖෂධ නිෂ්පාදනයට ද ඉවහල් වේ | 34.78 | 100% | 95% |
| 03 | **ආයතන පරිශ්‍රයේ ඉන්ටර්ලොක් ගල් ඇතිරීම** - ප්‍රධාන නිෂ්පාදනාගාරය පිහිටි ආයතන පරිශ්‍රයේ පවිත්‍රතාවය පවත්වාගෙන යාම සඳහාත් අලංකරණය සඳහාත් ඉන්ටර්ලොක් ගල් ඇතිරීම. | 5.8 | 100% | 95% |
| 04 | **විදුලිය බෙදාහැරීමේ නව පද්ධතියක් නිර්මාණය කිරීම** ප්‍රධාන නිෂ්පාදනාගාරයට, සිව්මහල් ගබඩා සංකීර්ණයට හා කාර්යාල ගොඩනැගිලි සඳහා අවශ්‍ය බල ශක්තිය බාධාවකින් තොරව ලාබාදීම සඳහා මෙම පද්ධතිය නිර්මාණය කර ඇත. එහි දෙවන පියවර ලෙස පද්ධතිය ස්ථාපනය කිරීමට නියමිතව ඇත. | 0.96 | 100% | 20% |
| 5 | **රස බෙහෙත් නිෂ්පාදනය** - ආයුර්වේද ඖෂධ සංස්ථාව රස බෙහෙත් නිෂ්පාදනයේ ඉදිරියෙන් සිටිය ද තවමත් ඉල්ලුමට ගැලපෙන අයුරින් සැපයුමක් කිරීමට සමත් වී නොමැත. දැනට නිෂ්පාදනය කරනුයේ රුපියල් කෝටියක (රු.මි.10) නිෂ්පාදන පිරිවැය වටිනාකමකින් යුතු රස බෙහෙත් වර්ග පමණි. රස ඖෂධ සඳහා ලබා ගන්නා සියළු ඖෂධයන් පෘථිවි තලයෙන් (Elements of Earth) ලබා ගන්නා ද වෙති. ඒවා අතර රසදිය (Mercury), ගෙන්දගම් (Sulphur), මනෝසීල (Arsenic Bisulphite), සාදිලිංගම් (Vermilion), රන්හිරියල්(Arsenic trisulphide) සහ රත්‍රන් (Aurum/Gold) ප්‍රධාන මූල ද්‍රව්‍ය වේ. ඉහත කී සියළු ඖෂධ වර්ග විශේෂිත වූ ක්‍රමවේද භාවිතයට ගනිමින් විෂ රහිත ගුණ ඇති ඖෂධ බවට පත් කර රස බෙහෙත් නිෂ්පාදනය කිරීම. | 42.5 | 5% | - |

**2017 හා 2018 වර්ෂ වල ක්‍රියාත්මක ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතිය | ආයෝජනය (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | **බෙහෙත් වියළීමේ යන්ත්‍ර (Electric Tray Driers) 3ක් මිලදී ගැනීම -** රස වටිකා අංශයේ රස ඖෂධ වියළීමේ ධාරිතාවය වර්ධනය කිරීම සඳහාත් නව නිෂ්පාදනාගාරයේ ඖෂධ පෙති නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වියළා ගැනීම සඳහාත් විදුලියෙන් ක්‍රියා කරන මෙම වියළන යන්ත්‍ර 03 මිල දී ගන්නා ලදී. එම යන්ත්‍ර 03න් 02ක් ප්‍රධාන නිෂ්පාදනාගාරයේ රස වටිකා අංශය තුළත් අනෙක් යන්ත්‍රය නව නිෂ්පාදනාගාරය තුළත් ස්ථාපනය කර ඇත. | 4.14 | 100% | 100% |
| 02 | **රස බෙහෙත් ඇඹරුම් යන්ත්‍ර ( End Runner Mills) 4ක් මිල දී ගැනීම**<br>රස වටිකා අංශයේ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා මෙම ඇඹරුම් ගල් 04 මිල දී ගත් අතර රස බෙහෙත් ඇඹරීමේ ක්‍රියාවලිය සඳහා මේවා භාවිතයට එක් කර ඇත. | 8.835 | 100% | 95% |
| 03 | **අට්ටි ගැසීමේ යන්ත්‍ර (Electric Stackers) 2ක් මිල දී ගැනීම -** නිෂ්පාදනාගාරයේ සහ නව සිව් මහල් ගබඩා සංකීර්ණයේ ද්‍රව්‍ය/ භාණ්ඩ පහසුවෙන් හැසිරවීම (Material Handling) සඳහා මෙම යන්ත්‍ර 2018 වර්ෂයේ දී මිල දී ගත් අතර මෙහෙයුම් කටයුතු සඳහා සාර්ථකව යොදා ගැනේ. | 2.53 | 100% | 95% |
| 04 | **හයිඩ්‍රොලික් උත්තෝලකයක් ( Hydraulic Lift) මිලදී ගැනීම -** නිෂ්පාදනාගාරය තුළ නිෂ්පාදනය කරන නිමි ඖෂධ ට්‍රොලි වල බහා නව සිව් මහල් ගබඩාවේ බිම් මහලේ ගබඩා කිරීම සඳහා ගෙන යා යුතුය. එහි දී පොළොව මට්ටමේ සිට අඩි 06ක් පමණ උසට එකවර ට්‍රොලි 02ක් ඔසවා බිම්හලේ ස්ථානගත කිරීමට මෙම යන්ත්‍රය 2018 වර්ෂයේ දී මිල දී ගන්නා ලදී. එමඟින් නිමි ඖෂධ ගබඩා කිරීමේ කාර්යක්ෂමතාවය ඉහල ගොස් ඇත. | 4.134 | 100% | 95% |
| 05 | **උත්කර්ෂණ යන්ත්‍රයක්(Material Hoist)මිල දී ගැනීම -** සිව් මහල් ගබඩා සංකීර්ණයේ ඕනෑම මහලක් වෙත බඩු බාහිරාදිය ගෙන යාම සඳහා මෙම යන්ත්‍රය සිව්මහල් ගබඩා සංකීර්ණය තුළ ස්ථාපනය කර ඇත. | 3.223 | 100% | 20% |
| 06 | **විදුලියෙන් ක්‍රියාකරන Fork Lift යන්ත්‍රයක් මිලදී ගැනීම -** මෙය දූම විමෝචනය නොවන පරිසර හිතකාමී යන්ත්‍රයක් වේ. මෙමගින් සිව් මහල් ගබඩා සංකීර්ණයේ බිම් මහල තුළ අමුද්‍රව්‍ය ගබඩා කිරීම හැසිරවීමටත් කර්මාන්තශාලා පරිශ්‍රය තුළ අමුද්‍රව්‍ය සහ භාණ්ඩ හැසිර වීමටත් පහසුවෙන් යොදාගත හැක. | 4.134 | 100% | 95% |

### නිෂ්පාදන විවිධාංගීකරණය

පාරම්පරිකව පැවත එන ආයුර්වේද ඖෂධ වලට අමතරව සංස්ථා නිෂ්පාදන පෙළ දිගු කරමින් නව නිෂ්පාදන 6ක් 2018.08.06 දින වෙළඳපොලට හඳුන්වා දෙනු ලැබීය. වෙනස් වන පාරිභෝගික අවශ්‍යතා හා පරිභෝජන රටා හඳුනා ගනිමින් සිදු කළ අධ්‍යනයන් හි ප්‍රතිඵලයක් ලෙස මෙම නිෂ්පාදන හඳුන්වා දෙනු ලැබීය.



















### අලෙවි ශාඛා පිහිටුවීම

සංස්ථා නිෂ්පාදන අලෙවිය ඉහළ නැංවීමේ අරමුණින් ආයුර්වේද සංස්ථා අලෙවි ශාඛා ජාලය පුළුල් කිරීම සිදු කෙරේ.

### අලුත්ගම අලෙවි ශාඛාව

කොළඹ සහ ගාල්ල අතර වූ එකම අලෙවි ශාඛාව 2018.03.08 දින සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අලුත්ගම නගර මධ්‍යයේ පිහිටුවනු ලැබීය.

2018.12.31 දිනට ශුද්ධ අලෙවි ආදායම රු. 2,106,357.00 කි.

**ජා - ඇල අලෙවි ශාඛාව**

ගම්පහ දිස්ත්‍රික්කය තුළ සංස්ථා නිෂ්පාදන අලෙවිය වර්ධනය කිරීමේ අරමුණින් ජා-ඇල අලෙවි ශාඛාව පිහිටුවනු ලැබීය. 2018.09.25 දින සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම ශාඛාව විවෘත කෙරිණ.

2018.12.31 දිනට ශුද්ධ අලෙවි ආදායම රු. 801,620.00 කි.

**විශේෂ ව්‍යාපෘති**

**වියළි ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථානය - මොණරාගල**

ආයුර්වේද ඖෂධ සංස්ථාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග අතර වියළි ඖෂධ සපයා ගැනීම එක් අභියෝගයකි. ඒ අනුව මොණරාගල නගරයේ වියළි ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථානයක් 2018 වර්ෂයේ මැයි මස ආරම්භ කරන ලදී. අරළු, බුළු, නෙල්ලි, සැවැන්දරා, බිං කොහොඹ වැනි ඖෂධ ඌව පළාතේ බහුලව ඇත. ගොවීන්ගේ නිෂ්පාදන සහතික මිලකට ලබා ගැනීමෙන් ගොවීන්ට ආර්ථික වාසියක් අත් කෙරෙන අතරම සංස්ථාව අතරමැදියන් ගෙන් මිදීම ද මේ නිසා ඇති වන වාසියකි. මෙය තිරසාර සංවර්ධනයේ දිළිඳුකම පිටු දැකීම සඳහා වූ අපගේ සමාජ සත්කාර වැඩසටහනේ (CSR) තවත් එක් කොටසකි.

**පුනරුදය දින 60 මෙහෙයුම ආරම්භ කිරීම**

ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සංවර්ධන ක්‍රියදාමයේ තවත් වැදගත් පරිච්ඡේදයක් ආරම්භ කරමින් 'පුනරුදය දින 60 මෙහෙයුම' සමාරම්භය 2018.06.25 දින බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ දී පැවති මාධ්‍ය හමුවත් සමග සිදු කෙරිණ. ඉදිරි දින 60ක් ඇතුළත සිදු කිරීමට නියමිත වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව මෙහි දී මාධ්‍ය ආයතන දැනුවත් කළ අතර සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු දොස්තර රාජිත සේනාරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙම හමුව පැවැත්විණ.

**අලෙවි ප්‍රවර්ධන වැඩමුළු සංවිධානය**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ඖෂධ අලෙවිය වැඩිකර ගැනීමේ අරමුණින් අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන තුළ සිදුකරමින් ආයුර්වේද ඖෂධ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩමුළු දිවයින පුරා සිදුකෙරිණි. ඒවායින් සංශිප්තයක් පහත පරිදි පෙළගස්වා ඇත.

| වැඩසටහන් පැවැත්වූ මාසය | පැවැත්වූ ආයතනය | පැවැත්වූ දිනය | ශුද්ධ ආදායම |
|---|---|---|---|
| පෙබරවාරි | ඔරේන්ජ් ඉලෙක්ට්‍රිකල්ස් (පුද්) සමාගම, මීගොඩ | 22.02.2018 | 5,265.00 |
| පෙබරවාරි | ගුවන් විදුලි සංස්ථාව | 23.02.2018 | 5,015.00 |
| පෙබරවාරි | ඉසුරුපාය, බත්තරමුල්ල | 23.02.2018 | 10,348.75 |
| පෙබරවාරි | විදේශ සේවා නියුක්ති කාර්යාලය, බත්තරමුල්ල | 27.02.2018 | 31,101.25 |
| මාර්තු | ජාතික සුව සේවා ප්‍රදර්ශනය, BMICH | 02,03 & 04.02.2018 | 142,050.00 |
| මාර්තු | Brandex, වැලිසර | 08.03.2018 | 6,665.00 |
| අප්‍රේල් | ආගමන විගමන ආයතනය | 23.04.2018 | 22,472.50 |
| මැයි | මග නැගුම ආයතනය | 09.05.2018 | 22,046.25 |
| මැයි | රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | 17.05.2018 | 26,963.50 |
| මැයි | ඛණිජතෙල් නීතිගත සංස්ථාව | 18.05.2018 | 223,350.00 |
| ජූනි | Ayurveda Expo - 2018 | 13,14 & 15.07.2018 | 116,883.75 |
| ජූලි | ගම්පහ දුම්රිය ස්ථානය | 26.07.2018 | 234,596.55 |
| සැප්තැම්බර් | කටුනායක ආයෝජන මණ්ඩලය | 04.09.2018 | 12,376.50 |
| සැප්තැම්බර් | බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 24.08.2018 | 21,663.00 |
| සැප්තැම්බර් | AYUREX – 2018 Kandy City Center | 04.10.2018 | 61,852.50 |
| ඔක්තොම්බර් | ත්‍රිකුණාමලය ආයුර්වේද දෙපාර්තමේන්තුව | 05.06 & 07.10.2018 | 8,931.25 |
| ඔක්තොම්බර් | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 25.10.2018 | 8,986.50 |
| ඔක්තොම්බර් | අම්පාර | | |
| | එකතුව | | **960,567.30** |

**2018 සංස්ථාවේ වාර්ෂික නිෂ්පාදනය හා අලෙවි ප්‍රගතිය**

| විස්තරය | රු.මි. |
|---|---|
| වාර්ෂික නිෂ්පාදනය | 394.081 |
| මුළු ශුද්ධ විකුණුම් | 688.355 |



හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේ නිර්මාතෘ

# හෝමියෝපති වෛද්‍ය ක්‍රමය

## 10. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය රෝගයට පමණක් නොව රෝග මූලයටද ප්‍රතිකාර කරනු ලබන සුවිශේෂී වෛද්‍ය ක්‍රමයකි. මෙය අතුරු ආබාධ රහිත ඖෂධ පාවිච්චියට ඉතා පහසු, ලාභදායී වෛද්‍ය ක්‍රමයකි. ශාක සත්ත්ව හා ලෝහ වැනි ස්වභාවික ද්‍රව්‍යවලින් නිෂ්පාදිත මෙම ඖෂධ භාවිතයෙන් ස්වභාවික ප්‍රතිශක්තිය ඉහළ යයි. ස්වභාවික ප්‍රතිශක්තිය ඉහළ දැමීම මඟින් රෝග සුව කරන මෙම ඖෂධ භාවිතයෙන් පුද්ගයාගේ රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ යයි. ජර්මන් ජාතික සැමුවෙල් හානිමාන් නැමති වෛද්‍යවරයා විසින් අරඹන ලද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පවත්වාගෙන යාම හා ප්‍රචලිත කිරීමේ ප්‍රධාන ආයතනය වන්නේ 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ ස්ථාපිත කරන ලද වැලිසර අංක 94 දරණ ස්ථානයේ පිහිටි හෝමියෝපති වෛද්‍ය සභාව වන අතර ඒ සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රථම හා එකම හෝමියෝපති රෝහල වැලිසර පිහිටි රජයේ හෝමියෝපති රෝහලයි. දේශීය වෛද්‍ය අංශය මඟින් වැලිසර රජයේ හෝමියෝපති රෝහල හා හෝමියෝපති වෛද්‍ය සභාව පාලනය වේ.

### 10.1 හෝමියෝපති රෝහල

**දැක්ම**

ශ්‍රී ලාංකිය සමස්ත ජනතාවගේ සංවර්ධනයට දායක විය හැකි සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම.

**මෙහෙවර**

ශ්‍රී ලාංකාවේ සියළුම ජනතාවට අඩුම වියදමකින් යුතුව, රෝග සමනය හා රෝග වලක්වා ගැනීමට පහසු හා ලාභදායික වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා වැලිසර හෝමියෝපති රෝහල මගින් ක්‍රියාකාරී වැඩසටහනක් ජනතාව අතරට ගෙනයාම .

වැලිසර රජයේ හෝමියෝපති රෝහල පිහිටුවා වසර 15 ක් මේ වන විට සපුරා ඇති අතර, මෙම රෝහල සෞඛ්‍ය,පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වේ. ලංකාවේ පිහිටි එකම හෝමියෝපති රෝහල වන, වැලිසර රජයේ හෝමියෝපති රෝහලෙහි සේවය ලබාගැනීමට දිවයිනේ නන් දෙසින් රෝගීන් පැමිණෙන අතර, හෝමියෝපති වෛද්‍ය ක්‍රමයෙන් විශ්වාසනීය ප්‍රතිකාර සේවයක්, මෙම රෝහලෙන් ලබාගත හැක. 2018 වසර සඳහා මිලියන 30 ක ප්‍රාග්ධන ප්‍රතිපාදනද, මිලියන 18 ක පුනරාවර්තන ප්‍රතිපාදනද, හෝමියෝපති රෝහලට ලැබී ඇත.

දෛනිකව රෝගීන් 150-200 ක් පමණ හෝමියෝපති රෝහලේ බාහිර රෝගී අංශයට ප්‍රතිකාර සඳහා පැමිණෙන අතර අභ්‍යන්තර රෝගී අංශයේ රෝගීන් 20 ක් සඳහා නේවාසික පහසුකම් පවතී. රෝගී ප්‍රතිකාර සේවාවන්ට අමතරව, ජංගම සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, වෛද්‍ය සභාව යටතේ පාලනය වන නිදහස් හෝමියෝපති සායන සඳහා ඖෂධ සැපයීම, විදේශීය සුදුසුකම් ලත් වෛද්‍යවරුන්ට සායනික පහසුකම් සැපයීම, ආදී සේවා පහසුකම් මෙම රෝහලෙන් සැපයේ.

බෝ නොවන රෝග වැළඳීමේ ප්‍රවණතාවය ඉහල යමින් පවතින අවධියක, ශරීරයේ ස්වභාවික ප්‍රතිශක්තිය ඉහල දැමීම මඟින් රෝග සුවකරන හෝමියෝපති ඖෂධීය ප්‍රතිකාරක ක්‍රමය අතුරු ආබාධවලින් තොර විකල්ප වෛද්‍ය ක්‍රමයකි. තවද ප්‍රතිජීවක මඟින් මර්ධනය කල නොහැකි වෛරස් රෝග සඳහාද

හෝමියෝපති ඖෂධ වඩාත් සුදුසුය. ශාක, සත්ත්ව, ලෝහ වැනි ස්වභාවික ද්‍රව්‍යවලින් නිෂ්පාදිත මෙම ඖෂධ, ලාභදායි අතර භාවිතයටද පහසුය.

**රෝහල් කාර්ය මණ්ඩලය**

වෛද්‍ය නිලධාරීන් 02 ක් ඇතුළුව කළමනාකරණ සහකාර, ඖෂධ සංයෝජක, උපස්ථායක, රියදුරු හා හෝමියෝපති සේවා සහායක යන නිලධාරීන් 12 කුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් මෙහි සේවයේ යෙදී සිටී. නේවාසික හා බාහිර රෝගී අංශ මනාසේ ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොසිටින බැවින් 2018 වසරේ අගභාගයේදී තාවකාලික පදනම යටතේ එක් වෛද්‍යවරියක් සේවයට බඳවාගෙන ඇත.

**2018 වසරේ ප්‍රතිකාරක සේවා ලබාදුන් රෝගීන් සංඛ්‍යාව**

| මාසය | 2018 | |
|---|---|---|
| | බාහිර | අභ්‍යන්තර |
| ජනවාරි | 2,368 | 4 |
| පෙබරවාරි | 2,658 | 7 |
| මාර්තු | 2,502 | 13 |
| අප්‍රේල් | 2,377 | 4 |
| මැයි | 2,363 | 8 |
| ජූනි | 2,348 | 10 |
| ජූලි | 2,803 | 14 |
| අගෝස්තු | 2,692 | 6 |
| සැප්තැම්බර් | 2,883 | 13 |
| ඔක්තෝම්බර් | 3,417 | 10 |
| නොවැම්බර් | 2,864 | 13 |
| දෙසැම්බර් | 2,671 | 4 |
| එකතුව | **34,314** | **106** |

**ජංගම සායන සහ දැනුවත් කිරීමේ වැඩසටහන්**

| දිනය | සායන පැවැත්වූ ස්ථානය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 2018.01.21 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල ,හලාවත | 98 |
| 2018.02.18 | රදගුරු එඩ්මන්ඩ්පීරිස් විදුහල ,හලාවත | 136 |
| 2018.03.11 | රදගුරු එඩ්මන්ඩ්පීරිස් විදුහල ,හලාවත | 140 |
| 2018.03.24 | සිරි සිද්ධාර්ත්ථාරාම විහාරස්ථානය, පානදුර | 58 |
| 2018.05.12 | මජිඩ් ෆසල් පල්ලිය ,පෙරියමුල්ල, මීගමුව | 54 |
| 2018.06.12 | ජංගම පොලිස් මුරපල , කුරවලාන | 46 |
| 2018.08.29 | මොණරාගල Vision 2020 | 372 |

### රසායනාගාර සේවය

එක් එක් රෝගියාට විශේෂිත වු රෝග ලක්ෂණ පදනම් කර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයේදී ඖෂධ නියම කරන නමුත්, රසායනාගාර පරීක්ෂණ මඟින් රෝගී තත්ත්වයන් විද්‍යාත්මකව තහවුරු කර ගනී. තවද බෝ නොවන රෝග පහසුවෙන් හඳුනාගැනීමට, රසායනාගාර පරීක්ෂණ පිටුවහලක් වේ. 2018 වසරේ රෝගීන් 1,118 රසායනාගාර සේවා පහසුකම් සපයා ඇත.

### හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපන කටයුතු

ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය මඟින් ලබාදී ඇති හෝමියෝපති වෛද්‍ය ශිෂ්‍යත්ව යටතේ ශ්‍රී ලාංකික සිසුන් 06 දෙනෙකු 2018 වසරේ හෝමියෝපති උපාධි හැදෑරීමට කල්කටා ජාතික හෝමියෝපති ආයතනයට යොමු කර ඇත. තවද හෝමියෝපති උපාධිය හදාරා මෙරටට පැමිණි වෛද්‍යවරුන් 04 දෙනෙකු සඳහා සායනික පහසුකම් මෙම රෝහල යටතේ ලබා දී ඇත.

### ඖෂධ ආනයනය

හෝමියෝපති රෝහලට හා නිදහස් හෝමියෝපති සායන සඳහා රු.මිලියන 1.528 ක හෝමියෝපති ඖෂධ , රාජ්‍ය ඖෂධ සංස්ථාව මඟින් ආනයනය කර ඇත.

### ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය

ඉදිවෙමින් පවතින නිල නිවාස සංකිර්ණයේ ඉදිකිරිම් සඳහා රු.මිලියන 2.2 ක ප්‍රතිපාදන වැය කර ඇත. තවද යටිතල පහසුකම් සංවර්ධනය යටතේ රෝහල් පරිශ්‍රය වටා තාප්ප කොටස් ඉදිකිරීමට රු.මිලියන 3.6 හා ජල අවශ්‍යතා සපුරාගැනිමට රු.මිලියන 0.5 වැයකර ජල ටැංකි රඳවනයක් ඉදිකර ඇත.

### මොණරාගල Vision 2020

ප්‍රථම Vision 2020 සංවර්ධන වැඩසටහන මොණරාගල පැවැත්වු අතර,හෝමියෝපති රෝහල මඟින් එහි ප්‍රදර්ශන කුටියක් සංවිධානය කළ අතර රෝගීන් 372 සඳහා ප්‍රතිකාරක සේවා සපයා ඇත.



මොණරාගල Vision 2020



හෝමියෝපති වෛද්‍ය උපාධිය හැදෑරීමට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම

## 10.2 හෝමියෝපති වෛද්‍ය සභාව

### දැක්ම

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම.

### මෙහෙවර

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම.

### රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය

2018 රජයේ හෝමියෝපති සායන - රෝගී සංඛ්‍යාල්බන

| සායනය | පැමිණි රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| දෙහිවල | 16,447 |
| පරකඩුව | 13,732 |
| මාතලේ | 10,533 |
| පාලමුනෙ | 8,182 |
| කුරුණෑගල | 11,349 |
| මොණරාගල | 4,768 |
| තෝලංගමුව | 16,078 |
| **එකතුව** | **81,089** |

### රජයේ හෝමියෝපති සායන කළමනාකරණය

2018 වසරේදී සායන කළමනාකරණයට අවශ්‍ය පහසුකම් ලෙස කාර්ය මණ්ඩල නඩත්තුව, බෙහෙත් සැපයීම, වෛද්‍ය උපකරණ ඇතුළු සායන උපකරණ ලබාදීම, සායනවල ජල, විදුලි හා සනීපාරක්ෂක සේවා පවත්වාගෙන යාමට අදාළ කටයුතු සිදු කරන ලදී.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් හෝමියෝපති වෛද්‍ය සභාව විසින් ජංගම සායන පවත්වනු ලබනු අතර වැලිසර හෝමියෝපති රෝහල මේවා සංවිධානය කිරීම කරනු ලබයි.

**හෝමියෝපති රෝහල සමඟ සංවිධානය කෙරෙන ජංගම සායන**

| දිනය | සායනය පැවැත්වූ ස්ථානය | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---|---|---|---|
| 2018.01.21 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල, හලාවත | 79 | 19 | 98 |
| 2018.02.18 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල, හලාවත | 103 | 33 | 136 |
| 2018.03.11 | රදගුරු එඩ්මන්ඩ් පීරිස් විදුහල, හලාවත | 112 | 28 | 140 |
| 2018.03.24 | සිරි සිද්ධාර්ථාරාම විහාරස්ථානය, පානදුර | 39 | 19 | 58 |
| 2018.05.12 | මජීඩ් ෆසල් පල්ලිය, පෙරියමුල්ල, මීගමුව | 33 | 21 | 54 |
| 2018.06.12 | ජංගම පොලිස් මුරපල, කුරවලාන | 30 | 16 | 46 |

- හෝමියෝපති වෛද්‍ය සභාව විසින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන මඟින් ද හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් වැඩ සටහන් සංවිධානය කෙරේ. දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩමුළු ,සම්මන්ත්‍රණ හා ජංගම සායන මෙයට අයත් වේ.

**දෙහිවල රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර ජංගම සායන සහ බාහිර වැඩ සටහන්**

1. දෙහිවල ගල්කිස්ස නගර සභාව සමග "පුරපති සැරිසර" සමාජ මෙහෙවර වැඩ සටහන යටතේ සම්මන්ත්‍රණ 5ක් සහ ජංගම සායන 5ක්, කොතලාවල පුර පාසල, නැදිමාල කැලේ පාසල, නැදිමාල ධර්මරාජ විහාරය, රත්මලාන ධර්මාරාම විදුහල, සදහම් විහාරය යන ස්ථාන වල පවත්වනු ලැබීය. මේවායින් රෝගීන් 490 දෙනෙකු ප්‍රතිකාර ගෙන ඇත.

2. **"සුව යාත්‍රා "සමාජ සත්කාර වැඩ සටහන.**

මෙම වැඩසටහන යටතේ දෙහිවල සායනය විසින් සම්මන්ත්‍රණ 5ක් සහ ජංගම සායන 5 ක් හසලක සුගතාරාමය, අඹන්ගොල්ල ශ්‍රී සුදර්ශනාරාම විහාරය, ඇල්පිටිය ජයබිම සේනාසන විහාරය, ඇල්පිටිය ශ්‍රී විජයාරාම විහාරය යන ස්ථාන වල දී පවත්වා ඇත. රෝගීන් 659 දෙනෙකු මෙම සායන 5න් ප්‍රතිකාර ලබා ගන්නා ලදී.

**තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්**

තෝලංගමුව රජයේ හෝමියෝපති සායනය මගින් ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන්ව දැනුවත් කිරීමේ වැඩමුළු දෙකක් තෝලංගමුව විහාරස්ථානයේ දී සායනයේ කාර්යභාර වෛද්‍යවරිය පැවැත්වීය. ව්‍යායාම් ද සහිතව පවත්වනු ලැබූ මෙම වැඩමුළු දෙක සඳහා 178 දෙනෙකු සහභාගී විය.

**පරකඩුව රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩ සටහන්**

පරකඩුව රජයේ හෝමියෝපති සායනය මගින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ 3ක් සහ සායන 3ක් පවත්වනු ලැබීය. කිරිඇල්ල ශ්‍රී සරණාරාම විහාරය, දෙහෙරගොඩ එල්ලාවල පුරාණ විහාරස්ථානය හා මාතුගල ශ්‍රී රත්නාරාම විහාරස්ථානය යන ස්ථාන වල දී මෙම වැඩසටහන් පැවැත් වූ අතර රෝගීන් 126 දෙනෙකු මේවායින් ප්‍රතිකාර ගෙන ඇත.

**මොණරාගල රජයේ හෝමියෝපති සායනය මගින් පැවැත්වූ බාහිර වැඩසටහන්**

2018 අගෝස්තු 29, 30, 31 යන දිනයන්හි මොණරාගල නගරයේ පැවැත් වූ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ප්‍රදර්ශන භූමියේ මොණරාගල රජයේ හෝමියෝපති සායනය විසින් හෝමියෝපති ප්‍රදර්ශන කුටියක් පවත්වා ගෙන යන ලදී. එම දින තුන තුළදී 3000ක පමණ පිරිසකට හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව අවබෝධයක් ලබා දුන් අතර, එම ප්‍රදර්ශන කුටිය තුළම පවත්වා ගෙන ගිය ප්‍රතිකාර සේවය තුළින් අළුත් රෝගීන් 372ක් ප්‍රතිකාර ලබා ගෙන තිබුණි .

**හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මාධ්‍ය වැඩසටහන්**

දෙහිවල සායනයේ කාර්යභාර වෛද්‍ය නිලධාරිනිය විසින් මෙම වසර තුළ රූපවාහිනී වැඩසටහන් 17ක් සහ ගුවන්විදුලි වැඩසටහන් 17ක් මඟින් හෝමියෝපති සම්බන්ධ ජනතාව දැනුවත් කිරීමට ක්‍රියා කරන ලදී. පුවත්පත්වලට මෙම වෛද්‍යවරිය 2018 වසරේ දී පමණක් ලිපි 44ක් සපයා ඇත .

**හෝමියෝපති නව සායන සඳහා ස්ථාන ලබා ගැනීම සහ ගොඩනැගිලි අභිවර්ධනය කිරීම.**

| දිස්ත්‍රික්කය | ස්ථානය | ආයතනය |
|---|---|---|
| පුත්තලම | පුත්තලම M.O.H ගොඩනැගිල්ල | මහ නගර සභාව - පුත්තලම |
| හම්බන්තොට | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. |
| මඩකලපුව | මුනායි වීදිය, පුලියන්තිව්, මඩකලපුව | මඩකලපුව මහ නගර සභාව. |
| කළුතර | විදෙස් මිතුදම, මහ ඉංගිරිය | කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| නුවරඑළිය | ආනන්ද දසනායක මාවත, නව නගරය, කොත්මලේ | කොත්මලේ ප්‍රා.ලේ .කාර්යාල |
| පොළොන්නරුව | මහජන පුස්තකාල ශ්‍රවනාගාරය තමන්කඩුව, පොළොන්නරුව | තමන්කඩුව ප්‍රාදේශීය සභාව |
| ගාල්ල | මහ මෝදර රෝහලෙන් ගොඩනැගිල්ලක් ඉල්ලා ඇත. | |

අමාත්‍යාංශ ලේකම්, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ සභාපති හා වෛද්‍ය සභා කාර්යාලය මඟින් රාජ්‍ය නිලධාරීන්ට සහ දේශපාලන අධිකාරීන්ට කරනු ලැබූ විවිධ ඉල්ලීම් වලට අනුව සායන 7 ක් ආරම්භ කිරීම සඳහා දිස්ත්‍රික් 7 ක ස්ථාන ලබා ගැනීමට හැකියාව ලැබුණි. ඒවා පහත පරිදි වේ.

- පුත්තලම සායනය සඳහා මහ නගර සභාව විසින් ගොඩනැගිල්ල ලබා දී ඒ සඳහා අවශ්‍ය ගෘහ උපකරණද ලබා දෙන ලදී .හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල පසුගිය වසරේ අළුත්වැඩියා කළ අතර මෙම වසරේ දී රු. 411,199.00ක් වටිනා ගෘහ භාණ්ඩ සායනයට මිල දී ගැණුනි .

- ඉංගිරිය සායන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම සඳහා රු 615,375.00 .ක් වැය කළ අතර ගෘහ උපකරණ මිලදී ගැනීම සහ නාම පුවරුව ඉදිකිරීම වෙනුවෙන් රු300,974.00 .ක් වැය කෙරුණි . කොත්මලේ සායන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීම ඉදිරියට තිබියදීම සායනය විවෘත කිරීමට ක්‍රියා කරමින් රු 90,239.00 ක් වටිනා ගෘහ භාණ්ඩ සායනය වෙත ලබා දුනි .

**නව සායන සඳහා හෝමියෝපති වෛද්‍යවරුන් බඳවා ගැනීම.**

නව සායන 07 ක් සහ හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලය සඳහා එක් අයෙක් වශයෙන් වෛද්‍යවරුන් 08 දෙනෙකු බඳවා ගැනීමට ලබා ගෙන තිබූ තනතුරු අනුමැතියට අනුව, හෝමියෝපති වෛද්‍ය සභාවේ හෝමියෝපති වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීමට අයදුම් පත් කැඳවන ලදී. භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළකිරීම මගින් කරනු ලැබූ කැඳවීමට අනුව අයදුම්පත් 29 ක් ලැබුණි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැණුනු වෛද්‍යවරුන් 07 දෙනෙකු සඳහා පත්වීම් ප්‍රදානය කෙරුණි. පත්වීම් ලාභී හෝමියෝපති වෛද්‍ය නිලධාරීන් ගෙන් 07 දෙනෙකු හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරුන් විය. එයින් එක් අයෙකු හෝමියෝපති ඩිප්ලෝමාධාරී වෛද්‍යවරයෙකි.

**නව සායන සඳහා කාර්යාල සහායකයින් (කම්කරුවන්) බඳවා ගැනීම.**

ආරම්භ කිරීමට නියමිත හෝමියෝපති නව සායන 07 සඳහා සායන අයත් වන ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල දැන්වීම් පළ කිරීම මගින් අයදුම් පත් කැඳවන ලදී. අයදුම්කරුවන් 26 දෙනෙකු අයදුම් පත් ඉදිරිපත් කර තිබුණි. තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයෙන් 07 දෙනෙකු තෝරා ගන්නා ලදී.

**හෝමියෝපති නව පනත බලාත්මක කිරීම.**

1970 අංක 07 දරණ පැරණි හෝමියෝපති පනත ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දුන් ප්‍රධානතම ගැටළු බවට පත්ව තිබුණේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස රෙගුලාසි සම්පාදනය වී නොතිබීමය. මෙම කරුණ ගැඹුරින් අවබෝධ කර ගැනීම මත 2016 අංක 10 දරණ හෝමියෝපති පනත යටතේ පත් වූ පළමු සභාව වූ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව වසර දෙකක නිල කාලය තුළ වැඩිපුරම අවධානය යොමු කලේ නව පනත බලාත්මක කිරීම සඳහා වන රෙගුලාසි සම්පාදනය කිරීම වෙනුවෙනි. 2017 වසරේ දී අවශ්‍ය රෙගුලාසි කෙටුම්පත් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබීය. මෙම වසරේ දී අමාත්‍යාංශය හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තු එක්ව අවශ්‍ය සංශෝධනයන් සිදුකර ඒවා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට හැකි විය.

**හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.**

එවකට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මෙහෙය වීම මත ශිෂ්‍යත්ව දිනා ඉන්දියාවේ දී හෝමියෝපති වෛද්‍ය උපාධිය ලබා ගත් හෝමියෝපති උපාධිධාරී වෛද්‍යවරු 08 දෙනෙකු වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අයදුම් කර තිබුණි. එයින් 07 දෙනෙකු සඳහා ලියාපදිංචිය ලබා දීමට අතුරු වෛද්‍ය සභාව ක්‍රියා කළේය.

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ (1)30 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම.

නව පනතේ මෙම වගන්තිය අනුව වසර 5 කට වඩා හෝමියෝපති වෛද්‍ය කර්මයෙහි නියුක්තව සිටි අයව වෛද්‍ය සභාව මඟින් පවත්වනු ලබන විභාගයකින් සමත්ව, වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි වීමට අවස්ථාව සලසා තිබීම අනුව අදාළ විභාගය පැවැත්වීම සඳහා සුදුසු කම් සම්පූර්ණ කරන ලද අයගෙන් අයදුම්පත් කැඳවා තිබුණි . 189 දෙනෙකු ගෙන් යුතු මෙම අයදුම්කරුවන් වෙත විෂය නිර්දේශ හා අදාළ දැනුම් දීම් සිදු කිරීම විභාග නීති සකස් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යැවීම, විභාග මණ්ඩලයක් පත්කර එය අමාත්‍යාංශයේ විභාග අංශය සමඟ සම්බන්ධ කර විභාගය පැවැත්වීමට අවශ්‍ය කටයුතු සැළසීම යනා දී වශයෙන් වන මෙයට අදාළ කටයුතු මෙම වසර තුළ දී සම්පූර්ණ කිරීමට හැකි විය.

**හෝමියෝපති ඖෂධ ආනයනය 2018.**

මෙම වසර තුළදී හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව විසින් වෛද්‍යවරුන් 4 දෙනෙකු සඳහා අවස්ථා 10 කදී ඩොලර් 34,966.41 වටිනා සහ එක් වෛද්‍යවරයෙක් සඳහා යුරෝ 932 ක් වටිනා ඖෂධ ආනයනය සඳහා අනුමැතිය ලබා දුනි.

**හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ පහසුකම් අභිවර්ධනය කිරීම.**

හෝමියෝපති වෛද්‍ය සභා කාර්යාලයේ පහසුකම් අභිවර්ධනය කිරීම සඳහා මෙම වසරේදී ද ක්‍රියා කරන ලදී. එහි දී රු. 528,859.72 ක් වැය කර හෝමියෝපති වෛද්‍ය සභා ගොඩනැගිල්ල ඇළුමිනියම් සහ වීදුරු ජනෙල් දමා වායුසමනය කර නවීන පහසුකම් සහිත තත්ත්වයට වර්ධනය කරන ලදී. වෛද්‍ය සභා කාර්යාලයට ජලය ලබා ගැනීම සඳහා නව ජල ටැංකියක් සහ ජල ටැංකි ආධාරකයක් රු. 500,000.00 ක් වැය කර ඉදි කිරීමට ක්‍රියා කරනු ලැබීය.

**හෝමියෝපති නීති හා ආයතන පද්ධතිය පුළුල් කිරීම.**

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින නීති රාමුව ප්‍රසාරණය කිරීමෙන්, ආයතන පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීමේත් අවශ්‍යතාව හඳුනා ගත් හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව ඒ සඳහා අවශ්‍ය කෙටුම් පත් සකස් කර හෝමියෝපති වෛද්‍යවරුන්ට ඉදිරිපත් කර අවශ්‍ය යෝජනා සංශෝධන සහිතව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. හෝමියෝපති වෛද්‍යවරුන් ඇතුළු 52 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මේ වෙනුවෙන් එක් දින වැඩමුළුවක් පවත් වන ලදී. එහිදී,

1. හෝමියෝපති ඖෂධ ආනයනය පිළිබඳ ප්‍රතිපත්ති යළි සැකසීම.
2. හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය පිළිබඳ යෝජනාව
3. හෝමියෝපති දෙපාර්තමේන්තු පනත

යන පුළුල් යෝජනා 03 පිළිබඳව වෛද්‍යවරු වෙන වෙනම කණ්ඩායම් ලෙස සාකච්ඡා කර අවසන් කෙටුම්පත් සකස් කරන ලදී .